මහරගම

නගර සභා ප්‍රදේශය
සංවර්ධන සැලැස්ම
2022-2031

"කොළඹ සුහුරු සේද නගරය"

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

මහරගම

නගර සභා ප්‍රදේශය
සංවර්ධන සැලැස්ම
2022-2031

''කොළඹ සුහුරු සේද නගරය''

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022-2031

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2022

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම හෝ බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකල යුතුය.

ප්‍රකාශනය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව-2022
6, 7 හා 9 වන මහල් "සෙත්සිරිපාය" බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
2022

වෙබ් අඩවිය - www.uda.gov.lk
ඊමේල් - info@uda.gov.lk
දුරකථනය - + 94112873637

මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022 – 2031

මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම I ,II සහ III ලෙස ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. මෙහි පළමු කොටස මගින් සංවර්ධන සැලසුම හැඳින්වීම, පසුබිම් අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශ දු අ ත විශ්ලේෂණය සහ සැලස්ම අන්තර්ගත කර ඇත.දෙවන කොටස මගින් 2022 - 2031 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ නියමතා සහ කලාපීකරණ නියමතා අන්තර්ගත කර ඇත. තුන්වන කොටස මගින් කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලු ඇමිණුම් වලින් සමන්විත වේ.

මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022 - 2031 නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්හි හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මග පෙන්වීම පෙරදැරි කරගෙන සිදුකර ඇත.

අධීක්ෂණ කටයුතු
විශ්‍රාමික මේජර් ජනරාල් උදය නානායක්කාර,*සභාපති-නා.සං.අධි.*, වරලත් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර, *අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අධි.*, වරලත් නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න *වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප II* , වරලත් නගර නිර්මාණ ශිල්පී එම්. පී.රණතුංග,*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප (I) - නා.සං.අධි.*, වරලත් නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න, *අධ්‍යක්ෂ - උපායමාර්ගික සැලසුම් නා.සං.අධි.*.

සැලසුම් කණ්ඩායම

I. වරලත් නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න, වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප II, අධ්‍යක්ෂ (හිටපු) කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (විද්‍යාවේදී දේපල කළමනාකරණ සහ තක්සේරු විද්‍යා (විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නාගරික සැලසුම්කරණය -එක්සත් රාජධානිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව නාගරික සැලසුම්කරණය හා කළමනාකරණය - නෙදර්ලන්තය, ආයතනික සාමාජික -ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය, ආශ්‍රිත සාමාජික - ශ්‍රී ලංකා තක්සේරු විද්‍යා ආයතනය.

II. වරලත් නගර නිර්මාණ ශිල්පී තුෂානි ද අල්විස්, අධ්‍යක්ෂ කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (විද්‍යාවේදී දේපල කළමනාකරණ සහ තක්සේරු විද්‍යා (විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නාගරික සැලසුම්කරණය -මොරටුව විශ්වවිද්‍යාලය.

III. වරලත් නගර නිර්මාණ ශිල්පී එම්. ඒ. ජී. මුණසිංහ, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (විද්‍යාවේදී දේපල කළමනාකරණ සහ තක්සේරු විද්‍යා (විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නගර හා ග්‍රාම නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, ආයතනික සාමාජික -ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය.

IV. වරලත් නගර නිර්මාණ ශිල්පී ඩබ්.එම්.ටී.යූ.වීරකෝන්, නගර නිර්මාණ ශිල්පී කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (විද්‍යාවේදී (ගෞරව) නගර හා ග්‍රාම නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති පරිසර කළමනාකරණය කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, භූ ගෝලීය තොරතුරු තාක්ෂණය හා දුරස්ථ සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව (අධ්‍යයන), ආයතනික සාමාජික -ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය.

V. එම්. කේ. ටී. එස්. මල්දෙනිය නගර නිර්මාණ ශිල්පී කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (විද්‍යාවේදී (ගෞරව) නගර හා ග්‍රාම නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව) , විද්‍යාපති භූ ගෝලීය තොරතුරු තාක්ෂණය හා දුරස්ථ සන්නිවේදනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, (අධ්‍යයන)

VI. වරලත් නගර නිර්මාණ ශිල්පී ජී. එච්. මධුකා තාමරසී නගර නිර්මාණ ශිල්පී කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (විද්‍යාවේදී (ගෞරව) නගර හා ග්‍රාම නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව), විද්‍යාපති දේපල කළමනාකරණ සහ තක්සේරු විද්‍යා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, (අධ්‍යයන), ආයතනික සාමාජික -ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය.

VII. රසෝජා ද සිල්වා අවකාශීය දත්ත කළමනාකරු කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, ශාස්ත්‍රවේදී භූ ගෝල විද්‍යා (විශේෂ), විද්‍යාපති භූ තොරතුරු විද්‍යාව,පශ්චාත් උපාධි ඩිප්ලෝමාව භූ තොරතුරු විද්‍යාව, නාගරික සැලසුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය (අධ්‍යයන)

සහය කණ්ඩායම්

i. උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ. (අධීක්ෂණය ,නියාමනය සහ ගැසට් කිරීම)
ii. පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ. (සංරක්ෂණය,සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම)
iii. භූ ගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ (භූ ගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහය සැපයීම)
iv. පර්යේෂණ හා සංවර්ධන අංශය -නා.සං.අ (නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්ම)

භාෂා පරිවර්තනය

I. ඉංග්‍රීසි භාෂා පරිවර්තනය ; වරලත් නගර නිර්මාණ ශිල්පී නිලන්ති රත්නායක විද්‍යාවේදී නිර්මිත පරිසරය මොරටුව විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නගර හා ග්‍රාම නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව නාගරික සැලසුම්කරණය හා කළමනාකරණය - නෙදර්ලන්තය, ආයතනික සාමාජික -ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය, පරිගණක පද්ධති නිර්මාණය පිළිබඳ ඩිප්ලෝමාව - ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකාව.

II. දෙමළ භාෂා පරිවර්තනය ; වරලත් නගර නිර්මාණ ශිල්පී වයි.ආරතී, නගර නිර්මාණ ශිල්පී , නාගරික සංවර්ධන අධිකාරිය, (විද්‍යාවේදී (ගෞරව)) නගර හා ග්‍රාම නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, විද්‍යාපති නගර නිර්මාණකරණය මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, ආයතනික සාමාජික - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය)

ප්‍රණාමය

මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022 -2031 සැකසීම නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ මහා නාගරික අංශයේ මූලික අධීක්ෂණය යටතේ සිදුවිය.මහරගම නගරය එහි අනාගත දැක්ම වන "කොළඹ සුහුරු සේද නගරය" යන දස අවුරුදු දැක්ම කරා යොමු කිරීමට අවශ්‍ය කරන අපේක්ෂිත නගර පරිවර්තනය පුබුදුවාලීමට අවශ්‍ය නිවැරදි ප්‍රවේශයට අවතීර්ණ වීම මෙම සැලැස්මේ අරමුණයි. මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022 - 2031 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධි විධාන යටතේ මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022 -2031 සඳහා අනුමැතිය ලබා දීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමන්ට අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමු.

මහරගම නගර සභාවෙහි සභාපති ,ලේකම් , මන්ත්‍රීවරුන් හා නිලධාරීන් , ප්‍රාදේශීය ලේකම් හා එම කාර්යාලයේ සියලුම නිලධාරීන්ටත් මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමු.

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්ය හා මගපෙන්වීම ලබා දුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ,මේජර් ජනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර මහතාට ,අධ්‍යක්ෂ ජනරාල් ,නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර මහතාට සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මහින්ද විතානච්චි මහතාට,නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප II ලලිත් විජයරත්න මහතාට,නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතිඥ සී.ජයවර්ධන මහත්මියට හා උපායමාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ ,නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අධ්‍යක්ෂ ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ .ඊ .කළුපහන මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ජේ.පී එස් සෝමසේකර මෙනවියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත් සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තුතිය පුද කරමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

“මහරගම” නගර සංවර්ධනය යථාර්ථයක් කරා...

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව “ගම සහ නගරය පිළිබඳ වෙනසක් නැති සැමට අවශ්‍ය සියළු පහසුකම්, සෑම තැන්හිම පවතින ආකාරයට අපේ රටේ භෞතික අවකාශය ප්‍රයෝජනයට ගත යුතුයි. ඒ සඳහා නව ප්‍රතිනාගරීකරණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයය”.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හදුනාගත් නගර 26 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. “මහරගම” නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

මහරගම නගර සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ මහරගම නගරයෙන් සේවා ලබාගන්නා සහ එහි නේවාසික ජනතාව සඳහා වන අතර එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනිමට මෙම සැලැස්ම මගින් හදුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් මහරගම සංවර්ධන සැලසුම (2022-2031) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු සභාපතිතුමාගේ පෙරවදන



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකාරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී අධිකාරිය පිහිටුවන ලද්දේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය සහ නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලැසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිවය.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ II අ කොටස 8 අ(1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් මෙවලම් හා ක්‍රමෝපායන් උපයෝගීකර ගනිමින් මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම 2022-2031 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු විසඳීමටත්, ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමටත් උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම අනුගමනය කර එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

මෙම සැලැස්ම නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. තවද මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මේජර් ජනරාල්(විශ්‍රාමික)උදය නානායක්කාර
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය.

ගරු සභාපතිතුමාගේ පෙරවදන

මහරගම නගර සභාව

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මකව කළමනාකරණය කිරීම හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීම සිදු කරනු ලබයි.

මහරගම නගර සභා බල ප්‍රදේශය 1979 ඔක්තෝම්බර් 01 දින නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත් වීමත් ,2002 වසරේ ජනවාරි මස සිට මහරගම නගර සභාව සංස්ථාපනය කරමින් නගර සභා බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමගම සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කරමින් පොදු මහජන සුබ සිද්ධිය උදෙසා තම වගකීම නොපිරිහෙලා ඉටු කරමින් සිටී. මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2008 – 2020 කාලසීමාව සඳහා සකස් කරන ලද මහරගම නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන සැලැස්මෙහි වලංගු කාලය ඉකුත් වීම හේතුවෙන් නව සංවර්ධන සැලැස්මක් ඉදිරි කාලපරිච්ඡේදය සඳහා සකස් කිරීමේ අවශ්‍යතාව මතු විය.

නාගරික සංවර්ධන අධිකාරී පනතේ බලතල ප්‍රකාරව සැලැස්මක් පිළියෙළ කිරීමේ කාර්යභාරය අදාළ පලාත්පාලන ආයතනයේ සැලසුම් කමිටුව වෙත බලය පවරා දීම සිදුකර ඇත. ඒ අනුව මෙම නගර ,සැලස්ම මහරගම නගර සභාවේ හා නාගරික සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් සකස් කිරීමට හැකිවීම භාග්‍යක් ලෙස සලකමි.

ඒ අනුව 2022 - 2031 කාල පරිච්ඡේදය සඳහා බලපැවැත්වෙන ලෙස මහරගම සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය මගින් සකස්කර සංවර්ධන කාර්යයන් නෛතික රාමුවක් යටතට පත්කර ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය යහපත් දිශානතිකයකට පත් කරලීමට කටයුතු කර ඇත. එමගින් අනාගත නේවාසික ප්‍රජාව මෙන්ම එදිනෙදා තම ජීවන අවශයතා සඳහා ප්‍රදේශයට සංසරණය වන නාගරික ප්‍රජාව ඉලක්ක කර ඇති අතර පවතින සංවර්ධන විභවතාවයන් හරහා ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ එක් කරලීමටත් කටයුතු සම්පාදනය කර ඇත. එමෙන්ම මෙම නගර සංවර්ධන සැලැස්ම හරහා පරිසර හිතකාමී වාණිජ හා සේවා කර්මාන්ත ආර්ථිකයක් මෙන්ම තෙත් බිම් සුරක්ෂිත පුරවරයක් ඇති කිරීම බලාපොරොත්තු වේ.

මහරගම නගර සභාව මා ඇතුළු මහජන නියෝජිතයන් අනාගතයේදී මහරගම ජාතික වශයෙන් රෙදිපිළි කර්මාන්තය සඳහා සුවිශේෂ ප්‍රතිරූපයක් පවත්වා ගනිමින් ප්‍රදේශයේ යටිතල පහසුකම් වලින් සපිරි සුවපහසු නේවාසික නගරයක් බවට පත් කරගැනීමේ උදාරතර අරමුණ වෙනුවෙන් තම වගකීමේ සහ යුතුකම් නොපිරි හෙලා ඉටු කිරීමට බලා පොරොත්තුවේ.

ටිරාජ් ලක්රුවන් පියරත්න
සභාපති
මහරගම නගර සභාව

පූර්විකාව

වර්තමානයේදී මහරගම නගරය හා තදාසන්න නගර වල ඇතිවන සංවර්ධනය හේතුවෙන් පැන නගින අභියෝගයන්ට මුහුණ දීම සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව මතුවී ඇත.ඒ අනුව, වර්තමානයේ මහරගම නගරය තුල පවතින ආර්ථික , සමාජීය හා පාරිසරික තත්වය සැලකිල්ලට ගෙන පවත්නා නීල හරිත පරිසරය ආරක්ෂා කරගනිමින් නේවාසික නගරයක් ලෙස විධිමත් සංවර්ධනයක් කරා ලගා විය හැකි අයුරින් මෙම සැලැස්ම සකස් කොට ඇත.

සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී 2011-2020 වර්ෂ වලට අදාල ද්විතියික දත්ත එකතු කිරීම සහ ක්ෂේත්‍ර පරික්ෂණ මගින් එක්රැස් කරන ලද දත්ත පදනම් කරගනිමින් සිදුකරන ලද විශ්ලේෂණ මගින් නිගමන වලට එළඹීම සිදුකරන ලදී. ඒ අනුව මහරගම නගරසභා බල ප්‍රදේශය උදෙසා 2022-2031 කාල සීමාව සඳහා වලංගුවන නව සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති අතර එය සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේදී විවිධ අවස්ථා වලදී ලබා ගත් තීරණ හා ප්‍රයෝගික ක්‍රියාවලිය හරහා අවබෝධ කරගත් කරුණු යන දෙකෙහිම ප්‍රතිඵලයක් වේ.

ඒ අනුව 2022 -2031 කාල සීමාව සඳහා සකස් කරන ලද මහරගම සංවර්ධන සැලැස්ම කොටස් තුනකින් සමන්විත වේ. එහි පළමුවන කොටස සංවර්ධන සැලැසේමේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, ශදුඅත (SWOT) විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන පරිච්ඡේද වලින් සමන්විත වන අතර දෙවන කොටස 2022-2031 කාල සීමාව සඳහා සැලසුම් සීමාවට අදාල සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාපීකරණ මායිම් වලට අදාල ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

මහරගම නගර සහා බල ප්‍රදේශය සදහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 මාර්තු මස 25 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, මහරගම නගර සහා බල ප්‍රදේශය සදහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

2022 ...අප්‍රේල්.........මස ...04... වන දින.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2288/13 - 2022 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2022.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2022 මාර්තු මස 25 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ජූලි මස 04 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2022 ක් වූ ජූලි මස 04 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන

1A - G 37085 — 46 (2022/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ජූලි මස 12 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

මහරගම නගර සහා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ජූලි මස 04 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

මේජර් ජනරාල් (විශ්‍රාමික) **උදය නානායක්කාර,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2022 ජූලි මස 12 වැනි දින.

EOG 07-0082

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

පටුන

I කොටස

පරිච්ඡේදය 01

සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම 3
1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් 4-5
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය 6
1.4 සැලසුම් ක්‍රියාවලිය 6-7
1.4.1 පසුබිම් අධ්‍යයනය 8
1.4.2 විෂය පථය 8
1.4.3 ගැටළු හා විභවතාවයන් හඳුනා ගැනීම 8
1.4.4 දැක්ම හා අරමුණු 8
1.4.5 විස්තරාත්මක විශ්ලේෂණය 9
1.4.6 සැලසුම් හා උපායමාර්ග 9
1.4.7 සැලසුම් නියමතා 9
1.4.8 අදහස් ලබා ගැනීම 9
1.4.9 අවසන් සැලසුම් වාර්තාව සකස් කිරීම 9
1.4.10 අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම 9

පරිච්ඡේදය 02

මූලික අධ්‍යයනය

2.1 අධ්‍යයන ප්‍රදේශය 13-16
2.2 සැලසුම් හා තත්ත්ව සන්දර්භය
2.2.1 ඓතිහාසික පසුබිම හා විකාශනය 17-19
2.2.2 පූර්ව සැලසුම් ප්‍රයත්න 20-25
2.2.3 අදාළ වන ජාතික ප්‍රතිපත්ති 25-26
2.2.4 මහරගම බල ප්‍රදේශයෙහි භෞතික පසුබිම 27-32
2.2.5 මහරගම බල ප්‍රදේශයෙහි සමාජයීය පසුබිම 32-34
2.2.6 මහරගම බල ප්‍රදේශයෙහි ආර්ථික පසුබිම 35-36
2.2.7 මහරගම බල ප්‍රදේශයෙහි සේවා හා යටිතල පහසුකම් පසුබිම 37-42
2.2.8 මහරගම බල ප්‍රදේශයෙහි පාරිසරික පසුබිම 43-48
2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම 49-54

පරිච්ඡේදය 03

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

3.1 හැඳින්වීම 57
3.2 සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා ගැටළු විශ්ලේෂණය
3.2.1 ප්‍රවාහන තදබදය අධික ලෙස වර්ධනය වීම 57-60
3.2.2 වර්තමාන නේවාසික ක්‍රියාකාරකම් පරිසර සංවේදී කලාප ප්‍රදේශයන්ට ව්‍යාප්ත වීමේ අවධානම 61-63
3.2.3 ප්‍රදේශයේ පවතින විභවතා සංවර්ධන කටයුතු සඳහා භාවිත කර නොගැනීම 64-65

3.3 සැලසුම් ප්‍රදේශය තුල පවත්නා විභවතා විශ්ලේෂණය
3.3.1. ඉදිරි සංවර්ධන ව්‍යාපෘති වලින් උපරිම ධනාත්මක බලපෑම් අත්කර ගැනීම 65-68

පරිච්ඡේදය 04
සංවර්ධන සැලසුම් රාමුව

4.1 සංවර්ධන සැලැස්මෙහි දැක්ම 71
4.2 දැක්මේ ප්‍රකාශනය 71
4.3 සංවර්ධන සැලසුමේ ප්‍රධාන අරමුණු 72
4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ 72-73

පරිච්ඡේදය 05
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

5.1 විස්තරාත්මක ශදුඅත විශ්ලේෂණය
5.1.1 සුවපහසු නේවාසික නගරයක් සඳහා වන ශදුඅත විශ්ලේෂණය 77-85
5.1.2 කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් සඳහා වන ශදුඅත විශ්ලේෂණය 86-91
5.1.3 ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් සඳහා වන ශදුඅත විශ්ලේෂණය 92-97
5.1.4 තෙත්බිම් සුරක්ෂිත හරිත පුරවරයක් ඇතිකිරීම 97-102

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

6.1 සංකල්පීය සැලැස්ම 105-106
6.2 මහරගම සංවර්ධන සැලසුමෙහි සංයුතිය 107-108
6.3. අවකාශීය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම
6.3.1 හැඳින්වීම 109
6.3.2 අරමුණ 109
6.3.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 109
6.3.4 විෂය පථය 109
6.3.4.1 මහරගම ප්‍රදේශය සඳහා යෝජිත ඝනත්ව රටාවන් සහ යෝජිත භූමි පරිභෝජන රටාවන් 110
6.3.4.2 අපේක්ෂිත ජනගහන පුරෝකථනය 110
6.3.4.3 විශේෂිත උස පාලන කලාපයන් 113-114
6.4. ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගික සැලැස්ම
6.4.1 හැඳින්වීම 115
6.4.2 අරමුණ 115
6.4.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 115
6.4.4 විෂය පථය 115
6.4.4.1. නගරයන් අතර ප්‍රවාහනය සඳහා වන සංවර්ධන උපාය මාර්ගයන් 116-117
6.4.4.2. නගරය තුල ප්‍රවාහනය සඳහා වන සංවර්ධන උපාය මාර්ගයන් 118
6.5. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම
6.5.1 හැඳින්වීම 120
6.5.2 අරමුණ 120

6.5.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 120
6.5.4 විෂය පථය 120
6.5.4.1 ප්‍රධාන මංසන්ධි සංවර්ධනය 121-127
6.5.4.2 තෝරාගත් ස්ථානයන්හි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 128
6.5.4.3 පමුණුව ආශ්‍රිතව රෙදිපිළි කර්මාන්තය සඳහා විශේෂිත සංවර්ධනය 129-130
6.6. ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම
6.6.1 හැඳින්වීම 131
6.6.2 අරමුණ 131
6.6.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 131
6.6.4 විෂය පථය 131
6.6.4.1 නේවාසික යෝග්‍යතාවය අනුව ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනාගැනීම 132-133
6.6.4.2 දැරිය හැකි මිලකට වන නිවාස, මධ්‍යම අදායම් නිවාස, සහ ඉහල ආදායම් නිවාස ව්‍යාපෘති සංවර්ධනයන් 134-136
6.6.4.3 නේවාසික ප්‍රදේශවලට අවශ්‍ය පහසුකම් සැපයීමට උපායමාර්ගික මැදිහත්වීම. (භෞතික යටිතල පහසුකම්, සමාජීය යටිතල පහසුකම් සහ එළිමහන් මහජන විනෝදාත්මක ස්ථාන ඇතිකිරීම) 137
6.7. අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම
6.7.1 හැඳින්වීම 138
1 6.7.2 අරමුණ 138
6.7.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 138
6.7.4 විෂය පථය
6.7.4.1 උපයෝගිතා සේවාවන්හි කාර්යක්ෂම සැපයුම
6.7.4.1.1 නල ජලය සැපයීම 139
6.7.4.1.2 විදුලිය සැපයීම 140
6.7.4.1.3 සුහුරු සෞඛ්‍ය සේවාවක් සැපයීම 141-144
6.7.4.1.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය 145-146
6.7.4.1.5 අපජලය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය 147
6.8. තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම
6.8.1 හැඳින්වීම 148
6.8.2 අරමුණ 148
6.8.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 148
6.8.4 විෂය පථය
6.8.4.1 තෙත්බිම් කලාපීකරණ සැලැස්ම 149-150
6.8.4.2 භූ දර්ශන කළමනාකරණ සැලැස්ම 151-152
6.8.4.3 ආපදා අවදානම අවමකිරීමේ සැලැස්ම 153
6.8.4.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිලිබඳ අවකාශීය සැලැස්ම 154-156
6.9 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය
01. කලල්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම/ කලල්ගොඩ හරස් මාර්ගය 157-158
02. වීර මාවත සංවර්ධනය කිරීම 159-160
03/04. නාගහවත්ත - පමුණුව 7 වන පටුමග මාර්ගය හා පමුණුව 2 වන පටුමග මාර්ගය සංවර්ධනය කිරීම 161-162
05. ඇල්හේන මාර්ගය මාර්ගය සංවර්ධනය කිරීම 163-164
06. බෝගහවිල - මාකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම 165-166
07. ඉසිපතන මාර්ගය සංවර්ධනය කිරීම 167-168

08. මාකුඹුර නව මාර්ගය ඉදි කිරීම 169-170
09. පාසල් මාවත සංවර්ධනය කිරීම 171-172
10. ඇහැලපේ මාර්ගය සංවර්ධනය කිරීම 173-174
11. මාකුඹුර මංසන්ධිය සංවර්ධනය 175-176
12. කොට්ටාව මංසන්ධිය සංවර්ධනය 177-179
13. තලවතුගොඩ මංසන්ධිය සංවර්ධනය 180-182
14. විද්‍යාල හන්දිය මංසන්ධිය සංවර්ධනය 183-184
15. පන්නිපිටිය හන්දිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය 185-186
16. වල්ජම්බුගස්වත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය 187-188
17. මහරගම 35 වත්ත ඉඩම මිශ්‍ර සංවර්ධන ව්‍යපෘතිය 189-191
18. නාවින්න බස් නැවතුම්පොළ ඉදිරිපිට මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය 192-193
19. සියඹලාගහ වත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය 194-195
20. පමුණුව රෙදිපිළි වීථියෙහි නිර්මාණාත්මක සැලසුම් ව්‍යාපෘතිය 196-197
21. මාකුඹුර නිවාස ව්‍යාපෘතිය 198-199
22. තලපත්පිටිය නිවාස ව්‍යාපෘතිය 200-201
23. ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිත සංවර්ධනය 202-204
24. නාවින්න ආයුර්වේද රෝහල ආශ්‍රිත සංවර්ධනය 205-207
25. අපේක්ෂා රෝහල ආශ්‍රිත සංවර්ධනය 208-209
26. ප්‍රගතිපුර, බෝගහවත්ත හා රුක්මලේ කුඹුර ආශ්‍රිත ඇවිදින මංතීරු 210-212
27. මහජන උද්‍යානය (Dine In Park) - කොට්ටාව 213-214
28. මහරගම නාගරික උද්‍යානය 215-216
29. බර්ඩ් පාර්ක් (කුරුළු උයන) ව්‍යාපෘතිය 217-218
30. තෙත් බිම් ආරක්ෂණ ව්‍යාපෘතිය 219-220

II කොටස

පරිච්ඡේදය 07
සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.1 හැඳින්වීම 225
7.2 සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා
7.2.1 සංවර්ධන කලාප 225
7.2.2 කලාපීකරණ සැලැස්ම (2022 - 2031) 226
7.3 කලාප සංගුණකය (Zone Factor)
7.3.1 කලාප සංගුණකය හැඳින්වීම 227
7.3.2 කලාප සංගුණකය හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය 227
7.4 සංවර්ධන සීමා 228
7.5 සංවර්ධන කලාපයන්හි කලාප සංගුණකයන් 228
7.6 සැලසුම් හා සංවර්ධන පොදු **නියමතා** 229
7.6.1 සංවර්ධන බල ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන අනෙකුත් පොදු නියමතා 229-233

පරිච්ඡේදය 08
කලාපීකරණ නියමතා

8.1 කලාපීකරණ නියමතා
8.1.1 විශේෂ නේවාසික කලාපය 237-239
8.1.2 අඩු සනත්ව නේවාසික කලාපය 240
8.1.3 මධ්‍යම සනත්ව නේවාසික කලාපය 241
8.1.4 මධ්‍යම සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය 242
8.1.5 මධ්‍යම සනත්ව වාණිජ කලාපය 243

8.1.6 ප්‍රවර්ධන වාණිජ කලාපය 244
8.1.7 ඉහල ඝනත්ව වාණිජ කලාපය 45
8.1.8 තෙත් බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය 246-247
8.1.9 කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය 248-249
8.1.10 තෙත් බිම් ආරක්ෂණ කලාපය 250

III කොටස

සිතියම් ලැයිස්තුව 253-254
රූප ලැයිස්තුව 255-256
වගු ලැයිස්තුව 257
ඇමුණුම්
ඇමුණුම I
නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් ගෙබිම් අනුපාතයන් 261
නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් මහල් ප්‍රමාණයන් 262
නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති විවෘත අවකාශයන් 262

ඇමුණුම II
යෝජිත භාවිතයන් හා ඊට අදාළ අවම බිම් ප්‍රමාණයන් 263-265

ඇමුණුම III
යෝජිත මාර්ග පළල, ගොඩනැගිළි සීමා සහ රක්ෂිත 266-295

ඇමුණුම IV
කලාප සීමාවන් 295-535

I වන කොටස

01
වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මේ පසුබිම

පරිච්ඡේදය 01

සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම

නගරයක අනාගත සැලැස්ම සකස් කිරීමේදී එම නගරයෙහි පවතින භෞතික, සමාජ, ආර්ථික, පාරිසරික, සංස්කෘතික ආදී සියලු අංශයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා සිටීම වැදගත්ය. සංවර්ධන සැලසුම්කරණය යනු යම් ප්‍රදේශයක් සතුව පවතින මෙකී සියලු අංශයන්හි සාධක උපක්‍රමානුකූල ලෙස, තිරසාර සංවර්ධනයකට යොමු කරන ආකාරය දක්වන හා ඒ සඳහා ප්‍රදේශයේ පාර්ශවකරුවන්, විශේෂයෙන්ම එහි ජීවත් වන නේවාසිකයන් සංවර්ධන කටයුතු වලදී ක්‍රියා කල යුතු ආකාරය දක්වන, නෛතිකව පිළිගැනීමකට ලක්වුණු ලිඛිත වාර්තාවකි.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 'අ' වගන්තියේ බලතල ප්‍රකාරව, අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බල ප්‍රදේශයක් සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ කාර්යභාරය 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධන) පනතේ 8 'අ' වගන්තිය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය පැවරී ඇත.

1979 ඔක්තෝම්බර් 01 අංක 56/6 දරණ ගැසට් පත්‍රය මගින් මාලපල්ල, කොට්ටාව උතුර, කොට්ටාව දකුණ, රුක්මලේ සහ කළල්ගොඩ යන ග්‍රාම නිලධාරි කොට්ඨාශයන් හා කොළඹ දිස්ත්‍රික්කය තුළ හේවාගම් කෝරළේ - බටහිර පල්ලේ පත්තුවට අදාළව අතුරුගිරිය ගම් සහා ප්‍රදේශයද නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. අනතුරුව 2002 ජනවාරි මස 10 වන දින අංක 1218/35 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් 2002. 04. 15 වන දින සිට මහරගම නගර සභාව සංස්ථාපනය කරමින් නගර සභා බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම ප්‍රදේශය ග්‍රාම සේවා වසම් 41 කින් සමන්විත වේ.

කොළඹ නගරයෙහි පරිපාලන කටයුතු බත්තරමුල්ල ප්‍රදේශයෙහි සංකේන්ද්‍රණය වීමේ ප්‍රවණතාවය අනුව 1985 අංක 335/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සකස් කරන ලද ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන අගනගර ප්‍රදේශ සැලැස්ම තුලට මහරගම ප්‍රදේශයද අයත් විය.

ජාතික භෞතික සැලැස්ම මගින් හඳුනා ගන්නා ලද “කොළඹ නාගරික පුරවර කලාපය” 2017 අංක 2019/11 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම කලාපය සඳහා ව්‍යුහාත්මක සැලැස්මක් (Structure Plan) පිළියෙල කරන ලදි. මෙහිදී සම්පූර්ණ බස්නාහිර පළාත සඳහා යෝජනා කරන ලද පුළුල් අවකාශීය ව්‍යුහය සඳහා 2015 වර්ෂයේදී දී සකස් කරන ලද කොළඹ මහනගර සැලැස්මද සැලකිල්ලට භාජනය කර ඇත.

අනතුරුව 2019 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, මහරගම නගර සභා බල ප්‍රදේශය හා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් සැලසුම් ප්‍රදේශය ලෙස සලකා නාගරික සංවර්ධන අධිකාරියෙන් අග නගර සංවර්ධන සැලැස්ම 2030 පිළියෙල කරන ලදි.

මේ වනවිට 2008 – 2020 කාලසීමාව සඳහා සකස් කරන ලද මහරගම නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන සැලැස්මෙහි වලංගු කාලය ඉකුත් වීම හේතුවෙන් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු විය.

''අගනගර සංවර්ධන සැලැස්ම- 2030'' මගින් කඩුවෙල මහ නගර සභාව, කෝට්ටේ මහ නගර සභාව, මහරගම නගර සභාව හා කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් යුතු පුළුල් භූමි පරාසයක් තුල විහිදි, පාලන ප්‍රදේශ හතරක් ඒකාබද්ධ කරමින් සැකසූ සැලැස්මක් වන අතර එම සංවර්ධන සැලැස්මට ප්‍රතිශෝධනයක් ලබා දෙමින් ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික සංරචක, තිරසාර සංවර්ධනයකට යොමු කිරීම පෙරදැරි කරගනිමින් මහරගම පළාත් පාලන බල ප්‍රදේශය සඳහා 2022 – 2031 කාල සීමාව සඳහා නව සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා ඇතුලත් මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

මහරගම සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී එහි ආරම්භයේ සිට අවසානය දක්වාම සියලු පාර්ශවයන්ගෙන් විවිධ අවස්ථාවන්හිදී අදහස් හා යෝජනාවන් තුලින් සහය ලබා ගැනීම සිදුකරන ලද අතර පරිපාලන, පාරිසරික, ආර්ථික, කර්මාන්ත, දේශපාලන හා යටිතල පහසුකම් යන අංශයන් වල නියුතු විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධ වගකීම් දරණ හා ක්‍රියාකාරී පාර්ශවකරුවන් සමඟ උපදේශන සාකච්ඡා, සම්මන්ත්‍රණ, රැස්වීම්, දුරකථන සංවාද හා ක්ෂේත්‍ර සමීක්ෂණයන් වලින් තොරතුරු, අදහස් හා යෝජනා ඇතුලත් ව දත්ත එක් රැස් කිරීම, ප්‍රදේශය සම්බන්ධ ගැටළු හා විභවතාවන් හඳුනා ගැනීම, දත්ත විශ්ලේෂණය කිරීම, උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම හා සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා සකස් කරනු ලැබ ඇත.

එම පාර්ශවකරුවන් පහත පරිදි පෙළ ගස්වනු ලැබේ.

ප්‍රධාන ක්‍රියාකාරී පාර්ශවකරුවන් ලෙස,

- මහරගම නගර සභාව
- මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- බස්නාහිර පළාත් සභාව

ප්‍රධාන උපදේශන ආයතන,

- නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යංශය
- මධ්‍යම පරිසර අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- මාර්ග සංවර්ධන අධිකාරිය
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
- විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය
- බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය අධිකාරිය
- ජාතික අපදා කළමනාකරණ ආයතනය
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- කලාප අධ්‍යාපන කාර්යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය
- ලංකා විදුලිබල මණ්ඩලය

- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

අනෙකුත් පාර්ශවකරුවන්

- වෙළඳ සංගම්
- ත්‍රී රෝද රථ සංගම්
- සිවිල් සංවිධාන
- ප්‍රජා මූල සංවිධාන
- වෙනත් ආයතන

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

නාගරික සංවර්ධන අධිකාරී පනතේ බලතල ප්‍රකාරව, විෂය භාර අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බල ප්‍රදේශයක් සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ කාර්යභාරය 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත මඟින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය පැවරී ඇත. එමෙන්ම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ බලතල 1990 මැයි 07 දිනැති අංක 11 දරණ චක්‍ර ලේඛය මගින් අදාල පලාත්පාලන ආයතනයේ සැලසුම් කමිටුව වෙත බලය පවරා දීම සිදුකර ඇත.

සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී පොදුවේ පිළිගත හැකි පවතින දත්තයන් විශ්ලේෂණය කරමින් දිගුකාලීන සංවර්ධන දැක්මක් කරා ගමන් කිරීම මුලිකව බලාපොරොත්තු වේ. ඒ අනුව, වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්ති, මහරගම නගර සභා බල ප්‍රදේශය මුහුණ දිය හැකි අභියෝග සහ සංවර්ධනය කරා යාමට ඇති විභවතා අදාළ කර ගනිමින් ආර්ථික, භෞතික, සමාජීය හා පාරිසරික වශයෙන් සැලසුම්මය පැතිකඩකින් අන්තර් සම්බන්ධතාවක් නිර්මාණය කිරීම මෙම සැලැස්ම මඟින් සිදු කර ඇත.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් පිළියෙළ කරන ලද ජාතික භෞතික ව්‍යුහාත්මක සැලැස්ම -2050 අනුව මහරගම නගරය කේන්ද්‍රගත නාගරික සංවර්ධන ප්‍රදේශය තුල පිහිටා ඇත. එමෙන්ම බස්නාහිර කලාපීය මහනගර සැලැස්මට අනුව මහරගම නේවාසික කලාපය තුල පිහිටා ඇත. කොළඹ මහා නාගරික කලාපීය ව්‍යුහාත්මක සැලැස්ම මගින් මහරගම නගරය දෙවන පෙළ නගරයක් ලෙස හදුනාගෙන ඇත. ඒ අනුව මහරගම බල ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කය තුල ඉතා වැදගත් ස්ථානයක් බවට පත්ව ඇත.

රැම්සාර් තෙත්බිම් වර්ගීකරණය යටතේ මහරගම ඇතුළු කොළඹ ප්‍රදේශය තුළ තෙත්බිම් වර්ගීකරණය සිදු කොට ඇත. කොළඹ නගරයට ඉතා ආසන්නව පිහිටි මහරගම, තෙත්බිම් කලාපයන්ගෙන් සමන්විත අර්ධ නාගරික වූ නේවාසික භාවිතයන් සඳහා වැඩි නැඹුරුතාවයක් ඇති ප්‍රදේශයක් වන බැවින් එම ප්‍රදේශයේ භූමි පරිභෝජනය ඉහල අගයක් ගනී.

2022- 2031 දක්වා ඉදිරි දස වසරක් සඳහා මෙම සැලැස්ම පිළියෙළ කරනු ලැබ ඇත.

1.4 සැලසුම් ක්‍රියාවලිය

මහරගම සංවර්ධන සැලැස්ම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනතේ දක්වා ඇති සැලසුම් කිරීමේ කාර්යය පටිපාටියට අනුව, ඊට අනුගත වෙමින් උපායාත්මක සැලසුම්කරණ ප්‍රවේශය මත සකස් කර ඇත. සැලසුම් ක්‍රියාවලිය, නිර්මාණ ක්‍රියාවලිය හා විවිධ අවස්ථාවන් වලදී ගෙන හැර දැක්වීමේ මුලධර්ම අනුව 2019-2030 අගනගර සැලැස්ම සකස් කොට ඇති අතර, මෙම 2022 -2031 මහරගම නගර සභා සංවර්ධන සැලැස්ම, අගනගර සැලැස්මේ ඇති ක්‍රමවේදයන්ද උකහා ගනිමින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීම උදෙසා සැලසුම්කරණයට පහසු හා නම්‍යශීලී ක්‍රමවේදයක් ඔස්සේ යමින් සම්ප්‍රදායික සැලසුම් ක්‍රියාවලියෙන් බැහැර වූ නව ක්‍රමවේදයක් අනුගමනය කර පිළියෙළ කිරීම සිදු කර ඇත.

සනත්වය මත පදනම් වූ කලාපීය සැලැස්ම සහ සංවර්ධන නියමතා සකස් කිරීමෙන් අනතුරුව පොදු මහජනතාව, පාර්ශවකරුවන් සහ මහරගම නගර සභාවෙහි දින 60 ක කාල සීමාවක් අදහස් දැක්වීම් අනුව සංශෝදනය කර අවසන් කල සැළසුම් කෙටුම්පත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව මගින් අනුමැතිය ලබා ගන්නා ලදී

පසුබිම් අධ්‍යනය	ප්‍රාථමික දත්ත ලබා ගැනීම- චන්ද්‍රිකා ඡායාරූප ලබා ගැනීම, අන්තර්ජාලය, ක්ෂේත්‍ර නිරීක්ෂණ ද්වීතියක දත්ත ලබා ගැනීම- සම්පත් පැතිකඩ, ජාතික භෞතික සැලැස්ම
විෂය පථය	Excel/ Arc GIS ආදී මෘදුකාංග යොදා ගනිමින් සැලසුම් බල ප්‍රදේශයේ පවත්නා තත්වය විශ්ලේෂණය කිරීම
ගැටළු හා විභවතාවයන් හඳුනා ගැනීම	පාර්ශවකරුවන් සමග පැවැත්වූ සාකච්ජා මගින් හඳුනා ගත් ගැටළු හා විභවතාවයන් විශ්ලේෂණය කිරීම
දැක්ම හා අරමුණු	ඉහත දී හඳුනා ගත් ගැටළු හා විභවතාවයන්හි ප්‍රමුඛතාවය මත පදනම්ව ඉදිරි දැක්ම හා අරමුණු සකස් කිරීම
විස්තරාත්මක විශ්ලේෂණය	නේවාසික ජනගහන පුරෝකථනය,සංසරණ ජනගහන පුරෝකථනය ,පාරිසරික සංවේදිතා විශ්ලේෂණය,අවකාශීය සම්බන්ධතා විශ්ලේෂණය, සංවර්ධන පීඩනය,මංසන්ධි විශ්ලේෂණය ආදිය පදනම් කර ගනිමින් තොරතුරු විශ්ලේෂණය කිරීම
සැලසුම් සහ උපාය මාර්ග	සවර්ධන සැලැස්මෙහි දැක්ම හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහරගම නගර සහා බල ප්‍රදේශය සඳහා වන සංකල්පිත සැලැස්ම තුලින් 2031 භූමි පරිහරණ රටාව සැලසුම් කිරීම හා ඊට අදාල වූ අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය, ආර්ථික සංවර්ධනය හා තිරසාර පරිසර සංවර්ධනය උදෙසා වූ උපායමාර්ග සැලසුම් වලට අමතරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග සැලසුම් පිළියෙල කිරීම
සැලසුම් නියමතා	සැලසුම් ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංකල්පමය සැලැස්මට අනුව කලාපීකරණ සිතියමක් සකස් කිරීම හා එය බලාත්මක කිරීමට අවශ්‍ය නියමත සකස් කිරීම
අදහස් ලබා ගැනීම	මහජන අදහස් විමසීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් සංවර්ධන සැලැස්ම පිලිබඳව පොදු එකගතාවයකට පැමිණීම සහ අදාල සංශෝදනයන් නිවැරදි කිරීම
අවසන් සැලසුම් වාර්ථාව සකස් කිරීම	දල සැලැස්ම අනුමැතිය සලකා බැලීම සඳහා ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම
අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම	නෛතික රාමුවට අනුකූලව සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම

1.4.1 පසුබිම අධ්‍යයනය

මේ යටතේ සංවර්ධන සැලසුම සඳහා අවශ්‍ය ප්‍රාථමික හා ද්විතියික දත්ත එක් රැස් කිරීම සිදු කරන ලදී. මහරගම නගරය හා බැඳුණු ඓතිහාසික තොරතුරු, ජන සංයුතිය, ආර්ථික හා පරිසර සාධක, පූර්ව සැලසුම් මැදිහත්වීම් මෙන්ම ප්‍රදේශයේ සියලු ආයතනයන් මගින් ද තොරතුරු සහ දත්ත ලබා ගන්නා ලදී. ඩ්‍රෝන තාක්ෂණික ක්‍රමවේදය, ඡායාරූප මගින් සහ ක්ෂේත්‍ර අධ්‍යනයන් මේ සඳහා යොදා ගන්නා ලදී. එමෙන්ම, මහජනතාව හා සක්‍රිය ක්‍රියාකාරිකයන් හෙවත් ආයතන නිලධාරීන්ගේ සහයෝගය මත,

- දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය
- ක්ෂේත්‍ර සමීක්ෂණය
- ලේඛන විමර්ශනය
- ද්විතියික දත්ත රැස්කිරීම
- ඉඩම් භාවිත යාවත් කාලීන කිරීම
- පදනම් සිතියම් සැකසීම හා දත්ත පදනම

තුලින් මහරගම නගරයේ ඓතිහාසික විකාශය, සැලසුම් ප්‍රයත්න, ජන විකාශ විද්‍යාව ,නිවාස, පාරිසරික,භූ ගෝලීය ,ආපදා තත්ත්ව, නගරය තුල පවතින ඉඩම් භාවිතයන් හා එකී ඉඩම් වල වටිනාකම් ආර්ථික නියමයන්, අපරව්‍යුහ පහසුකම් ආදී අත්‍යාවශ්‍ය දත්ත හා තොරතුරු ලබා ගැනීම සිදු කර ඇත.

1.4.2 විෂය පථය

නගරයේ විකාශනය, භූ ගෝලීය පසුබිම, ජනගහනය, හා අපේක්ෂිත සමස්ත අවකාශීය සංවර්ධනය නියාමනය සහ කළමනාකරණය කල හැකි පරිදි පරිසර කළමනාකරණය, ආර්ථික, යටිතල පහසුකම්, ජනාවාස සහ සමාජයීය සංවර්ධනය යන විවිධ ක්ෂේත්‍ර වලට අවධානය යොමුකරමින් සංවර්ධන සැලැස්ම පිළියෙළ කර ඇත.

1.4.3 ගැටළු හා විභවතාවයන් හඳුනා ගැනීම

මහරගම නගර සහා බල ප්‍රදේශය තුල පසුබිම අධ්‍යයනය කිරීම හරහා ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය සම්බන්ධව ලබා ගන්නා අවබෝධය තුලින් සංවර්ධන සැලැස්මක් සැකසීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සිදු කරන ලදි. විවිධ අංශයන්හි නියුතු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විවිධ වැඩමුළු, සාකච්ඡා හරහා ලබා ගන්නා ලද අදහස් හා යෝජනා සමග දත්ත විශ්ලේෂණය කිරීම තුලින් ගැටළු හා විභවතා හඳුනා ගැනීම සිදු කර ඇත.

1.4.4 දැක්ම හා අරමුණු

ප්‍රදේශයේ ගැටළු, විභවතා හා සංවර්ධන ප්‍රවණතා අනුව, ආර්ථික, භෞතික, පාරිසරික හා සමාජයීය යන අංශයන් ඒකාබද්ධව නාගරික සංවර්ධන කටයුතු සම්පූර්ණ කර ගැනීම සඳහා දැක්ම, අරමුණු හා පරමාර්ථයන් ගොඩ නැංවීම මෙහිදී සිදු කර ඇත. ඒ අනුව, බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත දැක්ම සවිස්තරාත්මක ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විග්‍රහයෙන් (SWOT Analysis) මතු කරගත් කරුණු මත පදනම්ව පරමාර්ථයන් සකස් කර ඇත.

1.4.5 විස්තරාත්මක විශ්ලේෂණය

ශදුඅත (SWOT) විශ්ලේෂණය මගින් සංවර්ධන සැලැස්මෙහි දැක්ම හා අරමුණු පදනම් කර ගනිමින් සවිස්තරාත්මක ලෙස දත්ත විශ්ලේෂණය කිරීම සිදු කරනු ලැබ ඇත.

1.4.6 සැලසුම් සහ උපායමාර්ග

සංවර්ධන සැලැස්මෙහි දැක්ම හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා වන සංකල්පිත සැලැස්ම තුලින් 2031 භූමි පරිහරණ රටාව සැලසුම් කිරීම හා ඊට අදාල වූ අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය, ආර්ථික සංවර්ධනය හා තිරසාර පරිසර සංවර්ධනය උදෙසා වූ උපායමාර්ග සැලසුම් වලට අමතරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග සැලසුම් පිළියෙල කිරීම සිදු කරන ලදී.

1.4.7 සැලසුම් නියමතා/ රෙගුලාසි

සැලසුම් හා සංවර්ධන නියමතා/ රෙගුලාසි සකස් කිරීම, ඉඩම් සංවර්ධනය සහ පරිහරණය සම්බන්ධ නීති රීති, පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය හා සංවර්ධනය කිරීමට අවශ්‍ය නීති රීති මෙන්ම සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේ දී පවත්නා ගැටලුකාරී තත්ත්ව මඟ හරවා ගැනීම සඳහා නියමතා/ රෙගුලාසි සකස් කිරීම සිදු කර ඇත.

1.4.8. අදහස් ලබා ගැනීම

විවිධ වැඩසටහන් පැවැත්වීම මඟින් සංවර්ධන සැලැස්ම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ අදහස්, යෝජනා, විරෝධතා හා සංශෝධන ලබා ගැනීමට කටයුතු කරනු ලැබූ අතර එහිදී මහජන දැනුවත් කිරීම උදෙසා සැලැස්ම දින 60 ක කාල සීමාවක් මහරගම නගර සභාව තුළ තබන ලදී. අනතුරුව නාගරික සංවර්ධන අධිකාරියේ වෘත්තීයවේදීන් වෙත සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීමටත් එමගින් අධිකාරියේ නිලධාරීන්ගේ අවසන් අදහස් හා යෝජනා ලබා ගැනීමත් සිදු කරන ලදී.

1.4.9 අවසන් සැලසුම් වාර්තාව සකස් කිරීම

මහරගම නගර සභාවේ අදහස් හා යෝජනාවන් , පාර්ශවකරුවන්හේ අදහස් හා යෝජනාවන් ඇතුළත්ව පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා සංවර්ධන සැලසුම් අංශය වෙත භාර දීමත් ප්‍රධාන සැලසුම් කමිටුවේ අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගෙන අවසන් සංවර්ධන සැලැස්ම සකස් කිරීමත් සිදුකොට ඇත.

1.4.10 අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම

ප්‍රධාන ක්‍රියාවලි කිහිපයක් යටතේ සිදු කර ඇත. ඒ අනුව,

- ✓ ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම
- ✓ සැලැස්ම ත්‍රෛයි භාෂා වලට පරිවර්තනය කිරීම
- ✓ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- ✓ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- ✓ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම
- ✓ පුවත්පත් මඟින් මහජනතාව දැනුවත් කිරීම

02

වන පරිච්ඡේදය

මූලික අධ්‍යයනය

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

2.1 අධ්‍යයන ප්‍රදේශය

කොළඹ දිස්ත්‍රික්කයෙහි සීග්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි මහරගම නගර සභා බල ප්‍රදේශය ප්‍රධාන වශයෙන් හයිලෙවල් මාර්ගය සම්බන්ධ කරගනිමින් වර්ග කිලෝමීටර් 39.4 පමණ වපසරියක් තුල ග්‍රාම නිලධාරී වසම් 41 කින් සමන්විත ප්‍රදේශයක් ලෙස සඳහන් කල හැක. මෙම ප්‍රදේශය උතුරින් හා ඊසාන දෙසින් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, නැගෙනහිරින් හා ගිනිකොණින් හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, දකුණින් හා නිරිත දිගින් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, බටහිරින් (සුළු ප්‍රමාණයක්) දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, බටහිරින් හා වයඹින් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද මායිම් වී ඇත.(සිතියම් අංක 2.1)

2019 වර්ෂය වන විට මුළු ජනගහනය 212,014 ක ප්‍රමාණයක් වන අතර ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට පුද්ගලයන් 5381ක් වේ. ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2500-3000ක් පමණ වන අතර මනාව ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ලැබේ.නමුත් වර්ෂය තුලදී අධික වර්ෂාපතනයක් මැයි -අගෝස්තු හා ඔක්තෝම්බර් -නොවැම්බර් කාල පරිච්ඡේද අතරතුරදී ලැබේ. ඒකාකාරව පවතින වාර්ෂික උෂ්ණත්වයක්ද මහරගම පවතින අතර සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27° C කි.

සිතියම 2.1 මහරගම නගර සභා බල ප්‍රදේශයෙහි පිහිටීම



සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය., 2021

රූපය 2.1 : සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය



The daily average high (red line) and low (blue line) temperature, with 25th to 75th and 10th to 90th percentile bands. The thin dotted lines are the corresponding average perceived temperatures.

Average	Jan	Feb	Mar	Apr	May	Jun	Jul	Aug	Sep	Oct	Nov	Dec
High	88°F	89°F	90°F	90°F	89°F	87°F	86°F	86°F	87°F	87°F	87°F	87°F
Temp.	80°F	82°F	83°F	84°F	84°F	83°F	83°F	82°F	82°F	82°F	80°F	80°F
Low	74°F	75°F	76°F	78°F	80°F	80°F	79°F	79°F	78°F	77°F	75°F	74°F

මූලාශ්‍රය :https://weatherspark.com/, 2021

රූපය 2.2 සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය හා සුළං දිශාව



The average rainfall (solid line) accumulated over the course of a sliding 31-day period centered on the day in question, with 25th to 75th and 10th to 90th percentile bands. The thin dotted line is the corresponding average snowfall.

	Jan	Feb	Mar	Apr	May	Jun	Jul	Aug	Sep	Oct	Nov	Dec
Rainfall	2.2"	1.7"	2.6"	5.4"	6.1"	4.1"	2.4"	2.5"	4.2"	8.1"	8.6"	4.6"

මූලාශ්‍රය :https://weatherspark.com/, 2021

රූපය 2.3 සුළං දිශාව



මූලාශ්‍රය :https://weatherspark.com/, 2021

බත්තරමුල්ල පරිපාලන අග නගරයට මායිම්ව පිහිටා ඇති මහරගම නගර සහා බල ප්‍රදේශය රටෙහි වැදගත් ආයතන රාශියකින් සමන්විතය. ඒවායින් කිහිපයක් ලෙස ජාතික අපේක්ෂා රෝහල, ආයුර්වේද පර්යේෂණායතනය , ශ්‍රී ජයවර්ධනපුර රෝහල, ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය හඳුනා ගත හැක. තවද පමුණුව රෙදිපිළි ආශ්‍රිත වෙළදාම හේතුවෙන් හා රෙදිපිළි ආශ්‍රිත වෙළඳසැල් රාශියක් නගරය පුරා ඉදිව ඇති හෙයින් මෙම ප්‍රදේශය වාණිජ වශයෙන් වඩාත් ආකර්ශනයට ලක්වන නගරයක් බවට පත්ව ඇත. එමෙන්ම නගරයට ආවේනික වූ සංස්කෘතික හා ආර්ථික අනන්‍යතාවයක් සහිතව වර්ධනය වන හෙයින් අනාගතයේදී ප්‍රබල නගරයක් බවට පත්වීමේ හැකියාව මහරගම නගරය සතුව පවතී.

2.2 සැලසුම් හා තත්ත්ව සන්දර්භය

2.2.1 ඓතිහාසික පසුබිම හා විකාශනය

ඉතිහාසයේ කරුණු සඳහන් කරන ආකාරයට මහරගම යනුවෙන් පැරණි නගරයක් නොතිබී ඇති අතර එය ගොඩිගමුව, පන්නිපිටිය හා පමුණුවෙහිම කොටසක් ලෙස පැවත ඇත.මෙම ප්‍රදේශයේ ඇති ඉපැරණි ඉඩම් ඔප්පු කිසිවකත් මහරගම යන්න සඳහන් නොවීම තුලින්ම මේ බව හඳුනාගත හැකිය.

පෘතුගීසි පාලන කාලය තුලදී ද මහරගම නගරයක් ලෙස හඳුනාගෙන නොමැත. එම කාලය තුලදී කෝට්ටේ රාජධානිය හේතුවෙන් කෝට්ටේ බල ප්‍රදේශය නගරයක් ලෙස පැවති බවට සැලකිය හැකිය. (සිතියම අංක 2.2)

සිතියම 2.2 : 1617-1638 පෘතුගීසි යුගය



මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ පෘතුගීසි යුගය, චන්ද්‍ර රිචඩ් ද සිල්වා, 1967

කෝට්ටේ රාජධානියට මායිම්ව පිහිටි මහරගම ප්‍රදේශය තුල පිහිටා ඇති බොරලැස්ගමුව වැව ,ඊයම් පෝරුව ගංගාතිලක විහාරස්ථාන විෂ්ණු දේවාලය, තලවතුගොඩ ගනේලන්ද විහාරස්ථාන විෂ්ණු දේවාලය, දෙපානම ගනේගොඩ පුරාණ දේවාලය ආදී ස්ථාන කෝට්ටේ යුගය හා සම්බන්ධ බවට ජනප්‍රවාදයේ පවතින අතර එම ස්ථානවල පවත්නා සාක්ෂි මගින් එය තහවුරු වේ. එසේම නාවින්න රජමහා විහාරය ,මහරගම ශ්‍රී විපශ්‍යාරාමය , කොට්ටාව ධම්මකිත්තිකාරාම පුරාණ විහාරය ආදී ස්ථාන මහනුවර යුගය හා බැඳි ඓතිහාසික වටිනාකම් පෙන්නුම් කරනු ලැබේ.

රූපය 2.4 : ගනේලන්ද පුරාණ රජමහ විහාරය



මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

රූපය 2.5 : මහරගම ශ්‍රී විපශ්‍යාරාමය

මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

වර්ෂ 1948 කාලය වන විට මහරගම හඳුන්වා ඇත්තේ හික් ගස් හන්දිය යනුවෙන් බවට ජනප්‍රවාදයෙහි පවතී. මහරගම යන ග්‍රාම නාමය නිර්මාණය වීම සම්බන්ධව සැලකීමේදී මෙම ප්‍රදේශයෙහි අතීතයෙහි හොරු සිටි බවත් ඒ අනුව “මහා හොරු ගම” ලෙස හඳුන්වා එය පසුව මහරගම ලෙස ව්‍යවහාර වී ඇති බවත් සඳහන් වේ. (උපුටා ගැනීම : සම්පත් පැතිකඩ, 2019)

පසුකාලීනව මහරගම අශ්‍රිතව විවිධ ආයතන පිහිටවීමත් සමග මෙම ප්‍රදේශය වඩාත් ප්‍රචලිත වී ඇති බව හඳුනා ගත හැක

සිතියම 2.3 : මහා මාර්ග හා ආයතනයන්හි විකාශනය



.සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය., 2021

2.2.2 පූර්ව සැලසුම් ප්‍රයත්න

2.2.2.1 ශ්‍රී ජයවර්ධපුර කෝට්ටේ සැලැස්ම - 1982

මහරගම බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සැලසුම් සැලකීමේදී එහි ඉතිහාසය 1982 වර්ෂයෙහි සකස් කරන ලද ශ්‍රී ජයවර්ධපුර කෝට්ටේ සංවර්ධන සැලැස්ම දක්වා දිවයයි. එවකට පිහිටි කෝට්ටේ මහ නගර සභාව,කොලොන්නාව නගර සභාව, කොට්කාවත්ත ප්‍රාදේශීය සභාව, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ,කඩුවෙල ගම් සභාව ,අතුරුගිරිය ගම් සභාව,මහරගම නගර සභාව හා දෙහිවල ගල්කිස්ස ගම් සභා ප්‍රදේශයන් ආවරණය වන පරිදි හෙක්ටරයාර 4374කින් යුතු ප්‍රදේශයක් අගනුවර ලෙස ස්ථාපිත කරන ලදී.

සිතියම 2.4: ශ්‍රී ජයවර්ධපුර කෝට්ටේ සැලැස්ම, 1982



මූලාශ්‍රය : ශ්‍රී ජයවර්ධපුර කෝට්ටේ සංවර්ධන සැලැස්ම,1982

2.2.2.2 කොළඹ මහා නාගරික කලාපීය ව්‍යුහාත්මක සැලැස්ම (CMRSP)

1996 වර්ෂයෙහි සකස් කරන ලද කොළඹ මහා නාගරික කලාපීය ව්‍යුහාත්මක සැලැස්ම (CMRSP) පරිදි නාගරික ධුරාවලියක් හඳුන්වා දී ඇති අතර එය කොළඹ - විසල් කෝට්ටේ (හර ප්‍රදේශය) සඳහා සවිස්තර සැලැස්මක් සහිතව ඉදිරිපත් කර ඇත .මෙහි හර ප්‍රදේශය තුලට මහරගම බල ප්‍රදේශයද ඇතුලත් වන අන්දමින් සැලැස්ම සකස් කර ඇත.මෙම සැලැස්ම මගින් පරිපාලන ආයතන ප්‍රසාරණය,කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් හා මනා සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමට යෝජිත විය.

වර්තමානය වන විට ආයතන 99 ක් වැනි ප්‍රමාණයක් පවතින අග නගරය ආශ්‍රිත ප්‍රදේශය තුල තවදුරටත් ආයතන ප්‍රතිස්ථාපනය කිරීමට යෝජිත බැවින් ඒ සදහා අවශ්‍ය වන පාරිසරික,සමාජීය, හා භෞතික කළමනාකරණයන් සිදු කිරීමටත් අවශ්‍ය සේවා පහසුකම් සැපයීමටත් මහරගම ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව මෙම සැලැස්ම මගින් හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙම සැලැස්ම ශ්‍රී ජයවර්ධපුර කෝට්ටේ සැලැස්මට වඩා පුළුල් ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට බලපෑමක් ඇති කර ඇති බව පෙනී යයි.

සිතියම 2.5 : මහා කොළඹ නාගරික පුරවර ව්‍යුහ සැලැස්ම



මුලාශ්‍රය : මහ කොළඹ නාගරික පුරවර ව්‍යුහ සැලැස්ම, 1998

2.2.2.3 කොළඹ නගර සංවර්ධන සැලැස්ම

අනතුරුව 1999 වර්ෂයෙහි සකස් කරන ලද කොළඹ නගර සංවර්ධන සැලැස්ම යටතේ කොළඹ නගරය දකුණු ආසියානු කලාපයේ මූල්‍ය හා වාණිජ නගරය ලෙස සංවර්ධනය කිරීම අරමුණු කරන ලද අතර තදාසන්න නගර වන මහරගම,බත්තරමුල්ල , පැලවත්ත,මුල්ලේරියාව වැනි ප්‍රදේශයන්හි පරිපාලනමය හා ඊට අනුබද්ධිත ආයතන පිහිටවීමට සැලසුම් කරන ලදී.

සිතියම 2.6 කොළඹ නගර සංවර්ධන සැලැස්ම,1999



මූලාශ්‍රය : හර ප්‍රදේශ සැලැස්ම 1999

2.2.2.4 බස්නාහිර පළාත් මහානගර පුරවර සැලැස්ම (CESMA)

2004 වර්ෂයෙහි පිලියෙල කරන ලද බස්නාහිර පළාත් මහානගර පුරවර සැලැස්ම මගින් බස්නාහිර පළාත හා කොළඹ නගරය අන්තර්ජාතික වශයෙන් ආකර්ශනිය නගරයක් බවට පත් කිරීමටත් නව සංවර්ධන අවස්ථාවන් , විනෝදාස්වාදය සපයන ප්‍රදේශයන්, සාප්පු සංකීර්ණයන් සහිත ප්‍රදේශවලින් සමන්විත ව්‍යාපාරික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කොට තිබුණි.

මෙම සැලැස්මෙහි දැක්ම වුයේ “අපේක්ෂාවේ ක්ෂේම භූමිය ,උරුමය,විනෝදය හා ඉසුරුමත් ජීවන රටාව” යන්නයි. මෙමගින් සංවර්ධනය විමධ්‍යගත කිරීමේ අරමුණ සහිතව කොළඹ, හර ප්‍රදේශය ලෙස තව දුරටත් පවත්වාගනිමින් සංවර්ධනය උතුරු, නැගෙනහිර හා දකුණු දිශාවන්ට යොමු කිරීමට සැලසුම් සකස් කරන ලදී.එසේම විවිධ කලාප වෙන් කරමින් හරිත ජාලයක් සහිතව “හරිත ඇඟිලි සංකල්පය” මත පදනම්ව උද්‍යාන නගරයක් ලෙස සංවර්ධනය කිරීමත් ජනතාව ඔවුන්ගේ රැකියා ආශ්‍රිත ප්‍රදේශයන්හි ජීවත් වීම සඳහා “රැකියා ස්ථානය ජීවනය (A Live –Work-Plan) යන සංකල්පය මත ජන ජීවිතයේ ගුණාත්මක භාවය සංවර්ධනය කිරීමත් මෙම සැලසුමෙහි අරමුණ විය.

සිතියම 2.7 : බස්නාහිර පළාත් මහානගර පුරවර සැලැස්ම, 2004

මූලාශ්‍රය : මෙගාපොලිස් සැලැස්ම ,2004

2.2.2.5 මහරගම සංවර්ධන සැලැස්ම 2008-2020

සිතියම 2.8: කලාප සැලැස්ම මහරගම නගර සභා ප්‍රදේශය 2008-2020



මූලාශ්‍රය : මහරගම සංවර්ධන සැලැස්ම 2008-2020, නාගරික සංවර්ධන අධිකාරිය

අර්ධ නාගරික සංවර්ධන ලක්‍ෂණයන් වර්ධනය වෙමින් පවතින මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා 2008-2020 කාලය සදහා මහරගම සංවර්ධන සැලැස්ම පිළියෙළ කරන ලදී. නේවාසික සංවර්ධනය මුල් කරගනිමින් හා මහරගම,කොට්ටාව,හා තලවතුගොඩ නගර ආශ්‍රිතව වාණිජ සංවර්ධනය පදනම් කරගනිමින් සංවර්ධනය කිරීමට මෙම සැලැස්ම තුළින් අවකාශය සලසා ඇත. ප්‍රදේශයේ ගොඩනැගිලි හා සංවර්ධන කටයුතු බලාත්මක කරනු ලබන්නේ මෙම සැලැස්ම මගිනි.

2.2.2.6 බස්නාහිර පළාත් මහනගර සැලැස්ම

2016 වර්ෂයේ සකස් කරන ලද බස්නාහිර පළාත් මහනගර සැලැස්ම යටතේ ශ්‍රී ලංකාව ඉහළ අදායම් සහිත සංවර්ධිත රටක් බවට පත් කර ගැනීමේ අරමුණින් “ආර්ථික වර්ධනය හා සෞභාග්‍ය” ,”සමාජ සමානත්වය”, ”ප්‍රවේශය හා ආරක්ෂාව”, “පාරිසරික තිරසාර භාවය හා පුද්ගල සන්තුෂ්ටිය” යන ප්‍රධාන දර්ශනයන් හතර ඔස්සේ යමින් මෙම සැලැස්ම සකස් කර ඇත.

තවද ,මෙම සැලැස්ම මගින් මහරගම අතරමැදි සංවර්ධන කලාපය තුල පිහිටි නගරය ලෙස හඳුන්වා දී ඇත.

මේ අනුව විවිධ කාලයන් තුලදී මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීම තුලින් භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික වශයෙන් මහරගම ප්‍රදේශයෙහි සංවර්ධනය සඳහා බලපෑමක් ඇති කරන ලදී.

සිතියම 2.9: බස්නාහිර පළාත් මහනගර සැලැස්ම, 2016



මූලාශ්‍රය : බස්නාහිර පළාත් මහනගර සැලැස්ම, 2016

2.2.3. මහරගම සංවර්ධන සැලැස්ම 2022 – 2031 සඳහා අදාළ වන ජාතික ප්‍රතිපත්ති

වර්තමාන රජයේ රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව එහි එන දස වැදෑරුම් ප්‍රතිපත්තින්හි සිවුවන ප්‍රතිපත්තියෙහි ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන සමාජයක් යටතේ ඉදිරිපත්කර ඇති නිරෝගිකමට මුල්තැන සහ සෑම පවුලකටම නිවාසයක් යන කරුණුද , පස්වන ප්‍රතිපත්තිය වන ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ද, හත්වැනි ප්‍රතිපත්තිය වන භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය සහ අටවන ප්‍රතිපත්තිය යටතේ තිරසාර පරිසර ප්‍රතිපත්තියක් යන ප්‍රතිපත්තීන් වලට වඩාත් අවධානය යොමු කරමින් සංවර්ධන සැලැස්මේ දිශානතිය සකස් කොට ඇත.

රූපය 2.6 ෘ මහරගම සංවර්ධන සැලැස්ම 2022 – 2031 සඳහා අදාළ වන ජාතික ප්‍රතිපත්ති

සිව්වන කොටස

ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

අපට ඇති වටිනාම සම්පත වනුයේ මානව සම්පත යි. එම මානව සම්පත සංවර්ධනය කළ හැක්කේ නිරෝගී සහ ඵලදායී පුද්ගලයෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් යන සංකල්පය මත පදනම් වූ දැනුම් කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැඟීමෙන් බව අපේ පිළිගැනීම ය. සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟීමේ මූලික අඩිතාලම වන්නේ ද එය යි. එම නිසා මානව සම්පත සංවර්ධනය කිරීම අපගේ රජයේ මූලික වගකීම යි.

ප්‍රඥාසම්පන්න පුරවැසියෙක් : දැනුමෙන් පිරිපුන් සමාජයක්

රටේ අනාගත පරපුර ඵලදායී පුරවැසියන් බවට පත් කිරීමට නම් ඔවුන් නව දැනුමෙන් පෝෂණය කිරීම, ඔවුන්ගේ කුසලතා ඔප්නැංවීම සහ නිපුණතා සංවර්ධනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. තරුණ තරුණියන්ට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතරමං වීමට සිදු නොවන පරිදි පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත. ඒ තුළ තාක්ෂණික අධ්‍යාපන අවස්ථා ප්‍රසාරණය කිරීම මෙන් ම අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තාක්ෂණය භාවිතය පුළුල් කිරීමටත් අප බලාපොරොත්තු වේ.

මව් තුරුලෙන් ගුරුමව් සෙවණට

පෙර පාසල, දිවාසුරැකුම් මධ්‍යස්ථානය හෝ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය යනුවෙන් හැඳින්වෙන ආයතන පද්ධතිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතාමත් වැදගත් කලාපයක් ලෙස අප හඳුනාගෙන තිබේ.

නිරෝගීකමට මුල් තැන

මානව ප්‍රාග්ධන සංවර්ධනයේ දී වැදගත්වන අනෙක් ප්‍රධාන කුලුන සෞඛ්‍ය අංශය වේ. නිරෝගී සෞඛ්‍යය හේතුවෙන් කායික, මානසික, සමාජයීය සුවතාව පමණක් නොව අධ්‍යාත්මික සුවතාව ද වර්ධනය වන නිසා නිවැරැදි ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මත පදනම් ව ජාතික සහ ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන තිරසාර සෞඛ්‍ය වැඩපිළිවෙළක් ඇති කරනු ලැබේ.

අටවන කොටස

තිරසාර පරිසර ප්‍රතිපත්තියක්

ජෛව ගෝලය කෘතිම වෙනස් කිරීමකට හෝ බලපෑමකට ලක් කිරීමෙන් පරිසරයේ සමබරතාවය බිඳවැටීම සැලකෙන්නේ පරිසර දූෂණයක් ලෙස ය. වර්තමානයේ සිදුවන බොහෝ මනුෂ්‍ය ක්‍රියාකාරකම් නිසා පරිසර පද්ධතියට සිදුවන විනාශය අති විශාල ය. එම නිසා අනාගත පරපුරට සුරක්ෂිත පරිසර පද්ධතියක් තුළ ජීවත්වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමේ වගකීම අපහට පැවරී තිබේ. තිරසාර පරිසර ප්‍රතිපත්තියක් යනු පරිසර සංරක්ෂණය පමණක් නොව සමබර වූ සමාජ, ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීම ය.

භූමිය

ශ්‍රී ලංකාවේ භූමිය භාවිතා කළ යුත්තේ ජනතාවගේ යහ පැවැත්ම සඳහා ය. මිනිසාට මෙන්ම අනෙක් සත්ත්වයින්ට භූමියට ඇති අයිතිය සුරක්ෂිත කරන භාරකාරයෙකු ලෙස රජය ක්‍රියා කළ යුතු ය. එලෙසටම තමන් වෙනුවෙන් හඬක් නැඟිය නොහැකි කොටස්, එනම් සත්ත්වයින් හා අනාගතයේ ඉපදීමට සිටින අනාගත පරම්පරාව සඳහා භූමිය ආරක්ෂා කරන භාරකාරයින් ලෙසට රජය ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා මූලිකවම ජාතික භෞතික සැලැස්මක් (National Physical Plan) යාවත්කාලීන කළ යුතු ය. පරිසර විද්‍යානුකූලව සකසන ලද කෘෂිකර්මය, සත්ව පාලනය හා වැවිලි කර්මාන්ත මගින් පරිසර විනාශය අවම කර ආර්ථික වාසි ලබාගත යුතු ය.

කර්මාන්ත

කාර්මික ක්ෂේත්‍රයේ දැනට සිදුවන අමුද්‍රව්‍ය භාවිත කර භාණ්ඩ නිෂ්පාදනය කර අපද්‍රව්‍ය පරිසරයට බැහැර කරන රේඛීය ආර්ථික ක්‍රමය (Liner Economy) වෙනුවට එක් කර්මාන්තයක අපද්‍රව්‍ය, අනෙක් කර්මාන්තයන්හි අමුද්‍රව්‍ය ලෙස යොදාගත හැකි චක්‍ර / චක්‍රීය ආර්ථික (Circular Economy) ක්‍රම වේදයක් ගොඩ නැගීමට පියවර ගනු ලැබේ. (Re-use, Re-cycle, Re-purpose). එමගින් පරිසර හිතකාමී කාර්මික කලාපී (Eco Industrial Zones) ඔස්සේ කොට හරිත ආර්ථිකයකට (Green Economy) මග විවෘත කෙරේ.

කසල කළමනාකරණය

සෑම ආකාරයකම අපද්‍රව්‍ය මිනිසාගේ නිර්මාණයක් බව හඳුනා ගෙන අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම සඳහා ජනතාව පෙළඹවීම අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ පළමු පියවර ලෙසට හඳුනා ගත යුතු ය. එහිදී අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම හා අපද්‍රව්‍ය නිෂ්පාදනය කරන ප්‍රමාණය අවම කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම ක්‍රමෝපායන් යෙදිය යුතු අතර කුඩා කළ සිටම තිරසාර පරිභෝජන සංකල්ප හඳුන්වා දීමට කටයුතු යොදනු ලැබේ.

ජෛව විවිධත්වය

භූමි පරිභෝජන ප්‍රතිපත්ති හා ජල කළමණාකරන ප්‍රතිපත්ති වල තිරසාර බව තහවුරු කරන අතරතුරම ජාතික වන වැස්ම (Forest Cover) 30% දක්වා ඉහළ දැමීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ සඳහා හඳුනා ගැනීමට නිශ්චිත ක්‍රියාමාර්ග ගනු ලැබේ. කිරීමට සුදුසු පරිසර තිබියාකාරව ඒ සඳහා යළි වන වගාවන් සිදු කිරීමට සුදුසු පරිසර නිසියාකාරව හඳුනා ගැනීමට නිශ්චිත ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ජනාවාස හා නගර

ජනාවාස ඉදි කිරීමේදී මූලිකවම පරිසරයට අවම බාධාවක් සිදු වෙන ආකාරයට ස්ථාන තෝරා ගන්නා අතර දැනටමත් හඳුනාගෙන තිබෙන අවධානමට ලක්වී ඇති සංවේදී පරිසර කලාපවල කිසිදු ආකාරයක අවිචාරවත් සංවර්ධනයක් සිදු නොකිරීමට පියවර ගැනේ.

පාරිසරික අධ්‍යාපනය

වන සංරක්ෂණය ජල සංරක්ෂණය පාංශු සංරක්ෂණය වෙරළ සංරක්ෂණය කසළ කළමනාකරණ බලශක්ති කළමනාකරණය ගැඹුරු කළමනාකරණය වැනි පාරිසරික වගකීම් පිළිබඳ ජනතාවගේ දැනුවත් භාවය වර්ධනය කොට එහිලා ජනතා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කෙරේ.

මූලාශ්‍රය ෘ රට හදන සෞභාග්‍යයේ දැක්ම, 2019

2.2.4 මහරගම බල ප්‍රදේශයෙහි භෞතික පසුබිම

(අ) භූමි පරිභෝජනය

මහරගම නගර සභා බල ප්‍රදේශයෙහි මුළු භූමියෙන් 60% වැඩි ප්‍රමාණයක් නේවාසික භාවිතය සඳහාත්, 15% ක ප්‍රමාණයක් ගෙවතු හා වී වගාව සඳහාත් භාවිත වී ඇති බව පෙනී යයි.තවද මුළු භූමියෙන් 2.68 % පමණ ප්‍රමාණයක් වගුරු බිම් හා ජල ප්‍රදේශයන් වේ.එසේම මුළු බිම් ප්‍රමාණයෙන් 13.15% පමණ ප්‍රමාණයක් වාණිජ හා වෙනත් ගොඩනැගිලි සඳහා වෙන්වී ඇත.

වගුව 2.1 : භූමි පරිහරණය- මහරගම, 2019

භාවිතය	භූමි ප්‍රමාණය (හෙක්)	%
නේවාසික	2446.3	60.53%
වාණිජ	126.81	3.35%
ආගමික	42.25	1.10%
වෙනත් (කාර්යාල, සෞඛ්‍ය, ආයතන, අධ්‍යාපන ආදී)	373.44	9.80%
මාර්ග	202.15	5.30%
වී වගාව	473.99	12.52%
වෙනත් වගාවන්	148.03	3.90%
වගුරු බිම්	67.39	1.70%
ජල ප්‍රදේශයන්	37.19	0.98%
පොදු ප්‍රදේශ (ක්‍රීඩා පිටි, විවෘත ප්‍රදේශ)	22.44	0.59%
එකතුව	3940.0	100%

මූලාශ්‍රය : මහරගම සම්පත් පැතිකඩ, 2019

රූපය 2. 7 : භූමි පරිභෝජනය, මහරගම



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 2.10 : භූමි පරිහරණ රටාව,මහරගම



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය,2021

නේවාසික භූමි පරිභෝජනය සලකා බලන විට ගංගොඩවිල, ගොඩිගමුව, මිරිහාන, මාදිවෙල, නාවින්න, දෙපානම, වත්තේගෙදර, ආදී ප්‍රදේශයන්හි නේවාසික භාවිතය සඳහා වැඩි ඉල්ලුමක් දැකිය හැක. 2002 වර්ෂයේ පැවති භූමි පරිභෝජනය අනුව සාපේක්ෂව පවතින පොල්,රබර් ඉඩම් කැබලි කිරීම හා කුඹුරු ඉඩම් ගොඩ කිරීම වර්තමානය වන විට බහුලව දැකිය හැක.

වාණිජ භාවිතය සලකා බලන විට මහරගම,කොට්ටාව හා තලවතුගොඩ මංසන්ධි ආශ්‍රිතව වැඩි වශයෙන් වාණිජ කටයුතු සඳහා ආකර්ශනයක් ඇති බව පෙනී යයි.එසේම මෙම සංවර්ධනයන් ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වූ රේඛීය සංවර්ධනයක් ලෙස ව්‍යාප්ත වන බවද පෙනී යන කරුණකි.එසේම සේවා පහසුකම් සපයන ස්ථාන තලවතුගොඩ හා පන්නිපිටිය ආශ්‍රිතව ව්‍යාප්ත වන බව දක්නට ලැබේ. තවද, මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදි කිරීමත් සමග කොට්ටාව සිට මාකුඹුර දක්වා වූ ප්‍රදේශයද සීඝ්‍රයෙන් සංවර්ධනය වන ලක්ෂණ පෙන්නුම් කරයි.

(ආ) මහා මාර්ග පද්ධතිය

මහරගම නගරය හරහා දෙහිවල, බොරලැස්ගමුව, පිළියන්දල ,අතුරුගිරිය, මාලඹේ, හෝමාගම ආදී ප්‍රදේශයන් සඳහා මාර්ග ජාලය සම්බන්ධව පවති, හයිලෙවල් A 4 මාර්ගය ඔස්සේ බස්නාහිර,සබරගමුව හා ඌව පළාත යා කෙරේ.තවද ,කැළණි වැලි දුම්රිය මාර්ගය මරදාන සිට අවිස්සාවේල්ල දක්වා මහරගම නගරය හරහා දිවෙයි. එසේම දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ දකුණු පළාතද, පිටත වටරවුම් මාර්ගය හරහා ගම්පහ ප්‍රදේශයද සම්බන්ධ කෙරෙන අතර ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වන මාකුඹුර ඔස්සේ රටෙහි විවිධ ප්‍රදේශයන් කරා ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත

සිතියම 2.11: මාර්ග පද්ධතිය ,මහරගම



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 2.12 : ජාතික සම්බන්ධතාවය



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 2.13 : කලාපීය සම්බන්ධතාවය



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය,2021

ජාතික සම්බන්ධතාවය



කලාපීය සම්බන්ධතාවය



2.2.5 මහරගම බල ප්‍රදේශයෙහි සමාජයීය පසුබිම

(අ) ජනගහනය

මහරගම නගර සභා බල ප්‍රදේශයේ ජනගහනය සලකා බැලීමේදී එය කොළඹ දිස්ත්‍රික්කයෙහි සයවන ස්ථානයෙහි පසු වේ. දළ ජනගහන ඝනත්වය වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 5381ක ප්‍රමාණයක් වේ.

රූපය 2.8 : කොළඹ දිස්ත්‍රික්කයෙහි ජනගහන ව්‍යාප්තිය



	කොළඹ	කඩුවෙල	කැස්බෑව	තිඹිරිගස්යාය	හෝමාගම	මහරගම	කොලොන්නාව	මොරටුව	සීතාවක	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	රත්මලාන	දෙහිවල	පාදුක්ක
2012	323,257	252,041	245,232	238,057	237,905	196,423	191,687	168,280	113,807	107,925	95,506	88,962	65,267
2001	380,946	209,251	209,619	266,154	186,050	185,193	161,247	177,563	94,001	116,366	108,716	101,830	54,338

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

එසේම 2001 -2012 වර්ෂය තුල 0.53% ක ජනගහන වර්ධනයක් හා 2012-2019 කාලය තුල 0.75% ජනගහන වර්ධනයක් මහරගම බල ප්‍රදේශය තුල පෙන්නුම් කෙරේ.

වගුව 2.2 : ජනගහන වර්ධනය, මහරගම

2001 වර්ෂයෙහි මුළු නේවාසික ජනගහනය	2012 වර්ෂයෙහි මුළු නේවාසික ජනගහනය	ජනගහන වර්ධන වේගය 2001-2012	2019 වර්ෂයෙහි මුළු නේවාසික ජනගහනය	ජනගහන වර්ධන වේගය 2012-2019	2031 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද නේවාසික ජනගහනය
185,193	196,423	0.53%	212,014	0.75%	235,650

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ 2019, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.2012

මහරගම නගර සහා බල ප්‍රදේශය තුල ජනගහන වර්ධනය සැලකීමේදී, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන 2001 සහ 2012 වාර්තාවන්ට අනුව සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් වාර්ෂිකව නිකුත් කරනු ලබන 2014, 2016 සහ 2019 යන වර්ෂ වල සම්පත් පැතිකඩ වාර්තාවට අනුව, 532/සී වත්තේගෙදර ග්‍රාම නිලධාරී වසම තුල ඉහල ජනගහනයක් දක්නට ලැබේ. එනම්, පුද්ගලයන් 8782 ක් තරම් වූ ඉහල අගයකි.

මහරගම නගර සහා බල ප්‍රදේශයෙහි ස්ත්‍රී -පුරුෂ සංයුතිය සලකා බලන විට 47% ක් පුරුෂ වන අතර 53% ක ප්‍රමාණයක් ස්ත්‍රී ප්‍රතිශතය වේ. වයස් ව්‍යුහය අනුව ගත් කළ, වයස අවුරුදු 5ට අඩු පුරුෂ හා ස්ත්‍රී ළදරු ජනගහනය පිළිවෙලින් 7,230 ක් හා 8,516 ක් ලෙස ත්, වයස අවුරුදු 6ත් 18 ත් අතර පුරුෂ හා ස්ත්‍රී ළමා ජනගහනය පිළිවෙලින් 25,950 ක් හා 27,961ක් ලෙසත්, වයස අවුරුදු 19ත් 60ත් අතර වූ ශ්‍රම බලකාය පුරුෂ හා ස්ත්‍රී පිළිවෙලින් 51,370ක් හා 57,874 ක් ලෙසත් වයස අවුරුදු 60 ට වැඩි පුරුෂ හා ස්ත්‍රී ජ්‍යේෂ්ඨ ජනගහනය පිළිවෙලින් 17,638 ක් හා 23,730 ක් ලෙසත් ගණන් බලා ඇත. ඒ අනුව ශ්‍රම බලකාය සලකා බලන විට (වයස අවුරුදු 19-60 අතර) එය සමස්ත ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස 49% ක් වේ . ශ්‍රම බලකාය ඉහල අගයක් ගැනීම තුලින් මෙම ප්‍රදේශයෙහි ආර්ථිකය සඳහා සාධනීය දායකත්වයක් ලබා ගත හැකි බව පෙනී යයි.

රූපය 2.9 : වයස් ව්‍යුහය අනුව ජනගහනය



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ,2019

මහරගම බල ප්‍රදේශය තුල ප්‍රධාන ජන වාර්ගික කණ්ඩායම සිංහල -බෞද්ධ වන අතර අනෙකුත් ජාතින් සුළු වශයෙන් ව්‍යාප්තව සිටී.

රූපය 2.10 : ජනවාර්ගික ව්‍යාප්තිය අනුව ජනගහනය



මුළු ජනගහනය	211,443
202,579 සිංහල	95.81%
2,986 දෙමළ	1.41%
3,809 මුස්ලිම්	1.80%
1,518 බර්ගර්	0.72%
390 මැලේ	0.18%
161 වෙනත්	0.08%

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ,2019

2.2.6 මහරගම බල ප්‍රදේශයෙහි ආර්ථික පසුබිම

මහරගම නගර සභා බල ප්‍රදේශයෙහි ආර්ථික පසුබිම ගත් කල ප්‍රධාන වශයෙන් රාජ්‍ය ,අර්ධ රාජ්‍ය,පෞද්ගලික ,කෘෂිකාර්මික ,කාර්මික අංශ,ස්වයං රැකියා, ආදී ලෙස රැකියාවන්හි නිරත වන පිරිස හඳුනා ගත හැක. මහරගම සඳහාම අවේනික වූ විශේෂිත ආර්ථික කර්මාන්තය ලෙස රෙදිපිළි වෙළඳාම හඳුනා ගත හැකිය. එසේම ප්‍රදේශය පුරා විවිධ සුළු පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ කර්මාන්ත ව්‍යාප්තව ඇත.

රැකියා අංශයේ වර්ගීකරණය තුළින්, ජනතාවගේ ආර්ථික තත්වය පිළිබඳ තොරතුරු සපයයි. ඒ අනුව, 2019 වර්ෂයෙහි සම්පත් පැතිකඩ පරිදි විවිධ අංශයන්හි රැකියාවෙහි නියුතු ප්‍රමාණය පහත පරිදි වේ. මේ අනුව වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශයෙහි රැකියාවෙහි නියුතු වන බව හඳුනා ගත හැක. තවද ප්‍රදේශයෙහි ආර්ථිකය සඳහා ස්ත්‍රී දායකත්වයද ඉතා ඉහල අගයක් ගන්න බව වගු අංක 2.3 තුලින් දැක ගත හැකිය.

වගුව 2.3 : සේවා නියුක්තිය ,මහරගම

අංශය	ස්ත්‍රී	පුරුෂ	එකතුව	ප්‍රතිශතය(%)
රාජ්‍ය අංශය	7231	6820	14051	12.62%
අර්ධ රාජ්‍ය අංශය	4272	5004	9276	8.3%
පෞද්ගලික අංශය	20345	24014	44359	39%
කෘෂිකාර්මික අංශය	361	874	1235	1.1%
කාර්මික අංශය	1029	3439	4468	4%
සේවා අංශය	3580	4263	7843	7.4%
ස්වයං රැකියා	6911	4685	11596	10.4%
කුලී වැඩ	791	2166	2957	2.6%
විදේශ රැකියා	1020	1591	2611	2.3%
අර්ධ කාලීන රැකියා	1276	1293	2569	2.3%
රැකියාවක් නොමැති	6208	4156	10364	9.3%

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ,2019

රූපය 2.11: සේවා නියුක්තිය



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2019

මහරගම නගර සභා බල ප්‍රදේශයෙහි 2019 වර්ෂයේ සංඛ්‍යාලේඛන පරිදි මාසික අදායම් මට්ටම් අනුව පවුල් සංඛ්‍යාව පහත පරිදි හඳුනා ගත හැකිය. ඒ අනුව රු.3000 ට අඩු මාසික අදායමක් ලබන ප්‍රමාණය 1% ක ප්‍රතිශතයක් වන අතර බහුතරය රු.20000-25000 ත් අතර හා රු.25000 ට ඉහල මාසික අදායමක් ලබන පිරිසක් වේ. එය ප්‍රදේශයෙහි ආර්ථික මට්ටම ඉහල මට්ටමක පවතින බවට සාධක පෙන්වයි.

රූපය 2.12: මාසික අදායම් මට්ටම අනුව පවුල් ප්‍රමාණය



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ,2019

අතීතයේ සිටම රෙදි පිළි කර්මාන්තය සඳහා වන වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පමුණුව ප්‍රසිද්ධියක් උසුලනු ලබයි. මේ හේතුවෙන් මහරගම නගරය සඳහා වැඩි ජනතා ආකර්ශනයක් ලැබී ඇත. වර්තමානය වන විට රෙදි පිළි සම්බන්ධ විශාල ගොඩනැගිලි රාශියක් නගරය පුරා ව්‍යාප්තව ඇති අතර, එය මහරගම නගරයෙහි සුවිශේෂී ආර්ථික අංගයක් බවට පත්ව ඇත. රෙදි පිළි කර්මාන්තය නගරයේ බහුතරයකගේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට ද පත්ව ඇත. රූපය 2.13: කර්මාන්ත ව්‍යාප්තිය

රූපය 2.13: කර්මාන්ත ව්‍යාප්තිය



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ,2019

2.2.7 මහරගම බල ප්‍රදේශයෙහි සේවා හා යටිතල පහසුකම් පසුබිම

සේවා හා යටිතල පහසුකම් පිළිබඳ සලකා බලන විට මහරගම නගර සභා බල ප්‍රදේශය තුල ස්ථිර හා අර්ධ ස්ථිර නිවාස වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර පැල්පත් නිවාස වැඩි ප්‍රමාණයක් මහරගම නගරය, උඩහමුල්ල, කොට්ටාව, නාවින්න හා මිරිහාන ප්‍රදේශය අශ්‍රිතව ව්‍යාප්තව ඇත.

රූපය 2.14 :නිවාස වර්ගීකරණය



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ,2019

ඒ අනුව, බහුලවම අර්ධ ස්ථිර නිවාස තලපත්පිටිය ප්‍රදේශය තුළ පවතින අතර එය ගණනින් 700 ක් තරම් ඉහළ අගයක් ගනී. මීට අමතරව, කොට්ටාව නගරය හා මිරිහාන උතුර යන ප්‍රදේශයන් තුළ ද යම් ඉහල අගයකින් යුතු අර්ධ ස්ථිර නිවාස තිබෙනු දක්නට හැකිය. එමෙන්ම, කුලී නිවාසයන් තුළ ජීවත් වන්නන් බහුතරයක් වත්තේගෙදර ප්‍රදේශය, කොට්ටාව දකුණ, තලවතුගොඩ බටහිර, ගොඩිගමුව දකුණ යන ප්‍රදේශයන් තුල දක්නට ලැබේ. එමෙන්ම පිලිවෙලින් මහරගම නගරය හා පන්නිපිටිය උතුර යන ප්‍රදේශයන් වල ද අනවසර නිවාස දැකිය හැකි වීම කැපී පෙනේ. ජම්බුගස්මුල්ල, කොට්ටාව දකුණ, මහරගම නගරය මහල් නිවාස බහුල ප්‍රදේශයන් ලෙස හඳුනාගත හැක.

රුක්මලේ බටහිර ප්‍රදේශය තුළ රජයේ ඉඩම් 7ක් ද, තලවතුගොඩ බටහිර ප්‍රදේශය තුළ රජයේ ඉඩම් 6ක් ද, රුක්මලේ නැගෙනහිර රජයේ ඉඩම් 5ක් ද, ලෙස මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ 47 ක්වූ මුළු රජයේ ඉඩම් සංඛ්‍යාවක් දැකිය හැක. මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ මේ වන විටත් බහුල වශයෙන් දක්නට ලැබෙන තෙත් බිම් ගොඩ කිරීම් ඇතුළුව අනවසර ඉදි කිරීම් මුළු ගනණින් 244 කි. එය ද වැඩි වශයෙන් දැකිය හැකි වන්නේ නාවින්න සහ මිරිහාන උතුර වැනි ප්‍රදේශයන් වල වීම විශේෂත්වයකි.

රූපය 2.15 අනවසර ඉදිකිරීම්, මහරගම



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2019

මහරගම නගර සභා බල ප්‍රදේශය තුල 2019 වර්ෂයේදී 47359 (98.8%) ක් ජල මුද්‍රිත වැසිකිලි සහිත හා 428 (0.9%) ක් වල වැසිකිලි සහිත (99.7%) නිවාසයන්ගෙන් යුක්ත බව හඳුනාගෙන ඇත. ප්‍රධාන නගර ඇතුළුව නගර සභා බල ප්‍රදේශය තුළ පවතින පොදු වැසිකිලි සංඛ්‍යාව 233 ක් වේ. එමෙන්ම නිවාස 112 (0.3%) ක වාසය කරන්නන් හට වැසිකිලි නොමැති කම හේතුවෙන් සනීපාරක්ෂක ගැටළු වලට මුහුණ පා තිබේ.

වගුව 2.4: සනීපාරක්ෂ පහසුකම්

සනීපාරක්ෂක පහසුකම් ඇති නිවාස			
වැසිකිලි සහිත		පොදු වැසිකිලි සංඛ්‍යාව	වැසිකිලි නැති නිවාස
ජල මුද්‍රිත	වල වැසිකිලි		
47359	428	233	112

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2019

එමෙන්ම මෙම නගර සභා බල ප්‍රදේශය තුළ පවතින මුළු නිවාස ඒකක ගණනින් 50158 ක් වූ ප්‍රමාණයක් සඳහා විදුලි බල පහසුකම පවතින අතර, 112 ක් වූ සුළු පිරිසකට විදුලිබල පහසුකම් නොමැත.

මහරගම ප්‍රදේශයෙහි වැඩි ප්‍රතිශතයක් නල ජලය ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය ලෙස භාවිත කරන අතර ප්‍රජා ජල ව්‍යාපෘති,නල ළිං, පොදු ළිං හා ජල යෝජනා ක්‍රම භාවිත කරන පිරිස අවම ප්‍රමාණයක් වේ. කලටුවාව ජල පවිත්‍රාගාරය මගින් පිරිපහදු කරනු ලබන ජලය ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් බෙදා හැරීම සිදු කරනු ලබයි.

විදුලි සම්බන්ධතාව, දුරකථන පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ආදී යටිතල පහසුකම්ද ඉතා සුළු පිරිසකට හැර සියලු නිවාස සඳහා ඇත. (සම්පත් පැතිකඩ, 2019)

සිතියම 2.14 : පවත්නා ජල සම්බන්ධතාවය,මහරගම



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනයක් ජීවත් වන මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය සේවා පහසුකම් හා මූලික සෞඛ්‍ය සේවාවන් එම මට්ටමින් පවත්වාගෙන යාම සඳහා නාවින්න ආයුර්වේද රෝහල, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, අපේක්ෂා රෝහල, ජාතික දන්ත වෛද්‍ය ආයතනය සහ මහරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් මෙහෙයවන සායන මධ්‍යස්ථානයන්ද ග්‍රාම නිලධාරී වසම් කිහිපයක මෙහෙයවන සායන මධ්‍යස්ථානයන්ද ,පෞද්ගලික බෙහෙත් ශාලා කිහිපයක්ද කොට්ඨාසය තුළ පිහිටා ඇත. මහරගම ප්‍රදේශයට ආසන්නව කළුබෝවිල රෝහල සහ කිලෝ මීටර් 15ක් දුරින් කොළඹ ජාතික රෝහල ද පිහිටා ඇත.

සිතියම 2.15: සෞඛ්‍ය පහසුකම්හි ව්‍යාප්තිය



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය,2021

මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ ඉහල අධ්‍යාපන සේවාවක් පවතින බව දක්නට හැකි වේ. මෙම කොට්ඨාසය තුළ ක්‍රියාත්මක ලියාපදිංචි පෙර පාසල් ගණන 99 ක් වන අතර, 2020 ජනවාරි වන විට නව ලියාපදිංචිය සඳහා යොමු කර ඇති සංඛ්‍යාව 23 කි. නගර සභා බල ප්‍රදේශය තුළ රජයේ පාසල් 24ක් ඇති අතර, මේ වන විට පාසල් අධ්‍යාපනය සම්බන්ධව පහත දක්වා ඇති පරිදි ගැටළු තත්ත්වයන් අධීක්ෂණය කළ හැකිය.

- කොළඹ නගරයට ආසන්නව පිහිටීම හේතුවෙන් ශිෂ්‍යත්ව විභාගයෙන් හා සාමාන්‍ය පෙළ විභාගයෙන් උසස් ලෙස සමත්වන සියළුම සිසුන් කොළඹ පාසල් වලට අස් වී යාම.

- ශිෂ්‍යත්වය පදනම් කර ගනිමින් හා පළමු ශ්‍රේණිය සඳහා පාසල් කිහිපයකට පමණක් පවතින තියුණු තරඟය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතැම් පාසල් වලට ඇතුල් වන සිසුන් සංඛ්‍යාව අඩු වීම.

කෙසේ වෙතත් ශ්‍රේණි අනුව ගත් කල, ජාතික මට්ටමේ ඇතුළු ප්‍රධාන පෙළේ පාසල් 8 ක් ද, ද්විතියික මට්ටමේ පාසල් 7 ක් ද, තෘතියික මට්ටමේ පාසල් 8 ක් ද ප්‍රදේශය තුළ පිහිටා ඇත.

උසස් අධ්‍යාපනය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම ගුරු විද්‍යාලය යන උසස් අධ්‍යාපන ආයතන ද, ජාතික තරුණ සේවා සභාව, මහරගම විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය, තලවතුගොඩ පිහිටි වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පවත්නා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කටුකුරුන්ද ග්‍රාමීය කාන්තා පුහුණු මධ්‍යස්ථානය, උඩහමුල්ල නැණසල මධ්‍යස්ථානය ඇතුළුව වෙනත් විවිධ පුහුණු ආයතනයන්ද මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත.

සිතියම 2.16: අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය,2021

2.2.8 මහරගම බල ප්‍රදේශයෙහි පාරිසරික පසුබිම

මුහුදු මට්ටමේ සිට මීටර් 10-30ක පමණ උසකින් පිහිටා ඇති මහරගම නගර සභා බල ප්‍රදේශය පහතරට තෙත් කලාපයට අයත් වන අතර ප්‍රදේශය පුරා පහත් බිම් රාශියක් පවතින බව දැකගත හැක. රතු දුඹුරු හා වගුරු සහිත පසක් සහිත මෙම ප්‍රදේශයෙහි පහත් බිම් හරහා ගලා යන ජලාපවහන පද්ධතිය කටු ඇළ, කිඹුලා ඇළ වැනි කුඩා ඇළ මාර්ග පද්ධතීන්ගෙන් සමන්විත වේ.

මහරගම ප්‍රදේශය නාය යෑම් වැනි ස්වභාවික ආපදා වලින් තොර ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැක. නමුත් සීඝ්‍ර සංවර්ධනයත් සමග ජනාවාසකරණය හා කාර්මීකරණය සීග්‍රයෙන් ව්‍යාප්ත වන බව පෙනී යයි. මේ හේතුවෙන් ප්‍රදේශයෙහි පවතින පහත් බිම්, කුඹුරු හා වගුරු බිම් සංවර්ධනය සඳහා යොදා ගැනීමත් සමග ගංවතුර වැනි ස්වභාවික ආපදා තත්වයන් මතු වී ඇති අතර තව දුරටත් වැඩි වීමේ අවධානමක් පවතී. එසේම වැඩි වන ජනගහනයත් සමග ඝන අපද්‍රව්‍ය බැහැර කරලීමේ ගැටලුවද පැන නැගී ඇත.

මහරගම නාගරික බල ප්‍රදේශය තුළ ප්‍රධාන ලෙස හඳුනාගත හැකි පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස කුඹුරු වගාබිම් හැඳින්විය හැකි ය. ප්‍රමාණයෙන් හෙක්ටයාර 462.89 ක පිහිටා ඇති කුඹුරු වගාබිම් සැලසුම් බල ප්‍රදේශය පුරා පැතිර පවතී. සැලසුම් බල ප්‍රදේශයේ උතුරට සහ බටහිර දෙසට වන්නට හෙක්ටයාර 67.4 ක් පමණ ප්‍රමාණයක් තුල පවතින "වගුරුබිම්" ද දැකගත හැකිය. මෙයට අමතරව හෙක්ටයාර 37.2 ක් පමණ වන ප්‍රමාණයක පැතිර පවතින ජලාශද හෙක්ටයාර 1.7ක භූමි ප්‍රමාණයක පවතින අත්හරින ලද කුඹුරු බිම්ද පාරිසරික සංවේදී ප්‍රදේශ අතර වේ. තවද මෙම ප්‍රදේශයෙන් හෙක්ටයාර 0.94ක ප්‍රමාණයක් පුරා කෘෂිකාර්මික බිම්ද පැතිර පවතී.

2018 ඔක්තෝබර් 25 දින ඩුබායි හි පැවති තෙත්බිම් පිළිබඳ රැම්සාර් සම්මුතියේ (COP13) 13 වන සමුළුවේදී ලොව පුරා පවතින නගර 18 ක් තෙත්බිම් නගර ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර කොළඹ අවට පවත්නා තෙත් බිම් මඟින් සිදුවන පාරිසරික සේවයේ ඇති වැදගත්කම සැළකිල්ලට ගෙන දකුණු ආසියාවේ එකම තෙත්බිම් නගරය බවට කොළඹ නම් කරන ලදී. ඒ යටතේ තෙත්බිම් අවට හා තෙත්බිම් මත යැපෙන නගර තිරසාර ලෙස භාවිතා කිරීමට දිරිගන්වනු ලැබේ.

මහරගම ප්‍රදේශය තුල තෙත් බිම් ආශ්‍රිතව පහත සඳහන් ගැටළු හඳුනා ගෙන ඇත.

i. නියමිත සැලසුමක් සහ පාලනයකින් තොරව ඉතා සීඝ්‍ර ලෙස පහත්බිම් සහ වගුරු බිම් ගොඩකිරීම හේතුවෙන් අතිරික්ත ජලය රැඳීමට ඇති භූමි ප්‍රදේශය අඩුවීම හා සුළු වර්ෂාවකදී පවා බොහෝ ප්‍රදේශ ජලයෙන් යටවීම.

ii. පහත්බිම් ආශ්‍රිත අනවසර ඉදිකිරීම්, කැලිකසල බැහැර කිරීම හා මළාපවහන කටයුතු සම්බන්ධයෙන් ඇතිවන පාරිසරික ගැටළු

iii. ප්‍රධාන ඇල මාර්ග හා අතුරු ඇල මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ජලාපවහනය නිසි පරිදි සිදු නොවීම හා ආක්‍රමණකාරි පැලෑටි බහුලව තිබීම නිසා ජල බැස්ම තවදුරටත් අවහිරවීම.

iv. නිසියාකාරව නඩත්තු නොකරන පොදු වැසිකිළි වලින් හා නිවෙස් වලින් පිටකරන අපද්‍රව්‍ය පොදු කාණු හා පහත්බිම් වලට මුදා හැරීම.

සිතියම 2.17: පාරිසරික සංවේදී ප්‍රදේශ ,මහරගම මහනගර සභාව



සැකසුම: සැලසුම් කණ්ඩායම, පාරිසරික හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

නාගරික සංවර්ධනය හේතුවෙන් වැඩි පීඩනයකට ලක්ව ඇති නාගරික පරිසරයේ වැදගත් අංගයක් වන්නේ පොදු විවෘත අවකාශයයි. පොදු විවෘත භූමි ප්‍රසන්න හා ස්වාභාවික පරිසරයක් සපයනවා මෙන්ම,අත්‍යවශ්‍ය පාරිසරික ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් නාගරික ප්‍රදේශවල ජීවන තත්ත්වයද වැඩි දියුණු කරයි. නාගරික ප්‍රදේශ තුළ ආකර්ශනීය බව වැඩි කිරීමෙන් විභව ආර්ථික ප්‍රතිලාභ ද ලැබේ.

මහරගම නගර සහා බල ප්‍රදේශයේ පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා වෙන් වී ඇති ප්‍රදේශ පිළිබඳ සැලකීමේදී පොදු මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ඇති ඉඩකඩ සීමිත බව දක්නට ලැබේ.

ඉඩම් අනුබෙදීමේදී නේවාසික ප්‍රදේශ සඳහා ප්‍රමාණවත් විවෘත ඉඩක් වෙන් කිරීම පිළිබඳව අවධානය යොමු කර නොමැති බව දක්නට ලැබේ. මහරගම නගර සහා බල ප්‍රදේශය තුල පවතින පොදු එළිමහන් අවකාශ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගුව 2.5 : පවත්නා පොදු එළිමහන් අවකාශ

අනු අංකය	උද්‍යාන වර්ගය	සංඛ්‍යාව	ප්‍රමාණය(හෙක්)
01	EPP (පවතින ඉතාකුඩා උද්‍යාන)	11	1.06
02	EM (පවතින කුඩා උද්‍යාන)	14	14.26
03	ELP (පවතින අසල උද්‍යාන)	3	3.7
	ELIP (පවතින රේඛීය උද්‍යාන	7	5.8
එකතුව		28	24.82

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2020), නා.සං.අධි

වගුව 2.6 : පවත්නා උද්‍යාන වර්ගීකරණය

අනු අංකය	වර්තමාන භාවිතය	උද්‍යාන වර්ගය	ග්‍රාම නිලධාරී කොට්ඨාශය	ප්‍රමාණය (හෙක්ටයාර)
		පවතින රේඛිය උද්‍යාන (ELP)		
1	ඉසුරු දේවප්‍රිය ක්‍රීඩාංගනය	ELP 1	මිරිහාන උතුර	1.131936
2	නාවින්න	ELP 2	නාවින්න	1.206566
3	ක්‍රීඩාංගනය	ELP 3	ප්‍රගතිපුර	1.345984
		පවතින කුඩා උද්‍යාන (EMP)		
4	ක්‍රීඩාංගනය	EMP 1	ප්‍රගතිපුර	0.225089
5	ක්‍රීඩාංගනය	EMP 2	පමුණුව	0.229766
6	ක්‍රීඩාංගනය	EMP 3	රුක්මලේ බටහිර	0.238987
7	ක්‍රීඩාංගනය	EMP 4	නාවින්න	0.273238
8	ක්‍රීඩාංගනය	EMP 5	රුක්මලේ බටහිර	0.289919
9	ළමා උද්‍යානය	EMP 6	තලපත්පිටිය	0.321827
10	ක්‍රීඩාංගනය	EMP 7	මිරිහාන දකුණ	0.363853

11	කුඩා උද්‍යාන	EMP 8	කොට්ටාව නැගෙනහිර	0.391858
12	එක්සත් ක්‍රීඩාංගනය	EMP 9	දෙපානම	0.40616
13	ක්‍රීඩාපිටිය	EMP 10	මිරිහාන උතුර	0.57584
14	රුක්මල්ගම ක්‍රීඩාපිටිය	EMP 11	රුක්මලේ නැගෙනහිර B	0.75543
15	කුඩා උද්‍යාන	EMP 12	තලපත්පිටිය	0.89895
16	පැපිලියාන ක්‍රීඩාපිටිය	EMP 13	ජම්බුගස්මුල්ල	0.95342
17	ක්‍රීඩාපිටිය	EMP 14	මහරගම නගරය	0.96924
පවතින ඉතා කුඩා උද්‍යාන (EPP)				
18	වොලිබෝල් ක්‍රීඩාපිටිය	EPP 1	ගොඩිගමුව උතුර	0.05786
19	ළමා උද්‍යානය	EPP 2	රුක්මලේ නැගෙනහිර B	0.07192
20	ගල්පොත්ත CP	EPP 3	කලල්ගොඩ	0.07196
21	ළමා උද්‍යානය	EPP 4	මහරගම නගරය	0.08175
22	ළමා උද්‍යානය	EPP 5	ගොඩිගමුව දකුණ B	0.08423
23	අරුණ ප්‍රජා මණ්ඩල ක්‍රීඩාපිටිය	EPP 6	මහරගම නැගෙනහිර	0.08588
24	සංස්කෘතික මධ්‍යස්ථාන CP	EPP 7	මාදිවෙල	0.09181
25	ඉතාකුඩා උද්‍යාන	EPP 8	මලපල්ල බටහිර	0.09551
26	පතිරගොඩ ක්‍රීඩාපිටිය	EPP 9	පතිරගොඩ	0.13912
27	ජයගත්පිටිය ක්‍රීඩාපිටිය	EPP 10	පතිරගොඩ	0.14125
28	ක්‍රීඩාපිටිය	EPP 11	ගොඩිගමුව උතුර	0.14336

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත(2020), නා.සං.අධි.

සිතියම 2.18: පවතින ක්‍රීඩා පිටි සහ උද්‍යාන



සැකසුම: සැලසුම් කණ්ඩායම, පාරිසරික හා භූ දර්ශන අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

පුරාවිද්‍යාත්මක ස්ථාන හා සංස්කෘතිකමය වටිනාකමකින් යුත් ස්ථාන මහරගම නගර සභා සීමාව තුල එතරම් දක්නට නොමැත. පුරාවිද්‍යාත්මක ස්ථාන යනුවෙන් හැඳින්වෙන්නේ භෞතිකමය සාධක (ස්මාරක - monuments) එනම්, කාල නිර්ණය කිරීමෙන් හඳුනාගත් ස්ථාන වන අතර ඓතිහාසික හා සංස්කෘතිකමය වටිනාකමකින් යුක්ත ස්ථාන ලෙස හඳුන්වන්නේ ලිඛිතමය සාධක වලින්, පාරම්පරිකව, වාචිකව හෝ ජනශ්‍රැති ආශ්‍රයෙන් පැවත එන්නාවූ ස්ථානයන්ය. ඒ අනුව මෙම වර්ග දෙකටම අයත් පෞරාණික ස්ථානයන් ඉතා අල්ප වූ ප්‍රදේශයක් ලෙස මහරගම නගර සභා බල ප්‍රදේශය හැඳින්විය හැකිය.

මහරගම ශ්‍රී විපශ්‍යාරාමය , ගනේලන්ද පුරාණ රජමහා විහාරය, ගනේලන්ද විශ්ණු දේවාලය, නාවින්න රජමහා විහාරය ආදී ස්ථාන උදාහරණ ලෙස දැක්විය හැකිය.

සිතියම 2.19 : සංස්කෘතික, ආගමික, වාස්තු විද්‍යාත්මක සහ පුරාවිද්‍යාත්මක, වටිනාකමින් යුත් ස්ථාන



මූලාශ්‍රය : සැලසුම් කණ්ඩායම,පාරිසරික හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2021

2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

මහරගම නගර සභා බල ප්‍රදේශයෙහි සැලසුම් සීමාව නිර්ණය කිරීමේදී ප්‍රධාන වශයෙන් භූගෝලීය මායිම,ක්‍රියාකාරී මායිම හා පරිපාලන මායිම යන සීමාවන් ද සංවර්ධන පීඩනය හා පාරිසරික සංවේදීතාවය ද සැලකිල්ලට යොමු කරන ලදී.

අ) භූගෝලීය මායිම

කොළඹ නගරයේ සිට කි.මී.15ක් දුරින් ගිනිකොන දෙසට වන්නට පිහිටා ඇති මහරගම නගරය පිහිටීම අතින් මුහුදු මට්ටමේ සිට මීටර් 10-30 අතර පවතින අතර කිසිදු ස්ථානයක් මීටර් 30 නොඉක්මවේ. අධ්‍යයන ප්‍රදේශය තුල විශේෂිත කඳු බැවුම් හෝ කඳු නිම්න වැනි ලක්ෂණ දක්නට නොලැබෙන අතර ගලා බස්නා කුඩා ජලපහර, ඇළ මාර්ගයන් දක්නට ලැබේ.

මහරගම සිට සැතපුම් 2 ක් ඇතුළත භූ විෂමතාවයේ අඩංගු වන්නේ උන්නතාංශයේ සාමාන්‍ය වෙනස්කම් පමණි, උපරිම උන්නතාංශය අඩි 131 ක් සහ සාමාන්‍ය උන්නතාංශය මුහුදු මට්ටමේ සිට අඩි 56 කි. සැතපුම් 10 ක් ඇතුළත ද අඩංගු වන්නේ උන්නතාංශයේ (අඩි 423) සාමාන්‍ය වෙනස්කම් පමණි. සැතපුම් 50ක් ඇතුළත ඇත්තේ උන්නතාංශයේ (අඩි 7,175) සාමාන්‍ය වෙනස්කම් පමණි.

තවද ප්‍රදේශයෙහි පවත්නා ජනාකීර්ණ බව හේතුවෙන් වනාන්තර ආදී ස්වභාවික වෘක්ෂලතාවන් දක්නට නොමැති අතර වගුරු බිම්, කුඹුරු ප්‍රදේශයන් දක්නට ලැබේ. එබැවින් මහරගම සංවර්ධන සැලැස්ම සැකසීමේදී මෙම භූගෝලීය ලක්ෂණයන් සැලකිල්ලට ගන්නා ලදී.

සිතියම 2.20: මහරගම ප්‍රදේශයේ උන්නතාංශය



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

ආ) ක්‍රියාකාරී මායිම

මහරගම නගරයෙහි නේවාසික ජනගහනයට අමතරව සංසරණ ජනගහනය ද සාපේක්ෂව ඉහල මට්ටමක පවතී. පමුණුව රෙදිපිළි මධ්‍යස්ථාන ඉලක්ක කරගනිමින් මෙන්ම ජාතික වශයෙන් වැදගත් ආයතන රාශියක් පිහිටා ඇති බැවින් එම සේවාවන් ලබා ගැනීම සඳහා ජනතාව රටෙහි සෑම ප්‍රදේශයකින්ම පැමිණේ.

තවද, අගනගරයට මායිම්ව පිහිටා ඇති හෙයින් පරිපාලන සේවා කටයුතු සඳහා මෙම නගරය හරහා ගමන් කෙරෙන පිරිස විශාල ප්‍රමාණයකි. එබැවින් සේවා නගරයක් ලෙස හා වාණිජ නගරයක් ලෙස පහසුකම් සපයන බැවින් සැලසුම් සකස් කිරීමේදී ඒ පිලිබඳව අවධානය මෙහිදී යොමු කර ඇත.

ඇ) පරිපාලන මායිම

ග්‍රාම නිලධාරී වසම් 41 කින් සමන්විත වන මහරගම නගර සහා බල ප්‍රදේශය උතුරින් හා ඊසාන දෙසින් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, නැගෙනහිරින් හා ගිනිකොණින් හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, දකුණින් හා නිරිත දිගින් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, බටහිරින් (සුළු ප්‍රමාණයක්) දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, බටහිරින් හා වයඹින් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද මායිම් වී ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන

01

ග්‍රාම නිලධාරී වසම් ගණන

41

භූමි ප්‍රමාණය(ව.කි)

39.4

ජනගහනය (2019)

212,014

2031 වසරේදී අපේක්ෂිත ජනගහනය

235,650

සංසරණ ජනගහනය

70,671

2031 වසරේදී අපේක්ෂිත සංසරණ ජනගහනය

200,000

ඒ අනුව මෙම සියලු විශ්ලේෂණයන් මගින් මහරගම ප්‍රදේශයෙහි සැලසුම් සීමාව නිර්ණය කිරීම සිදු කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයෙහි සියලු පළාත් පාලන ආයතනයන්හි අදාල පරිපාලන සීමාව සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම කරනු ලබයි. ඒ අනුව අවට පළාත් පාලන ආයතන වන කඩුවෙල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බොරලැස්ගමුව , හෝමාගම, කැස්බෑව යන පළාත් පාලන ආයතන සඳහා සංවර්ධන සැලසුම් සකස් කරනු ලබයි. එබැවින් සිතියම 2.21 මගින් පෙන්වා ඇති පරිදි මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහාද සැලසුම් සීමාව ලෙස නගර සභා බල ප්‍රදේශය යොදා ගන්නා ලදී.

ඇ) සංවර්ධන පීඩනය හා පාරිසරික සංවේදීතාව

ප්‍රවේශ්‍යතා දර්ශකය (ප්‍රධාන මාර්ග වලින් - (ඒ බී සී) ප්‍රවේශවීමේ මට්ටම), නාගරීකරණ දර්ශකය,ඝනත්ව දර්ශකය (ජනගහන ඝනත්වය,ජනගහන වර්ධනය) හා ඉඩම් පරිහරණ දර්ශකය (ඉඩම් භාවිතය,ඉඩම් පරිවර්තනය) භාවිතා කරමින් ප්‍රදේශයේ සංවර්ධන පීඩනය කුමන ආකාරයක් ගන්නේද හා ප්‍රදේශයන්හි කුමන ආකාරයෙන් පැතිරී ඇත්තේද යන්න හඳුනා ගන්නා ලදී.(සිතියම 2.22)

තවද ජල පද්ධතිය (ගංගා / අතු ගංගා /වැව්, ජලය රඳවා ගැනීමේ ප්‍රදේශ (තෙත්බිම්), ජලයෙන් යටවන ප්‍රදේශ, වෘක්ෂලතා ආවරණය (වන, කඩොලාන, කුඹුරු, වගා ප්‍රදේශ, ගෙවතු), භූගෝලීය ලක්ෂණ (බෑවුම්), හා මානව භාවිත සම්පත් (පුරාවිද්‍යාත්මක ස්ථාන,සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන / උරුම ස්ථාන,ආගමික ස්ථාන, හා උද්‍යාන / ක්‍රීඩා පිටි) සැලකීමෙන් ප්‍රදේශයේ පාරිසරික සංවේදීතාව හඳුනා ගන්නා ලදී. (සිතියම 2.23)

ඒ අනුව ගත්කල කොට්ටාව, මහරගම, තලවතුගොඩ ආදී සියලු ප්‍රදේශයන්ගේ හා ඉන් ඔබ්බට නුගේගොඩ, කෝට්ටේ, හෝකන්දර යන සියලු ප්‍රදේශයන්හි සංවර්ධන පීඩනයක් ඇති අතර පාරිසරික සංවේදී ප්‍රදේශයන්ට තර්ජනයක්ව ඇති බවට හඳුනා ගන්නා ලදී.

කෙසේ උවද අවට සියලු පරිපාලන ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම මේ වන විට සිදුකරන බැවින් සමස්තයක් ලෙස සංවර්ධන පීඩනය හා පාරිසරික සංවේදීතාව සැලකිල්ලට ගනිමින් මහරගම නගර සභා බලප්‍රදේශයට මෙම සැලැස්ම සකස් කරනු ලැබීය.

සිතියම 2.21 : පරිපාලන මායිම



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 2.22: සංවර්ධන පීඩනය



සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021



සිතියම 2.23: පාරිසරික සංවේදීතාවය

සැකසුම: සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය, 2021

03
වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

පරිච්ඡේදය 03

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

3.1 හැඳින්වීම

උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියේ මුල්ම උපායමාර්ගික විමසුම වන 'සැලසුම් ප්‍රදේශයේ වර්තමාන තත්වය කෙසේද?' යන්න විමසීම මගින් සැලසුමක සැබෑ අවශ්‍යතාවය සඳහා පිළිතුරු සපයා ගැනීමට අපේක්ෂා කරන ලදී. සැලසුම යොමුවිය යුතු දිශාව සහ අනාගතයේදී නගරයේ සංවර්ධනය යොමුකළ යුතු දිශානතිය හඳුනා ගැනීම සඳහා සැලසුමක සැබෑ අවශ්‍යතාවය හඳුනා ගැනීම හෝ සැලසුමක් සෑදිය යුතු හේතු හඳුනා ගැනීම අවැසි වේ. සැලසුම් කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම මූලික වශයෙන් නගරය සමග සම්බන්ධ වන විවිධ පාර්ශවකරුවන් විසින් හඳුනාගත් සැලසුම් ප්‍රදේශය තුල පවත්නා විවිධ ගැටළු හඳුනා ගැනීම තුලින් ආරම්භ කරන ලදී. මේ යටතේ ප්‍රධාන පාර්ශවකරුවන් වන සේවා සපයන ආයතන සහ භාවිතා කරන්නන්ගෙන් (පුරවැසියන් සහ මගීන් ඇතුළු සාමාන්‍ය ජනතාව) නගරයේ දැනට පවතින ගැටළු පිළිබඳව අදහස් විමසන ලදී. මෙහිදී එක් එක් පාර්ශවකරුවන් විසින් නගරය දෙස විවිධ පැතිකඩ වලින් විමසා බලන බැවින් මෙම ක්‍රියාවලිය තුල නගරය තුල පවතින සහ පුළුල් පරාසයක් ආවරණය වන විවිධ ගැටළු රාශියක් හඳුනා ගත හැකි විය. මීළඟ අදියර ලෙස මෙලෙස හඳුනාගත් ගැටළු පිලිබඳ මූල සාධක හඳුනා ගැනීමේ ගැඹුරු විශ්ලේෂණයක් සිදු කරන ලද අතර එමගින් ප්‍රදේශය තුල පවතින ගැටළු නිවැරදි ලෙස අර්ථ දැක්වීමට හැකිවිය.

3.2. සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා ගැටළු විශ්ලේෂණය

3.2.1. ප්‍රවාහන තදබදය අධික ලෙස වර්ධනය වීම.

හයිලෙවල් මාර්ගය, කොට්ටාව - බොරැල්ල මාර්ගය, පමුණුව - නව රෝහල මාර්ගය, මහරගම - බොරලැස්ගමුව මාර්ගය, මහරගම - පිළියන්දල මාර්ගය, නාවින්න-උඩහමුල්ල මාර්ගය, හෝකන්දර - තලවතුගොඩ - පිටකෝට්ටේ මාර්ගය, කොට්ටාව - මාලඹේ මාර්ගය, කොට්ටාව - අතුරුගිරිය මාර්ගය, පන්නිපිටිය - හෝකන්දර මාර්ගය යන මාර්ගයන් මහරගම නගර සහා බල ප්‍රදේශය හරහා විහිද යන ප්‍රධාන මාර්ගයන් වන අතර, මහරගම ප්‍රධාන සංධිස්ථානයක් ලෙස පිහිටීම නිසා සාපේක්ෂව ඉහල මට්ටමක ප්‍රවාහන ඉල්ලුමක් පවතී.

තවද, ප්‍රධාන පිවිසුම් මාර්ග සංසන්දනය කර බලන විට හයිලෙවල් මාර්ගය ඉහළම මගී ආකර්ශන සනත්වයක් පවත්වා ගනිමින් ඉහළම ඒකාබද්ධතාවය සහිත පිවිසුම ලෙස හඳුනා ගත හැක.

සිතියම 3.1 : ප්‍රධාන පිවිසුම් මාර්ග



සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 3.2 : මාර්ග ආකර්ශනීයත්වය



සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

පිවිසුම් මාර්ග හෙවත් කොරිඩෝ (Corridors) හා සංසන්දනය කරන විට කොට්ටාව, තලවතුගොඩ හා මහරගම යන නගර , මහරගම නගර සභා බල ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් වාණිජ කටයුතු සංකේන්ද්‍රණය වීම පදනම් කොට සැකසී ඇති මංසන්ධි වේ. එමෙන්ම නුගේගොඩ ද උක්ත කලාපයට ඇතුලත් වන පිවිසුම් දොරටුවකි. මඟී ආකර්ෂණය අනුව ඔවුන්ගේ ආගමනය මෙම මංසන්ධි සඳහා විවිධාකාර වේ.

පමුණුව රෙදි පිළි කර්මාන්තය හා බැදි වෙළඳාම ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, මහරගම තරුණ සේවා සභාව යන ආයතනයන් කේන්ද්‍ර කොට ගනිමින් නිර්මාණය වූ ශිෂ්‍ය ගහනය ද, මාකුඹුර බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය කරා දිනපතා සංක්‍රමණය වන මඟී ජනතාව ද, කේන්ද්‍ර කොට ගෙන, දෛනිකව රාජකාරී කටයුතු සඳහා පැමිණෙන පිරිස් හේතුවෙන් වාහන ධාරිතාවෙහි තරමක වර්ධනයක් දැකීමට හැකිය.

කොළඹ මෙට්‍රොපොලිටන් කලාපය සහ තදාසන්න ප්‍රදේශ සඳහා නාගරික ප්‍රවාහන පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොළඹ හා තදාසන්න ප්‍රදේශයන්හි සිදුකරන ලද ගමන් වේග සමීක්ෂණ ප්‍රථිපල මගින් මහරගම නගර සභා බල ප්‍රදේශයේ කොට්ටාව, පන්නිපිටිය, මහරගම හා තලවතුගොඩ යන මංසන්ධීන්හි උදැසන හා සවස මාර්ග තදබදය පවතින බවත් වේගය පැයට කිලෝමීටර් 10- 30 ත් අතර අවම මට්ටමක වන බවත් හඳුනා ගෙන ඇත. තවද, හයිලෙවල් මාර්ගය තුළ පැයක මාර්ග තදබදය වාහන 2200 ක්ද පැයක ගමනාගමන ධාරිතාවය වාහන 2300 ක්ද වන වන බව හඳුනා ගෙන ඇත.

සිතියම 3.3: ගමන් වේග සමීක්ෂණ ප්‍රතිපල



මූලාශ්‍රය : කොළඹ මෙට්‍රොපොලිටන් කලාපය සහ තදාසන්න ප්‍රදේශ සඳහා නාගරික ප්‍රවාහන පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය, 2014

තවද කොළඹ වාණිජ නගරය කලාපීය වශයෙන් ප්‍රධාන අරීය මාර්ග හතකින් සම්බන්ධවී පවතී. ඉන් එක් ප්‍රධාන මාර්ගයක් වන හයිලෙවල් මාර්ගය මෙම ප්‍රදේශය හරහා ගමන් කරනු ලබන අතර කොළඹ නගරයට ඇතුළුවන මුළු වාහන ප්‍රතිශතයෙන් 8% ක් පමණ මෙම මාර්ගය හරහා ගමන් කරයි.

ප්‍රදේශයේ ආර්ථික කටයුතු වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රධාන මාර්ග පද්ධතිය හා සමගාමීව සංකේන්ද්‍රණය වී ඇති බැවින් වාහන තදබදය ආර්ථික සංවර්ධනයට නිශේධනාත්මක ලෙස බලපෑමක් ඇති කරනු ඇත. ප්‍රවාහන තදබදය නිසා ශ්‍රී ලංකා ආර්ථිකයේ වාර්ෂිකව දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රමාණයෙන් 1.8% අහිමි වී යන බව ද ඇස්තමේන්තු ගත කර ඇත.

ප්‍රවාහන ඉල්ලුම අනාගතයේදී වේගයෙන් වැඩි වන බැවින් ඉතාමත් ඉක්මනින් සුදුසු ප්‍රතිකර්ම නොයෙදුවහොත් ඉහත තත්ත්වය තව දුරටත් තීව්‍ර කෙරෙනු ඇත. එබැවින් මෙම කලාපයේ ප්‍රවාහන තදබදයට පිළියම් යෙදීම සම්බන්ධව සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ඉතාමත් විචාරාත්මක ව විග්‍රහ කළ යුතු කාරණාවක් ව ඇත.

3.2.2. වර්තමාන නේවාසික ක්‍රියාකාරකම් පරිසර සංවේදී කලාප ප්‍රදේශයන්ට ව්‍යාප්ත වීමේ අවධානම

මහරගම නගර සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය තුල පවතින කුඹුරු ඉඩම් තෙත්බිම් සහිත කලාප වලින් වැඩි කොටසකට හිමිකම් කියනු ලබයි. 2012 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව, කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත් වන ජනගහනයෙන් 8.5 % ක් වූ ප්‍රමාණයක් මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වේ. මේ වන විට, වැඩි වන ජනගහනය සමඟ 2019 මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් නිකුත් කරන ලද, සම්පත් පැතිකඩ වාර්තාවන් ට අනුව, මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ මුළු ජනගහනය 212,014කි. එනම්, ශ්‍රී ලංකාව තුල මුළු ජනගහනයෙන් 40% ක් තරම් වූ පිරිසක් ජීවත් වන කොළඹ දිස්ත්‍රික්කය තුළ උක්ත සඳහන් කළ 212,014 ට ආසන්න (8%) වූ ජන සංඛ්‍යාවක් තම ස්ථිර පදිංචිය සඳහා තෝරා ගත් ප්‍රදේශයකි. කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන කළ එය දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහයෙන් හය වන ස්ථානය හිමි කර ගනී.

එමෙන්ම, 2001-2019 කාල පරාසය තුල ජනගහන වර්ධන වේගය 0.75%ක ප්‍රතිශතයක් ගන්නා අතර 2001 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී ග්‍රාමීය ප්‍රදේශ කරා ජනගහන ව්‍යාප්තිය වර්ධනය වීමේ සීඝ්‍ර ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඒ අනුව, ජනගහනයේ භූමි පරිභෝජනයට අනුව, මුළු භූමියෙන් මේ වන විටත් 60.53% ක ප්‍රමාණයක් එනම්, හෙක්ටෙයාර් 2446.3 කට ආසන්න භූමි ප්‍රමාණයක් තුළ නේවාසික ව්‍යාප්තිය දැකිය හැකි වේ.

කුඹුරු ඉඩම්, වගුරු, ආරක්ෂණ කලාප (පාර්ලිමේන්තු සංරක්ෂණ කලාප), තෙත් බිම් (කුරුළු උයන කලාපයේ කොටසක්) කැලෑ, කඳු ප්‍රදේශ, ගංවතුර ඇති වන ප්‍රදේශ යන නිර්ණායක යටතේ වන පාරිසරික සංවේදී කලාපයන්ගේ විහිදීම් විශ්ලේෂණයේ දී හඳුනා ගන්නා ලද ප්‍රතිඵල වලට අනුව ද මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ සංවේදී කලාප පවතින බවට සනාතවේ. මෙම ප්‍රදේශයට ආවේණික වූ කුඹුරු පද්ධතියක් හා ඒ හා බැඳී පවතින ජල මූලාශ්‍ර පද්ධතියකින් හෙබි සංවේදී කලාපයක් පිහිටා තිබීම තුලින් ප්‍රදේශයේ සුන්දරත්වය මනාව ඔප් නැංවීමට හා, ජල රැඳවුම් නිසි ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය පරිසර පද්ධති සමතුලිතතාවය සඳහා මහඟු පිටුවහලක් ලබා දෙනු ලබයි.

කෙසේ වෙතත් පෙර සඳහන් කළ පරිදි වැඩි වන ජනගහනය මත, වර්තමානයේ සංවර්ධන ක්‍රියාවලීන් සංවේදී කලාප වෙතට ව්‍යාප්ත වීමේ වැඩි නැඹුරුතාවයක් පවතී.

2020.10.12 දින පැවති කෘෂිකර්ම කමිටුවේදී ද මේ සම්බන්ධව වැඩි දුර සාකච්ඡා කරන ලද අතර, ඒ අනුව, සංවර්ධන කටයුතු හා පරිසර පද්ධති අතර සිදුවන නොගැලපීම හේතුවෙන් තලපත්පිටිය, නාවින්න ආදී ප්‍රදේශවල ජනතාව ගංවතුර අවධානමට මුහුණ දෙන බව අනාවරණය විය.

රූපය 3.1: මහරගම ප්‍රදේශයේ ගංවතුර බලපෑම් වලට ලක්වූ පවුල් සංඛ්‍යාව



මූලාශ්‍රය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

නිදසුන් ලෙස, තලපත්පිටිය නාගරික කුඹුරු ව්‍යාපෘතිය (Model Paddy Field) සිදු කිරීමේදී ,වැසි ජලය බැහැර කරලීමට ඉදි කර ඇති අපවහන කාණු පද්ධති ප්‍රමාණවත් නොවීම මත යාබද කුඹුරු වැසි කාල වලදී ගංවතුර තත්ත්වයනට මුහුණ දීමේ අවධානමක් මතුව ඇත.

කෙසේ වෙතත්, උක්ත සඳහන් කළ පරිදි සංවර්ධන ව්‍යාපෘතීන් හේතුවෙන් ජනගහනය ද එවැනි ප්‍රදේශ කරා නැඹුරු වීම වර්තමානයේ දැකිය හැකි කරුණකි. මහරගම යනු ,කොළඹ දිස්ත්‍රික්කය තුළ දැකිය හැකි සංවේදී පරිසර පද්ධති වලින් සමන්විත අගනගරයට ආසන්නව පිහිටි පහසුකම් ලඟා කර ගැනීම සඳහා ළඟා විය හැකි ප්‍රධාන නාගරික බල ප්‍රදේශයකි. ඒ අනුව, ජනගහනය පරිසර සංවේදී කලාප කරා ඇදී ඒමක් දැකිය හැකි වන අතර, කුඹුරු හා පහත් බිම් කාලයාගේ ඇවෑමෙන් ගොඩ ඉඩම් බවට පරිවර්තනය කොට ජනාවාස ඉදි කිරීම දැකිය හැකි සුලබ දසුනකි. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ගණනය කිරීම් වලට අනුව 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුල ප්‍රදේශයේ හරිත අවකාශය වර්ග කිලෝමීටර් 3.8 කින් එනම් 10% කින් අඩු වී ඇත.

පහත නිදර්ශන එය ගම්‍ය කරනු ලබන අතර, 2004 දී තෙත් බිම් කලාපයේ පිහිටි ඉඩම් 2021 එනම් වර්තමානය වනවිට පිහිටීම පහත පරිදි වේ.

රූපය 3.3 • අනවසර ගොඩකිරීම් ,මාලපල්ල

මූලාශ්‍රය • ගූගල් සිතියම් හා ක්ෂේත්‍ර සමීක්ෂණ,2014 හා 2021

රූපය 3.2 :අනවසර ගොඩකිරීම් ,පොල්වත්ත

මූලාශ්‍රය : ගූගල් සිතියම් හා ක්ෂේත්‍ර සමීක්ෂණ, 2014 හා 2021

රූපය 3.4 : අනවසර ගොඩකිරීම්,සිරි නන්ද ජෝතිකාරාමය

මූලාශ්‍රය : ගූගල් සිතියම් හා ක්ෂේත්‍ර සමීක්ෂණ, 2014 හා 2021

ඒ අනුව ප්‍රදේශයේ සංවේදී කලාප ආරක්ෂා කරගනිමින් සංවර්ධනය කිරීම සඳහා සංවර්ධන සැලස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

3.2.3 ප්‍රදේශයේ පවතින විභවතා සංවර්ධන කටයුතු සඳහා භාවිතයට නොගැනීම.

මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සංවේදී කලාපයන් ජලය රඳවා ගන්නා තෙත් බිම් හා වගුරු බිම් වලින් සමන්විත වේ. කුරුළු උයන කලාපය (Bird Park area), පාර්ලිමේන්තු රක්ෂිත ප්‍රදේශය ඇතුළු පෝෂිත ජල මූලාශ්‍ර සහිත තෙත් බිම් කලාප සංරක්ෂණ හා සංවර්ධන කටයුතු සඳහා නිසි ලෙස දායක කර ගැනීමෙන් තොරව හුදෙකලාව පැවතීම මත ජනතාවට එකී සම්පත් නිසි ලෙස භුක්ති විඳීමට නොහැකි වී ඇති අතර යාබද සුන්දරත්වය අත්විඳීමට ඇති අවස්ථාවද ක්‍රම ක්‍රමයෙන් පරිහානියට පත් වන බව නිරීක්ෂණය කල හැකි කරුණකි .

වර්ග කිලෝමීටර් 39.4 පමණ වපසරියකින් යුතු භූමි වපසරියකට හිමිකම් කියනු ලබන මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ මූල්‍යමය හා සෞන්දර්යාත්මක වටිනාකමකින් යුතු රජයේ ඉඩම් පරිහානියට පත් ව ඇත.

නිදසුන් ලෙස ,මහරගම නගරය තුළ පමුණුව රෙදි පිළි කර්මාන්තය පැතිර පවතින ප්‍රදේශයට යාබද අක්කර 21 කින් යුතු අල් ගෆූර් (Al Gafoor) අරාබි විදුහලට අයත් මේ වන විටත් භාවිතයක් නොමැති විශාල ඉඩම, මිරිහාන පොලිස් බල ප්‍රදේශයේ පවතින කැළි කසල බැහැර කරන සේනාධිලංකාර ගම ක්‍රීඩාංගනය ඇතුළු භූමි ප්‍රදේශය, නාවින්න ක්‍රීඩාංගනයට යාබද අක්කර 12.5 කින් යුතු ඉඩම, පාර්ලිමේන්තු ජල පෝෂක ප්‍රදේශයට අයත් අක්කර 37 රූඩ් 1 පර්චස් 20.44 කින් යුතු බර්ඩ් පාර්ක් බිම් කොටස, පන්නිපිටිය- දෙපානම පිහිටි කර්මාන්ත ශාලාවක් සඳහා භාවිත කොට මේ වන විට අතහැර දමා ඇති ඉඩම් කොටස, පන්නිපිටිය හන්දිය ආසන්නයේ පිහිටි වල්ජම්බුගහවත්ත නමැති අක්කර 2 යුතු ඉඩම් කොටස, බොරැල්ල - පන්නිපිටිය 174 මාර්ගයට මුහුණ ලා පිහිටි වීර මාවත නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘතියට යාබද ව පිහිටි කුඹුරු යාය, පරිසර පද්ධතියට සමස්තයක් ලෙස පිළියම් යෙදීමට පවතින සංවර්ධනයේ අසමර්ථතාවය නිදර්ශනයන් ලෙස ගත හැකිය.

මහරගම බල ප්‍රදේශය තෙත් බිම් කලාප බහුලව දැකිය හැකි ප්‍රදේශයක් නිසාම සූක්ෂම වූ සංවර්ධන උපාය මාර්ගයන් සලකමින් තිරසාර සංවර්ධන සැලැස්මක් සැකසීමට අවශ්‍යව ඇත. තෙත්බිම් කලාප සුරක්ෂිත කිරීම ගැටළුවක් ව පවතින්නේ මහරගම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාව රක්ෂිත හා රජයේ ඉඩම් හි නිවාස ඉදි කිරීම් හා අනවසර පිරවීම් හා එහි ඉදි කිරීම් හේතු කොටගෙන වේ. මෙම තත්ත්වය මහරගම ප්‍රදේශයේ පරිසර සංවේදී කලාප අශ්‍රිතව ප්‍රධාන ගැටළුවක් බවට පත් ව ඇත.

අනවසර නිවාස ඉදි කිරීම් ආශ්‍රිත ව ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් කැළි කසල හා අප ජලය ජල මූලාශ්‍ර වෙත බැහැර කිරීම දැකිය හැකි අතර එමඟින් එම තෙත්බිම් කලාප වල ජෛව විවිධත්ව හායනයක් සිදු වනු දැකිය හැක .නිදසුන් ලෙස, මාදිවෙල ප්‍රගතිපුර අඩු ආදායම්ලාභී ජනාවාස ආශ්‍රිත සිදු වන පාරිසරික දූෂණය දැක්විය හැකිය.

මීට අමතරව සිදුවෙමින් පවතින පරිසර හානි හා සමාජයීය ගැටළු ලෙස

- Bird Park පහත් බිම්ප්‍රදේශය හා පාර්ලිමේන්තු රක්ෂිත ප්‍රදේශ අයත් දියවන්නා ඔය ආශ්‍රිත ව පිහිටා ඇති අඩු පහසුකම් සහිත නිවාස වලින් කැළි කසල හා අප ජලය ජල මූලාශ්‍ර වෙත බැහැර කිරීම හා මෙමඟින් හමන දැඩි දුර්ගන්ධය නිසා පරිසර පද්ධතිය හානියට ලක්වී තිබීම.

- සේනාධිලංකාර ගම ආශ්‍රිතව කැළි කසල බැහැරකිරීම සඳහා සේනාධිලංකාරගම ක්‍රීඩාංගනය යොදා ගැනීම හේතුවෙන් එම පරිසරය තුළ ස්වභාවික පරිසර පද්ධතියේ සමතුලිතතාවය බිඳ වැටීම

- උඩහමුල්ල -නැගෙනහිර විනිසුරු නිල නිවාස ආසන්නයේ පිහිටි හරිත උයන නම් ස්ථානය ආශ්‍රිත ප්‍රදේශයට කැළි කසල බැහැර කිරීම

- මහරගම පිළිකා රෝහල (අපේක්ෂා රෝහල) ආසන්නයේ පිහිටා ඇති කොහිළ කොටුව නමැති තෙත් බිම වෙත කැළි කසල බැහැර කිරීම නිසා විනාශ වී තිබීම

- සමාජයීය ගැටළු- මත් ද්‍රව්‍ය වෙළදාම සඳහා සුදුසු වටපිටාවක් නිර්මාණය වීම

- සෞඛ්‍ය ගැටළු - බෝ වන රෝග පැතිරීමේ අවධානමක් හා වැසි කාල වලදී පැතිර යන ඩෙංගු උවදුර

- යටිතල පහසුකම් අවම වීමේ ගැටළු - පවතින පටු මාර්ග අවහිර කරමින් ගොඩනැගිලි ඉදි කිරීම සහ එම මාර්ග සඳහා නිසි පළලක් නොමැති වීම දැක්විය හැකිය.

තවද නිසි අප ජල පවාහන ක්‍රමවේදයක් හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් නොමැති වීම හේතුවෙන් පරිසර සංවේදී කලාපයන්ට එම අපද්‍රව්‍ය බැහැර කරලීමේ හේතුවෙන් අනාගතයේදී තිරසර සංවර්ධනය සඳහා තර්ජනයක් ඇති විය හැකි බව හඳුනා ගත හැකිය.

3.3. සැලසුම් ප්‍රදේශය තුළ පවත්නා විභවතා විශ්ලේෂණය

3.3.1. ඉදිරි සංවර්ධන ව්‍යාපෘති වලින් උපරිම ධනාත්මක බලපෑම් අත්කර ගැනීම

- සැහැල්ලු දුම්රිය සංක්‍රමණය ප්‍රවාහන ජාලය

ප්‍රවාහන හා ගමනාගමන තදබදය කොළඹ හා තදාසන්න ප්‍රදේශයන්හි පවතින උග්‍ර ගැටළුවක් බවට පත්වී ඇත. මෙම ගැටළුවට පිළියම් සඳහා සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතිය සහ බහු-මාදිලි කේන්ද්‍ර සංවර්ධනය ඇතුලත් ව්‍යාපෘති රාශියක් හඳුන්වා දී ඇත. පහත සිතියම මගින් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියේ විහිදීම් රටාව දැක්වේ.

එහි නිල් වර්ණයෙන් දක්වා ඇති හුනුපිටියෙන් ආරම්භ වන සැහැල්ලු දුම්රිය මාර්ගය මහරගම නගර සභා ප්‍රදේශයේ තලවතුගොඩ, කළල්ගොඩ, පන්නිපිටිය, ධර්මපාල විද්‍යාලය, කොට්ටාව හරහා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වෙත ගමන් කිරීමට යෝජනා කර ඇත.

මෙමගින් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා ධනාත්මක බලපෑම් ඇතිකරනු ලැබීමට සැලසුම් සකස් කිරීම වැදගත් වේ.

- කැළණි වැලි දුම්රිය මාර්ගය විද්‍යුත් මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම

දැනට පවතින මරදාන දුම්රිය ස්ථානයෙන් ආරම්භ වන කැළණි වැලි දුම්රිය මාර්ගය මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ නාවින්න දුම්රිය ස්ථානයෙන් ඇරඹී මහරගම, දඹහේන, පන්නිපිටිය, කොට්ටාව හා මාකුඹුර දක්වා ගමන් කොට අවිස්සාවේල්ල දක්වා ගමන් කරන අතර යටිතල පහසුකම් ප්‍රවර්ධනය කරලීමේ අරමුණින් එම මාර්ගය විද්‍යුත් දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

සිතියම 3.4: සැහැල්ලු දුම්රිය සංක්‍රමණය ප්‍රවාහන ජාලය



මූලාශ්‍රය : බස්නාහිර කලාපීය මහා නගර සැලසුම්කරණ ව්‍යාපෘතිය,

සිතියම 3.5: කැළණි වැලි දුම්රිය මාර්ගය විද්‍යුත් මාර්ගය



මූලාශ්‍රය : බස්නාහිර කලාපීය මහා නගර සැලසුම්කරණ ව්‍යාපෘතිය

- මාකුඹුර අන්තර් හුවමාරු නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

"නව අන්තර් හුවමාරු නාගරිකයක් (Township) හා තිරසර සංවර්ධනයක් බිහි කිරීමේ අරමුණින් බස් හා දුම්රිය නැවතුම් ස්ථානය ඒකාබද්ධ කරමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාකුඹුර අන්තර් හුවමාරු නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙය අන්තර් හුවමාරු, රැකියා අවස්ථා, සංක්‍රමණ කේන්ද්‍ර කටයුතු, විනෝදාත්මක හා අනෙකුත් පහසුකම් වලින් යුක්ත මධ්‍යස්ථානයකි. මෙම ව්‍යාපෘතිය ඉතාමත් වැදගත් වන්නේ දක්ෂිණ අධිවේගී මාර්ගය හා පිටත වට රවුම් මාර්ගයන්ගෙන් කොළඹට ගමන් කරන මගීන්ට පහසුකම් සලසන අතර නගරයට ඇතුළු වන මගීන් ප්‍රමාණය අඩු කෙරෙමින් ගමනාගමන තදබදය අඩු කරලීමට හේතු වීමයි. මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාකුඹුරට ආසන්න ව අක්කර 21 කින් යුත් අත්හරින ලද කුඹුරු බිමක් හඳුනාගෙන එය සංවර්ධනයට කටයුතු කරන ලදි. මින් හෙක්ටයාර 1.5 ක භූමි ප්‍රමාණය බහු මාදිලි මධ්‍යස්ථානය සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත. එය වාහන නවතා ගමන් කිරීමේ (park and ride) පහසුකම, ආපන ශාලා හා විවේක කාමර සහිත ඒකාබද්ධ බස් ගමනාන්තයකින්, දුම්රිය ස්ථානය හා රථ වාහන නැවතුමකින් සමන්විත වේ. සෙසු භූමි ප්‍රමාණය නේවාසික හා වාණිජ ඒකක, ජනතාවට විවේකී ව කාලය ගත කළ හැකි නාගරික වනෝද්‍යාන ඇතුළු අනෙකුත් මහජන පහසුකම් වලින් යුත් මිශ්‍ර සංවර්ධනයක් සඳහා යෙදවීමට මෙම සැලැස්ම තුළින් නියමිතය.

සංවර්ධන ප්‍රදේශය හරහා සිදුකරනු ලබන ප්‍රධාන ගමනාගමන සැලසුම්හි ධනාත්මක බලපෑම් ප්‍රදේශයේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා ඒවා සැලකිල්ලට ගනිමින් සංවර්ධන සැලස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

04

වන පරිච්ඡේදය

සංවර්ධන සැලසුම් රාමුව

පරිච්ඡේදය 04
සංවර්ධන සැලසුම් රාමුව

4.1 සංවර්ධන සැලැස්මෙහි දැක්ම

"කොළඹ සුහුරු සේද නගරය"

4.2 දැක්මේ ප්‍රකාශනය

මහරගම ප්‍රදේශය සඳහා වන ඉදිරි දැක්ම වනුයේ නගරයේ රෙදිපිළි ව්‍යාපාරය හේතුවෙන් ඇති කරගෙන ඇත්තා වූ අනන්‍යතාව ත්‍රීවුර කරගනිමින් ප්‍රදේශයේ අනෙකුත් ගමනාගමන හා පාරිසරික විභවතාවයන් ඔප්නංවා ශ්‍රී ලංකාවේ රෙදිපිළි වෙනුවෙන් සුවිශේෂ ප්‍රතිරූපයක් සහිත ආකර්ශනීය සුහුරු නගරයක් බවට පත්කර ගැනීමයි.

මෙම සැලස්ම ක්‍රියාත්මක කිරීම තුලින් උත්ශ්‍රේණිගත උපයෝගිතා සේවා සහ යටිතල පහසුකම් වලින් සමන්විත, ආරක්ෂිත සුවපහසු වටපිටාවක් සහිත ආකර්ශනීය නේවාසික නගරයක් බවට පත් කිරීම අදහස් කරයි. අනාගතයේදී, මුළු මහරගම ප්‍රදේශයම වඩාත් ඵලදායී අයුරින් උපයෝගිතා සේවා සහ යටිතල පහසුකම් පද්ධතීන් මගින් ආවරණය කරනු ලැබෙනු අතර එමගින් නගරයේ ආර්ථික සහ සමාජ කාර්යයන්හි කාර්යක්ෂමතාව උත්ශ්‍රේණිගත කරනු ඇත. තවදුරටත්, ප්‍රදේශය තුළ වඩාත් පහසු වූත්, විවිධ වූත් ප්‍රවාහන මාධ්‍යයන් හා එක්ව ගොඩනැගුණු ප්‍රවාහන පද්ධතියක් මගින් නගරය තුළ හා ඉන් ඔබ්බට සංචරණය වඩා වේගවත් කරනු ඇත.

විශේෂයෙන් ජාතික මට්ටමින් වැදගත්කමක් සහිත සුහුරු සෞඛ්‍ය සේවාවක් සැපයීමට සැලැස්ම තුලින් අපේක්ෂා කෙරේ. තවද ප්‍රදේශයේ සුවිශේෂී විභවතාවයක් වන තෙත්බිම් ආශ්‍රයෙන් අගනුවර සංවර්ධන සැලැස්මේ ද හඳුනාගෙන ඇති පරිදි ආකර්ශනීය තෙත් බිම් නගරයක් බවට මහරගම පත්කිරීමට අදහස් කරයි.

අනාගතයේදී මහරගම ජාතික වශයෙන් රෙදිපිළි සඳහා සුවිශේෂ ප්‍රතිරූපයක් පවත්වා ගනිමින් වඩා වැඩි දියුණු වූත්, උසස් තත්වයෙන් යුතු වූත් ආකර්ශනීය ජීවන පරිසරයක් හා දේපල අවකාශයන් ගෙන් සමන්විත නගරයක් බවට පත්වනු ඇත.

4.3 සංවර්ධන සැලසුමේ ප්‍රධාන අරමුණු

මහරගම සංවර්ධන සැලැස්ම 2022- 2031 හි සැලසුම් දැක්ම වෙත ළඟා වීම සඳහා ප්‍රධාන අරමුණු 04 ක් ගොඩ නගා ඇත.

අරමුණ 01 සුවපහසු නේවාසික නගරයක්

මෙමඟින් අදහස් වන්නේ නාගරීකරණ තදබදයෙන් බැහැර වූ මනුෂ්‍ය වාසයට හිතකර, සියලු පහසුකම් වලින් සපිරි සෞඛ්‍යාරක්ෂිත නේවාසික ප්‍රදේශයක් ඇති කිරීමයි.

අරමුණ 02 කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක්

සමස්ත මහරගම ප්‍රදේශයම ආවරණය වන පරිදි විධිමත් හා කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක් ඇති කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

අරමුණ 03 ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් බවට පත් කිරීම.

මහරගම - පමුණුව ආශ්‍රිතව විශේෂයෙන් රෙදි පිළි කර්මාන්තය සඳහා සහ අනෙකුත් ප්‍රධාන මංසන්ධි ආශ්‍රිතව ආකර්ශනීය ආයෝජන අවස්ථාවන් සඳහා සංවර්ධනය කිරීම මෙමඟින් අදහස් කෙරේ.

අරමුණ 04 තෙත් බිම් සුරක්ෂිත පුරවරයක් ඇති කිරීම.

ස්වභාවික පරිසරය ආරක්ෂා කරමින් සංවර්ධන ඉලක්ක සඳහා ගමන් කිරීමට අවශ්‍ය පරිසරයක් සකස් කිරීම මෙහි මූලික අදහස වේ.

4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අරමුණ 01 සුවපහසු නේවාසික නගරයක්

1. 2031 වර්ෂය වන විට නේවාසික ප්‍රජාව සඳහා කලබලකාරී ස්වභාවයෙන් මිදුණු ආකර්ශනීය නේවාසික කලාපයන් ප්‍රදේශයේ ඇති කිරීමට කටයුතු කිරීම.

2. මහරගම ප්‍රදේශයේ ජීවත්වන අඩු පහසුකම් සහිත ජනතාව ගේ ජීවන මට්ටම අවම ප්‍රමිතීන්ට වඩා වැඩිදියුණු කිරීම.

3. 2031 වර්ෂය වන විට මහරගම ප්‍රදේශයෙහි සියළු නේවාසික කලාපයන් ආවරණය වන පරිදි විවෘත එළිමහන් හා විනෝදාස්වාදාත්මක පහසුකම් මුළු භූමි ප්‍රමාණයෙන් 1.5% (හෙක්ටයාර 50) ලෙස වර්ධනය කිරීමට කටයුතු කිරීම.

4. ප්‍රදේශය තුල සංචරණය වඩාත් පහසු කරමින් මනා අන්තර් සම්බන්ධතාවයකින් යුතු නේවාසික කලාපයක් බිහි කිරීම

අරමුණ 02 කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක්

1. මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් මහාමාර්ග, ද්විත්ව දුම්රිය මාර්ග හා සැහැල්ලු දුම්රිය මාර්ග ඒකාබද්ධ කර ගත් නව අන්තර් භුවමාරු නාගරික ප්‍රදේශයක් බිහි කිරීම හා අනෙකුත් නගර අතර මනා සබඳතාවයක් ඇති කිරීම.

2. වර්ධනය වන ජනගහනයට සාපේක්ෂව ප්‍රදේශයේ ජලය, විදුලිය, විදුලි සංදේශන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආදී යටිතල පහසුකම් සපුරාලීමට අවශ්‍ය පසුබිම සංවර්ධන සැලැස්ම හරහා නිර්මාණය කිරීම.

3. නාවින්න ප්‍රදේශය මූලික කරගත් ක්‍රීඩා නගරයක් බිහි කිරීම සඳහා වන පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

4. තලපත්පිටිය, කොහිලකොටුව හා නාවින්න යන ප්‍රදේශ සුහුරු සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා සංවර්ධනය කිරීම.

අරමුණ 03 ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් බවට පත් කිරීම.

1. පමුණුව ආශ්‍රිතව රෙදිපිළි ව්‍යාපාරය මූලික කර ගනිමින් එහි ගති ලක්ෂණ ඉස්මතු වන පරිදි "Bazar" ආකාරයේ ආකර්ශනීය බවින් අනූන වෙළඳ කලාපයක් බිහි කිරීමට කටයුතු කිරීම.

2. කොට්ටාව,මහරගම, තලවතුගොඩ, විද්‍යාල හන්දිය, යන මංසන්ධි 2031 වර්ෂය වන විට වඩාත් විධිමත් ලෙස සංවර්ධනය කිරීම.

අරමුණ 04 තෙත් බිම් සුරක්ෂිත පුරවරයක් ඇති කිරීම.

1. දැනට පවත්නා තෙත් බිම් අනවසරයෙන් ගොඩ කිරීම් වළක්වාලීම සඳහා වන සැලසුම් රෙගුලාසි සංවර්ධන සැලැස්ම මඟින් සකස් කිරීමට කටයුතු කිරීම.

2. කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිත තෙත් භූමි තිරසාර සංවර්ධනය මත පදනම් ව කෘෂි කර්මාන්තය නඟා සිටුවීම සඳහා ක්‍රියා කිරීම.

3. ජල රැඳවුම් ප්‍රදේශ, ජල පෝෂක ප්‍රදේශ හා අත්හැර දමන ලද තෙත් භූමි ප්‍රදේශයන් පරිසර හිතකාමී හා ජනතාවට ආකර්ෂණීය වන පරිදි සංවර්ධනය කිරීමට ක්‍රියා කිරීම.

05

වන පරිච්ඡේදය

ශදුඅත (SWOT) විශ්ලේෂණය

පරිච්ඡේදය 05

ශදුඅත (SWOT) විශ්ලේෂණය

5.1 විස්තරාත්මක ශදුඅත (SWOT) විශ්ලේෂණය

මහරගම සංවර්ධන සැලැස්ම 2022 -2031 හි දැක්ම වන "කොළඹ සුහුරු සේද නගරය" කරා ළඟාවීම සඳහා සකස් කරන ලද අරමුණු පදනම් කරගනිමින්, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ඇති ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය කර තිබේ.

5.1.1 සුවපහසු නේවාසික නගරයක්

වගුව 5.1 : සුවපහසු නේවාසික නගරයක් සඳහා ශදුඅත විශ්ලේෂණය

5.1.1.1 ශක්‍යතා

1. කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් නාගරික ප්‍රදේශයන් හා සසඳන කළ නාගරිකරණ ලක්ෂණ අවම ප්‍රදේශයක් වීම.
2. සමස්තයක් වශයෙන් ගත් කළ මහරගම නගරාශ්‍රිත ප්‍රදේශයන් හැර අනෙකුත් ග්‍රාම නිලධාරි වසමයන්හි අඩු නේවාසික ඝනත්වයක් දක්නට ලැබීම.
3. අනෙකුත් ප්‍රදේශයන් හා සසඳන කළ කර්මාන්ත වැනි පරිසර දූෂණ ගොඩනැගිලි අවම ප්‍රමාණයක් පවතින ප්‍රදේශයක්වීම.

5.1.1.2 දුබලතා

1. ජනගහන වර්ධනයත් සමග පරිසර සංවේදී කලාපවලට ජනාවාස ව්‍යාප්තවීම හා ඉහළ ඉඩම් මිලක් දක්නට ලැබීම.
2. අවිධිමත් හා අඩු පහසුකම් සහිත ජනාවාස ව්‍යාප්තියක් දක්නට ලැබීම.

5.1.1.3 අවස්ථා

1. මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති රාශියක් මෙම ප්‍රදේශයෙහි ක්‍රියාත්මක කරන බැවින් වැඩි නේවාසික ආකර්ශණයක් හා ජනතාවට නිවාස අවශ්‍යතාව සපුරා ගැනීමට අවස්ථාවක් හිමිවීම.
2. බත්තරමුල්ල නගරයෙහි සියලු රාජ්‍ය ආයතන ස්ථාපිත කිරීමට ඇති සැලැස්ම සමග මහරගම බල ප්‍රදේශය බත්තරමුල්ලට ඉතා ආසන්නව පිහිටා තිබීම තුළින් නේවාසික වර්ධනයට වැඩි ආකර්ශණයක් ඇතිවීම.
3. දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, මහරගම බල ප්‍රදේශයෙහි පිහිටා තිබීම තුළින් ජනතාවට ප්‍රවාහන පහසුකම් වඩාත් ගුණාත්මකව ලබාගැනීමට ඇති හැකියාව.

5.1.1.4 තර්ජන

1. කෘෂිකාර්මික හා අනෙකුත් භූමි හා වගා භූමි නේවාසික කටයුතු සඳහා ශීඝ්‍රයෙන් ගැනීම.
2. ගංවතුර වැනි ස්වාභාවික ආපදා තත්ත්වයන් ඇති වීම.

5.1.1.1 ශක්තීන්

01. කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් නාගරික ප්‍රදේශයන් හා සසඳන කල නාගරීකරණ ලක්ෂණ අවම ප්‍රදේශයක් වීම.

මහරගම, විවිධ භූමි භාවිතයන්ගෙන් සමන්විත වන ප්‍රදේශයකි. මහරගම නගරය රටෙහි විවිධ, වැදගත් ආයතන එනම්, ජාතික පිළිකා රෝහල, ආයුර්වේද පර්යේෂණායතනය, ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, පමුණුව රෙදිපිළි කලාපය ආදින්ගෙන් සමන්විත වන අතර, මහරගම අවට ප්‍රදේශයන් නාගරිකරණයෙන් බැහැර ගති ලක්ෂණ පෙන්නුම් කෙරේ.

මාදිවෙල, රුක්මලේ, මාලපල්ල, මාකුඹුර ආදි ප්‍රදේශයන් කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන කළ අඩු ගොඩනැගිලි ඝනත්වයක් හා කෘෂිකාර්මික කටයුතු සිදුකරමින් නාගරික ගති ලක්ෂණ අවම මට්ටමකින් සංවර්ධනය වන බව පෙනී යයි.

ප්‍රධාන නගර ආශ්‍රිතව ඉතා කුඩා බිම් කොටස් ලෙස (පර්චස් 6) ඉඩම් වෙළඳාම සිදුවුවද නගරයෙන් බැහැරට යන විට එය පර්චස් 15 – 30 දක්වා ප්‍රමාණයක් වන බව පෙනෙන්නට ඇත. එසේම මෙම ප්‍රදේශයන්හි මහා මාර්ග, කාණු පද්ධති ආදි පහසුකම් වඩාත් විධිමත් ලෙස සංවර්ධනය නොවී තිබීම තුළින් ද මෙම ප්‍රදේශයන්හි අර්ධ නාගරික ගති ලක්ෂන දැකගත හැක.

තවද සම්පත් පැතිකඩ ,2019 දැක්වෙන පරිදි මුළු භූමි ප්‍රමාණයෙන් ගෙවතු සඳහා හෙක්ටයාර් 1395 ක් එනම් 36.58% ක ප්‍රමාණයක් වෙන්ව තිබේ. මහරගම නගරයෙන් බැහැරට හා ප්‍රධාන මාර්ගවලින් ඈත් වන විට ප්‍රදේශයේ ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කෙරේ.

02. සමස්ථයක් වශයෙන් ගත්කළ මහරගම නගරාශ්‍රිත ප්‍රදේශ හැර අනෙකුත් ප්‍රදේශයන් අඩු නේවාසික ඝනත්වයක් දක්නට ලැබීම.

කොළඹ දිස්ත්‍රික්කයෙහි අනෙකුත් ප්‍රදේශ හා සසඳන කළ නේවාසික භාවිතය සඳහා මහරගම ප්‍රදේශයට වැඩි ඉල්ලුමක් පවතී. 2019 වර්ෂය සම්පත් පැතිකඩ - මහරගම පරිදි මුළු භූමි ප්‍රමාණයෙන් 46% ක ප්‍රමාණයක් ගොඩනැගිලි සඳහා (නේවාසික හා නේවාසික නොවන) වෙන්ව ඇත. එසේම 2019 වර්ෂයේ ජනගහනය වැඩිම ග්‍රාම නිලධාරි කොට්ඨාශය ලෙස වත්තේගෙදර ද ජනගහනය අඩුම ග්‍රාම නිලධාරි කොට්ටාශය ලෙස රුක්මලේ නැගෙනහිර ප්‍රදේශයද හඳුනාගෙන තිබේ.(සිතියම 5.1)

සිතියම 5.1: මහරගම ප්‍රදේශයේ නිවාස ඝනත්වය



සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය .,2021

03. අනෙකුත් ප්‍රදේශ හා සසඳන කළ කර්මාන්ත වැනි පරිසර දූෂණ ගොඩනැගිලි අවම ප්‍රමාණයක් පවතින ප්‍රදේශයක් වීම.

කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශයන් හා සලකා බලන කල මහරගම ප්‍රදේශයෙහි කර්මාන්ත ප්‍රමාණය අවම මට්ටමක දැකගත හැකිය. හෝමාගම වැනි ප්‍රදේශයන්හි කර්මාන්තපුර පිහිටුවා ඇති මුත් මහරගම කර්මාන්තපුර දක්නට නොමැත.

මහරගම පවතින ප්‍රධාන කර්මාන්ත ලෙස මාකුඹුර සිලෝන් බිස්කට් ලිමිටඩ්, ජැට් හෝල්ඩින්ග්ස් (Jat Holdings), හයිද්‍රාමනි(hydramane), CKT garment, මෙගා හීටර්ස්, ඔරේන්ජ් (Orange) කර්මාන්තයන් හඳුනාගත හැකි අතර, අනෙකුත් බොහෝ කර්මාන්තයන් ඇගළුම් ආශ්‍රිත කර්මාන්ත බව හඳුනාගත හැකිය. එයට අමතරව මුද්‍රණ, පාවහන් නිෂ්පාදනය, විදුලි උපකරණ එකලස් කිරීම, දැව කර්මාන්තය, වාහන සේවා මධ්‍යස්ථාන ආදි ලෙස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිහිටා තිබේ.

මෙම ප්‍රදේශයෙහි පවත්නා කෘෂි කාර්මික ඉඩම් බොහොමයක් තුල තවදුරටත් වගා කටයුතු සිදුකරමින් පවතින අතර කර්මාන්ත විශාල ප්‍රදේශයක පැතිර නොමැතිවීම හේතුවෙන් අවම පරිසර දූෂණයක් දක්නට ලැබේ. නේවාසික ජනතාවට බාධාවක් නොවන පරිද්දෙන් මෙම කර්මාන්ත සිදුකරගෙන යාම හේතුවෙන් මහරගම ප්‍රදේශය නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට වැඩි අවස්ථාවක් හිමිව ඇත.

සම්පත් පැතිකඩ 2019 පරිදි මහරගම බල ප්‍රදේශයෙහි මුළු භූමි ප්‍රමාණයෙන් 46.39% ක ප්‍රමාණක් එනම්, හෙක්ටයාර 1769 ක ප්‍රමාණයක් සංවර්ධනය කළ බිම් ලෙස හඳුනාගෙන ඇත. එසේම කෘෂිකාර්මික ඉඩම් ලෙස ගෙවතු වගා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1359 ක් හා රබර් ඉඩම් හෙක්ටයාර් 14 ක් හා පොල් ඉඩම් හෙක්ටයාර් 06 ක් ලෙසත් පවතින බව හඳුනාගෙන ඇත.

වගුව 5.2 ፡ භූමි පරිහරණ රටාව

භූමි පරිහරණය/භූමි ආවරණය		භූමි ප්‍රමාණය(හෙක්ටයාර්)	මුළු භූමි ප්‍රමාණයේ ප්‍රතිශතය %
සංවර්ධනය කල බිම් (ගොඩනැගිලි සහිත ප්‍රදේශ,නේවාසික ප්‍රදේශ,කාර්මික හා නාගරික ප්‍රදේශ)		1769	46.39
කෘෂිකාර්මික ඉඩම්	ගෙවතු වගා	1359	36.58
	රබර්	14	0.35
	පොල්	06	0.15
	වී	510	13.38
වගුරු බිම්		46	1.21
ජලාශ		24	0.63
වෙනත් බිම් (ගල් සහිත ප්‍රදේශ,හිස් බිම්, වැලි කඳු, ආදී)		49	1.28
එකතුව-මුළු බිම් ප්‍රමාණය		3813	100.0

5.1.1.2 දුබලතා

1. ජනගහන වර්ධනයත් සමග පරිසර සංවේදී කලාපවලට ජනාවාස ව්‍යාප්ත වීම හා ඉහළ ඉඩම් මිළක් දක්නට ලැබීම.

මහරගම නගර සභා බල ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කයට ඉතාමත් ආසන්නව පිහිටීම හේතුවෙන් මෙම ප්‍රදේශයෙහි නේවාසික භාවිතය හා වාණිජ භාවිතය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. නමුත් නාගරික ප්‍රදේශයන් ආශ්‍රිතව පවතින අඩු භූමි ප්‍රමාණය හේතුවෙන් පාරිසරික සංවේදී කලාප ලෙස හඳුනාගෙන ඇති තෙත් හා වගුරු භූමි, කෘෂි කාර්මික භූමි ගොඩ කිරීමට ලක්ව ඇත.

මේ හේතුවෙන් පරිසර සංවේදී කලාපයන් අනවසරයෙන් ගොඩකර නේවාසික හා වාණිජ අවස්ථා සඳහා යොදාගැනීම බහුල වශයෙන් සිදු කෙරේ.එසේම මේ හේතුවෙන් ජල බැස්ම අවිධිමත් වීම හා කාණු පද්ධති අවහිරවීම හේතුවෙන් ගංවතුර තත්ත්වය ඇති වීමට මෙය බලපා තිබේ.

ඒ අනුව වාසයට හිතකර, සෞඛ්‍යාරක්ෂිත නේවාසික ප්‍රදේශයන් ඇතිකිරීම සඳහා මෙය ප්‍රබල බාධාවක් වන බව පැහැදිලිව හඳුනාගත හැකිවේ. තවද යටිතල පහසුකම්හි සංවර්ධනයත් සමග ඉහල ඉඩම් මිලක් පවතින බව සිතියම 5.2 මගින් හඳුනාගත හැක.

2. අවිධිමත් හා අඩු පහසුකම් ජනාවාස ව්‍යාප්තිය

වර්තමානය වන විට මහරගම ප්‍රදේශයේ දක්නට ලැබෙන සීඝ්‍ර සංවර්ධනයත් සමග අවිධිමත් ජනාවාස ව්‍යාප්තියද දක්නට ලැබේ.

දුම්රිය මාර්ගය දෙපස, මිරිහාන, නාවින්න, මාදිවෙල, ප්‍රගතිපුර, සේනාධිලංකාරගම ආදි ප්‍රදේශ මෙලෙස අඩු පහසුකම් ජනාවාස පවතින ප්‍රදේශ ලෙස හඳුනාගත හැකිවේ. මෙය කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ එනම්, මෝදර, මට්ටක්කුලිය, බ්ලූමැන්ඩල්, කොළොන්නාව, ආදි ප්‍රදේශ තරම් ඉතා ඉහළ ජන ඝනත්වයකින් යුත් ජනාවාස නොවන මුත් පවතින ජනාවාස ව්‍යාප්ත වීමේ ඉඩකඩ පවතී.

සිතියම 5.2 : ඉඩම් වටිනාකම, මහරගම



සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය .,2021

5.1.1.3 අවස්ථා

1. මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති මෙම ප්‍රදේශයෙහි ක්‍රියාත්මක කිරීම.

වර්තමානය වන විට මහරගම බල ප්‍රදේශයෙහි සීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනයට සාපේක්ෂව අදාළ නේවාසික ඉල්ලුම සැපයීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතීන් කිහිපයක්ම මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක කර තිබේ.

ඒ යටතේ කලල්ගොඩ, වීර මාවත, කොට්ටාව කුලසෙවණ වත්ත ආදි ව්‍යාපෘතීන් මේ විටත් ආරම්භ කර ඇති අතර, ඒවා තුළින් නිවාස ඒකක 2000 ක් පමණ ප්‍රමාණයක් සැපයීමට නියමිතය. එසේම තලවතුගොඩ, මාකුඹුර ආදි ව්‍යාපෘති තුළින්ද නිවාස ඒකක ඉදිකිරීමට නියමිතය.

මෙවැනි මහල් නිවාස ඉදිකර නිවාස අවශ්‍යතාව සපුරාලීමට කටයුතු කිරීම හේතුවෙන් නගරයන්ට ඉතා ආසන්නවත්, දැරිය හැකි හා වාරික වශයෙන් මුදල් ගෙවා නිවාස ලබාගැනීමටත් ජනතාවට අවකාශ සැලසේ.

වගුව 5.3: නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරනු ලබන නිවාස ව්‍යාපෘති

අංකය	නිවාස ව්‍යාපෘතිය	නිවාස ඒකක සංඛ්‍යාව
01	කලල්ගොඩ වීර මාවත නිවාස ව්‍යාපෘතිය	500
02	කොට්ටාව,කුලසෙවන වත්ත නිවාස ව්‍යාපෘතිය	300
03	තලපත්පිටිය නිවාස ව්‍යාපෘතිය	250
04	මාකුඹුර නිවාස ව්‍යාපෘතිය	314
05	තලවතුගොඩ නිවාස ව්‍යාපෘතිය	නිවාස ඒකක ගණන තීරණය කර නොමැත.
06	පන්නිපිටිය නිවාස ව්‍යාපෘතිය	ගණනය කර නොමැත

1. බත්තරමුල්ල නගරයෙහි සියළු රාජ්‍ය ආයතන ස්ථාපිත කිරීමට ඇති සැලැස්ම සමග මහරගම බල ප්‍රදේශය බත්තරමුල්ලට ඉතා ආසන්නව පිහිටා තිබීම හේතුවෙන් නේවාසික වර්ධනයට වැඩි ප්‍රවණතාවයක් ඇතිවීම.

ශ්‍රී ලංකාවේ අග නගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හි පිහිටුවා ඇති පාර්ලිමේන්තුව සමග සියළු පරිපාලන ආයතනයන් බත්තරමුල්ල ප්‍රදේශයට ගෙන ඒමේ සැලැස්ම යටතේ බොහෝ රාජ්‍ය ආයතන දැනටමත් බත්තරමුල්ල කේන්ද්‍ර කරගනිමින් පිහිටුවා ඇත. එසේම තවත් රාජ්‍ය ආයතන බොහෝමයක් මෙම ප්‍රදේශයට ගෙන ඒමට සැලසුම් සකස් කරමින් පවතී.

ඒ අනුව, මෙම ආයතනයන්හි සේවය කරනු ලබන ජනතාව සඳහා බත්තරමුල්ල අවට ප්‍රදේශයන් තුළින් නේවාසික සැපයුම ලබාදීමට අවශ්‍යව ඇත. එසේ හෙයින් මහරගම බල ප්‍රදේශය නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා මෙය මහඟු අවස්ථාවක්ව ඇත.

2. **දක්ෂිණ අධිවේගී මාර්ගය,පිටත වටරවුම් මාර්ගය, කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, මහරගම බල ප්‍රදේශයෙහි පිහිටා තිබීම තුළින් ජනතාවට ප්‍රවාහන පහසුකම් වඩාත් ගුණාත්මකව ලබාගැනීමට ඇති හැකියාව.**

කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් හා ප්‍රවාහන පද්ධතියක් පැවතීම නේවාසික ප්‍රදේශයක සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍යයෙන්ම තිබිය යුතු අංගයකි.

ඒ අනුව, මහරගම ප්‍රදේශයෙහි පිහිටා ඇති දක්ෂිණ අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් මාර්ගය කොට්ටාව පිවිසුම, කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හේතුවෙන් මහරගම නේවාසික ජනතාවට අනෙකුත් ප්‍රදේශ කරා පහසුවෙන් ළඟාවීමේ හැකියාව උදා වී ඇත. මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ දත්ත අනුව දිනකට ගාල්ල කරාපිටිය රෝහලෙහි සේවයට යාම සඳහා අවට ප්‍රදේශයන්හි නේවාසිකයින් අධික පිරිසක් මෙහි තම පෞද්ගලික වාහන නතර කර අධිවේගී මාර්ගය ඔස්සේ ගමන් කිරීමේ පහසුකම ලබා ගනී. මහරගම මෙන්ම අනෙකුත් ප්‍රදේශයන්හි නේවාසිකයන්ටද මෙම ස්ථානයෙහි තම වාහන නවතා යැමේ අවස්ථාවන් උදා කරලීමේ අරමුණින් මෑතකාලීනව පාර්ක් & රයිඩ් නමින් ව්‍යාපෘතියක් මෙහිදී ආරම්භ කරන ලද අතර එමගින් විශේෂ බස් රථ සේවාවක් හඳුන්වා දී එමගින් කොටුව හා බම්බලපිටිය දෙසට මාර්ගයන් කිහිපයක් ඔස්සේ සීමිත නැවතුම් පමණක් යොදා ගනිමින් වඩාත් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දීමට කටයුතු කර ඇත

රූපය 5.1: පාර්ක් & රයිඩ් ව්‍යාපෘතිය

මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

5.1.1.4 තර්ජන

1. කෘෂිකාර්මික භූමි, අනෙකුත් තෙත් භූමි හා වගා භූමි නේවාසික කටයුතු සඳහා සීඝ්‍රයෙන් යොදාගැනීම

මහරගම බල ප්‍රදේශය හෙක්ටයාර් 510 ක වී වගාවක් සහිත ඉඩම්, හෙක්ටයාර් 14 ක රබර් හා හෙක්ටයාර් 06 ක පමණ පොල් වගාව සහිත-කෘෂිකාර්මික ඉඩම් වලින් සමන්විත වන ප්‍රදේශයකි. වර්තමානය වන විට පවතින නේවාසික ඉල්ලුමට අනුව මෙම බොහෝ භූමි ප්‍රමාණයන් නේවාසික කටයුතු සඳහා යොදා ගන්නා බව පෙනී යයි.

2019 වර්ෂය මහරගම සම්පත් පැතිකඩ පරිදි කලල්ගොඩ (අක්කර 51 රූඩ් 01 පර්චස් 12.00) , තලවතුගොඩ (අක්කර 25) , දඹහේන (අක්කර 20), ගොඩිගමුව (අක්කර 53) ආදි ලෙස විශාල වශයෙන් පුරන් කුඹුරු පවතින අතර ඒවා නේවාසික හා අනෙකුත් භාවිතයන් සඳහා ගොඩකිරීමේ තර්ජනයට ලක්ව ඇත. එසේම මේ වන විට පොල් හා රබර් ඉඩම් සීග්‍රයෙන් කැබලි කර විකිණීම සිදු කරනු ලබන බව දක්නට ලැබෙන අතර එහෙයින් කෘෂිකාර්මික ඉඩම් අඩු වීමේ තර්ජනයක්ව පවතී.

රූපය 5.2 : රුක්මල්ගම හොරහේන මාර්ගය, 2010 වර්ෂය හා 2020 වර්ෂය

මූලාශ්‍රය: ගූගල් සිතියම් හා ක්ෂේත්‍ර සමීක්ෂණ,2010 හා 2021

2. ගංවතුර වැනි ස්වාභාවික ආපදා තත්ත්වයන් ඇතිවීම.

මහරගම ප්‍රදේශයෙහි ගොඩනැගිලි ඝනත්වය වැඩිවීමත් සමග ස්වාභාවික ජල බස්නා ස්ථාන අවහිර කර ගොඩනැගිලි ඉදිකිරීම සිදුකර ඇත. තවද නිසි පරිදි කාණු පද්ධති ඉදිකිරීම් නොකිරීම නිසාද තෙත් බිම් ප්‍රදේශ ගොඩකිරීම ආදී හේතූන් නිසාද ගංවතුර වැනි ස්වාභාවික ආපදා තත්ත්වයන් ඇතිවීමට බලපා තිබේ. ඒ අනුව 3.2.2 පරිච්ඡේදයේ සාකච්ඡා කල ආකාරයට දැනට මහරගම නාවින්න,තලපත්පිටිය ආදි ප්‍රදේශයන්හි ගංවතුර තත්ත්වයන් ඇතිවන බව දැකගත හැකිවන අතර, ඉදිරියේදී එම තත්වයන් වැඩි වීමක් වනු ඇත.

5.1.2 කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක්

වගුව 5.4 : කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් සඳහා ශුද්‍යත විශ්ලේෂණය

5.1.2.1 ශක්‍යතා

1. හයිලෙවෙල් මාර්ගය, කැළණි වැලි දුම්රිය මාර්ගය හා කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හෙතුවෙන් කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් පැවතීම.
2. රටෙහි ජාතික වශයෙන් වැදගත් වන සෞඛ්‍ය මධ්‍යස්ථාන පිහිටා තිබීම.
3. ජාතික මට්ටමෙන් වැදගත් වන අධ්‍යාපන ආයතන පිහිටා තිබීම.

5.1.2.2 දුර්වලතා

1. නගර මධ්‍යයේ ඉදිකර ඇති බහු මහල් රථ වාහන නැවතුම්පොළ නිසි ලෙස භාවිත නොකිරීම.
2. නාගරික ජන ඝනත්වය වැඩිවීම නිසා ඝන අපද්‍රව්‍ය සහ මලාපවහන කළමනාකරණය සඳහා ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් සහ විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම.

5.1.2.3 අවස්ථා

1. කොළඹ නගරයට ආසන්නව පිහිටීම හේතුවෙන් නගර සංවර්ධන ව්‍යාපෘති රාශියක් මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම.

5.1.2.4 තර්ජන

1. හයිලෙවල් මාර්ගය ඔස්සේ ඇතිවන අධික රථ වාහන තදබදය

5.1.2.1 ශක්තීන්

1. හයිලෙවල් මාර්ගය ,කැළණි වැලි දුම්රිය මාර්ගය හා කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හේතුවෙන් කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් පැවතීම.

හයිලෙවල් මාර්ගය, කැළණිවැලි දුම්රිය මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව පිවිසුම, මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය මත පදනම්ව මහරගම නගරය කේන්ද්‍ර කොට ගනිමින් කොළඹ නගරය තුලට සහ නගරයෙන් පිට ප්‍රදේශ රැසකට ගමන් කල හැකි මගී ප්‍රවාහන සේවාවක් මහරගම නගරය ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. මගී ප්‍රවාහන සේවාව බස් රථ සහ දුම්රිය මගී සේවාව වශයෙන් මූලික ලෙස වර්ගීකරණය කල හැක. දෛනිකව සේවා ස්ථාන කරා යෑම සඳහා විශාල ජන සංඛ්‍යාවක් මහරගම නගරයට දිනපතා සංක්‍රමණය වේ.

තවද කැළණිවැලි දුම්රිය මගී සේවාව මහරගම නගරය හරහා ධාවනය වන අතර දුම්රිය නැවතුම් ස්ථාන 05ක් (නාවින්න, මහරගම කොට්ටාව, පන්නිපිටිය, මාකුඹුර) බල ප්‍රදේශය තුල පිහිටා තිබේ. මෙමගින් විශාල මගීන් ප්‍රමාණයක් දෛනිකව සේවා පහසුකම් ලබා ගනී. කොළඹ, කොට්ටාව, හෝමාගම, පාදුක්ක, අවිස්සාවේල්ල ආදි ප්‍රදේශයන්හි කාර්යාල සේවකයන් විශාල ප්‍රමාණයක් දුම්රිය සේවාව භාවිතා කරනු ලැබේ.

මේ අනුව ප්‍රධාන මහා මාර්ග, දුම්රිය මාර්ග, සහ අධිවේගී මාර්ගයන් මහරගම නගරය හරහා ගමන් කිරීම හේතුවෙන් නගරයේ දීර්ඝකාලීන සංවර්ධනය සඳහා එය මනා පිටුවහලක් වේ.

2. රටෙහි ජාතික වශයෙන් වැදගත් වන සෞඛ්‍ය මධ්‍යස්ථාන පිහිටා තිබීම

මහරගම බල ප්‍රදේශයෙහි ජාතික වශයෙන් වැදගත්කමක් ඇති සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන කිහිපයක් පිහිටා තිබීම හේතුවෙන් ප්‍රදේශයෙහි මෙන්ම රටෙහි අනෙකුත් ප්‍රදේශයන්හි ජනතාවද සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා පැමිණේ. ඒ අනුව මෙම ප්‍රදේශයෙහි පිහිටා ඇති ප්‍රධාන සෞඛ්‍ය මධ්‍යස්ථාන පහත පරිදි වේ.

- ජාතික අපේක්ෂා රෝහල /පිළිකා විද්‍යායතනය
- ශ්‍රී ජයවර්ධනපුර රෝහල
- ආයුර්වේද පර්යේෂණ ආයතනය
- දන්ත හෙදියන් පුහුනු කිරීමේ ආයතනය
- පුද්ගලික රෝහල්

රූපය 5.3 : මහරගම පිහිටි ජාතික වශයෙන් වැදගත් වන සෞඛ්‍ය මධ්‍යස්ථාන

මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

2. ජාතික මට්ටමෙන් වැදගත් වන අධ්‍යාපන ආයතන පිහිටා තිබීම

අධ්‍යාපන පහසුකම් සලකා බලන කළ ප්‍රදේශයෙහි පාසල් 24 ක් පවත්වාගෙන යනු ලබයි. එය "ඒ" හා "බී""වර්ගයේ පාසල් 06 ක් (ජාතික පාසල් ඇතුළත්ව), ""සී" වර්ගයේ පාසල් 02 ක්, "2" වර්ගයේ පාසල් 07 ක් හා "3" වර්ගයේ පාසල් 06 ක් වශයෙනි.

තවද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගුරු අධ්‍යාපනය පීඨය, ජාතික තරුණ සේවා සභාව වැනි ජාතික මට්ටමේ වැදගත් ආයතන මෙහි ස්ථාපිත බැවින්, මහරගම ප්‍රදේශය තුල ඉහල අධ්‍යාපන සේවාවක් ලබා දීමට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි ඇත.

රූපය 5.4 : මහරගම පිහිටි ජාතික මට්ටමෙන් වැදගත් වන අධ්‍යාපන ආයතන

මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

5.1.2.2 දුබලතා

1. නගර මධ්‍යයේ පවතින රථ වාහන නැවතුම්පොල නිසි භාවිතයෙන් තොර වීම

මහරගම යනු ඉතා ජනාකීර්ණ නගරයකි . නගරයට දිනපතා පැමිණෙන වාහන නවතා තැබීමට අවශ්‍ය පහසුකම් සපයන බහු මහල් රථ ගාලක් නගර මධ්‍යයෙහි පිහිටි ජාතික තරුණ සේවා සභාව පිටුපස පිහිටි ඉඩමෙහි ඉදි කරන ලද මුත් එය භාවිත කරන්නන් පිරිස ඉතා සීමිතය. එයට ප්‍රධාන හේතුව ලෙස නගරය රේඛීය ආකාරයෙන් සංවර්ධනය වීම හේතුවෙන් සේවා ලබාගන්නා ස්ථානය ඉදිරිපිට වාහන නවතා තබා යෑමට පාරිභෝගිකයන් පුරුදුව සිටී. මේ හේතුවෙන් මාර්ගය දෙපස වාහන නවතා තැබීම සිදු කරන අතර විශාල වාහන තබදයක් ඇතිවීමට බලපා තිබේ.

2. නාගරික ජන ඝනනත්වය වැඩිවීම නිසා ඝන අපද්‍රව්‍ය, මලාපවාහන හා අපජල බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් සහ විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම.

ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා මුලිකව කටයුතු කරනු ලබන්නේ මහරගම නගර සභාව වන අතර වර්තමානයේදී ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ ස්ථානයක් නොමැති වීම ගැටළුවක්ව පවතී. තවද අනාගතයේදී වැඩි වන ජනගහනයට සාපේක්ෂව ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම, මළාපවාහන හා අපජල බැහැර කිරීම සම්බන්ධව නිසි ක්‍රමවේදයක් හා ප්‍රමාණවත් භූමි හඳුනා ගැනීම අවශ්‍ය වී ඇත.

5.1.2.3 අවස්ථා

1. කොළඹ නගරයට ආසන්නව පිහිටීම හේතුවෙන් නගර සංවර්ධන ව්‍යාපෘති රාශියක් මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම.

කොළඹ නගරයට ආසන්නව මහරගම පිහිටා තිබීමත් ජාතික වශයෙන් වැදගත් ආයතන රාශියක් මහරගම ප්‍රදේශයේ පිහිටා තිබීමත්, පාර්ලිමේන්තු සීමාව හා බත්තරමුල්ල පරිපාලන නගරයට මායිම්ව මහරගම පිහිටා තිබීමත් හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මහරගම සඳහාද සුවිශේෂී අවධානයක් යොමුව ඇත.

කිඹුලාවල හා මාදිවෙල ඉදිකරන ලද Modern paddy field හා මංතීරු උද්‍යානය , බොරලැස්ගමුව වැව භූ දර්ශණ සංවර්ධන ව්‍යාපෘතිය, නාවින්න හා කොට්ටාව නව බස් නැවතුම්පල,මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, යෝජිත ද්විත්ව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කොළඹ මෙට්‍රෝ මාර්ගය (නිල් පැහැති මාර්ගය) ආදි ව්‍යාපෘති මගින් නේවාසික ප්‍රජාව වෙනුවෙන් ප්‍රවාහන හා අනෙකුත් යටි තල පහසුකම් හා අවශ්‍යතා සපයා තිබේ.

රූපය5.5 නගර සංවර්ධන ව්‍යාපෘතීන්

මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

5.1.2.3 තර්ජන

1. **කොළඹ සිට මහරගම ප්‍රදේශයට ප්‍රවේශ වීමට ඇති ප්‍රවේශ මාර්ගයන්හි පවතින රථ වාහන තදබදය**

රථ වාහන තදබදය මහරගම නගරය ආශ්‍රිතව පවතින මූලික ගැටලුවක් වේදී මහරගම නගරයේ රථවාහන තදබදය උදෑසන පෙ .ව. 7.00 සිට පෙ. ව. 9.00 දක්වාත්, දහවල් කාලයේ ප.ව.1.00 සිට ප.ව. 2.00 දක්වා ත් සවස කාලයේ ප.ව.5.00 සිට ප.ව. 6.30 දක්වා දක්නට ලැබේ. නගරයේ පවතින වාණිජ හා ආයතනික කටයුතු ප්‍රධාන ප්‍රවේශ මාර්ග මත පදනම්ව පිහිටා තිබීම මෙම තත්වය වැඩි වීමට හේතුවේ. පස්වරු 5 සිට 6.30 දක්වා පවතින වාහන තදබදය උදෑසන හා දහවල් කාලයේ පවතින තදබදයට වඩා උග්‍ර වේ. නගරයෙන් පිටතට ගමන් කරන වාහන හේතුවෙන් හයිලෙවල් මාර්ගය, නගර මධ්‍යයෙහි පිහිටි මංසන්ධි හා වටරවුම් සවස් කාලය තුලදී අධික රථ වාහන තදබදයට ලක්වේ.

රූපය 5.6 : මාර්ගයන්හි වාහන තදබදය

සඳුදා දින පෙ.ව 8.00 | සඳුදා දින : දහවල් 12.00

සඳුදා දින :ප.ව 2.00 | සඳුදා දින: ප.ව 8.00

මූලාශ්‍රය: ගූගල් සිතියම ,2021

ඒ අනුව, රථ වාහන තදබදය සඳහා බලපා ඇති මූලික හේතූන් පහත පරිදි දැක්විය හැක.

- අධිවේගී මාර්ගය පැවතීම හේතුවෙන් මහරගම නගරය හරහා කොළඹ නගර මධ්‍යයට පිවිසීම සඳහා හයිලෙවල් මාර්ගය භාවිතා කිරීම
- පිවිසුම් මාර්ග ඔස්සේ රේඛීය වාණිජ සංවර්ධනයක් ඇති වීම
- ප්‍රධාන මාර්ග ඔස්සේ පොදු පහසුකම් පැවතීම හේතුවෙන් ජනතාව ප්‍රධාන මාර්ගයේ පිහිටි ව්‍යාපාරික ස්ථාන වෙත ආකර්ශනය වීම.
- රෙදිපිළි ව්‍යාපාරයන් පමුණුව මාර්ගය දෙපස ව්‍යාප්තව තිබීම
- නගර මධ්‍යයේ පවතින සැලසුම් නොකරන ලද මංසන්ධි පැවතීම
- විකල්ප මාර්ග ප්‍රමාණවත් ලෙස සංවර්ධනය වී නොමැති වීම

5.1.3 ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක්

වගුව 5.5 : ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් සඳහා වන ශදුඅත විශ්ලේෂණය

5.1.3.1 ශක්‍යතා

1. පමුණුව ආශ්‍රිතව සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් ව්‍යාපාර රාශියක් පිහිටා තිබීම.
2. ශ්‍රී ලංකාවේ රෙදි පිළි ආශ්‍රිතව ප්‍රසිද්ධියට පත් ප්‍රධාන නගරය මහරගම වීම.
3. අවට ප්‍රදේශයන් සමග පවතින මනා සම්බන්ධය හේතුවෙන් ප්‍රධාන මන්සන්ධි සඳහා වැඩි ජනතා ආකර්ෂණයක් පැවතීම.

5.1.3.2 දුර්වලතා

1. වාණිජ කටයුතු සඳහා පවතින සීමිත ඉඩකඩ හේතුවෙන් අනවසර හා තාවකාලික ස්ථාන රාශියක් මාර්ගය දෙපස, දුම්රිය මාර්ගය දෙපස ඉදිකර තිබීම
2. සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට හා වෙළෙන්දන් හට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.

5.1.3.3 අවස්ථා

1. නව රැකියා අවස්ථා බිහිවීම සහ ආර්ථික සංවර්ධනය.
2. යෝජිත නගර සැලසුම් තුලින් පමුණුව ප්‍රදේශය විධිමත් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම හා එමගින් දෙස් විදෙස් ආකර්ෂණය වැඩි කර ගැනීමට හැකි වීම.

5.1.3.4 තර්ජන

1. වෙළෙන්දන් අතර පවතින විවිධ මත ගැටුම් හා දේශපාලන බලපෑම්

5.1.3.1 ශක්තීන්

1. පමුණුව ආශ්‍රිතව සුළු හා මධ්‍ය පරිමාණ ඇගළුම් ව්‍යාපාර රාශියක් පිහිටා තිබීම

මහරගම නගරය රටෙහි රෙදි පිළි වෙළදාම සදහාම ප්‍රසිද්ධ වූ නගරයකි. වර්තමානය වන විට මහරගම නගරය හා පමුණුව මාර්ගය දෙපස රෙදිපිළි ආශ්‍රිත ව්‍යාපාර විශාල වශයෙන් ව්‍යාප්තව ඇත. මෙම ව්‍යාපාරය උදෑසන කාලය හා දහවල් කාලය තුලදී සිදුවේ. උදෑසන රෙදිපිළි වෙළදාම ප්‍රධාන වශයෙන් නගර මධ්‍යයෙහි පෙ.ව 4.00 සිට පෙ.ව 7.30 පමණ දක්වා කාලය අතරතුර සිදු වන අතර වෙළදුන් 600 ක් පමණ මෙම කාලයෙහි වෙළදාමේ නියුතු වේ.අනතුරුව දහවල් වෙළදාම ආරම්භ වන අතර ප්‍රධාන වශයෙන් පමුණුව මාර්ගය ආශ්‍රිතව වෙළදුන් 1200 ක පමණ ප්‍රමාණයක් වෙළදාමෙහි නියුතු වේ.

රූපය 5.7 ෑ මහරගම නගරය ආශ්‍රිත රෙදිපිළි කර්මාන්තය

මූලාශ්‍රයඃ අන්තර්ජාලය තුලින්

රූපය 5.8 : මහරගම නගරයේ රෙදිපිළි වෙළඳාම ප්‍රධාන වශයෙන් සිදුවන ප්‍රදේශය

සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය .,2021

2. ශ්‍රී ලංකාවේ රෙදි පිළි අශ්‍රිතව ප්‍රසිද්ධියට පත් ප්‍රධාන නගරය මහරගම වීම

ශ්‍රී ලංකාවේ අනෙකුත් නගර හා සසඳන කල මහරගම නගරයෙහි ව්‍යාප්තව ඇති පමුණුව රෙදි පිළි වෙළදාම ජාතික වශයෙන් ප්‍රසිද්ධියක් උසුලනු ලැබේ . අමුද්‍රව්‍ය වෙළදාම, තොග වෙළදාම, නිමි ඇඳුම් වෙළදාම හා කැබලි රෙදි විකිණීම මහා පරිමාණව හා කුඩා පරිමාණයෙන් සිදු වන මෙහි අවම මිලකට ද්‍රව්‍ය මිලදී ගැනීමේ හැකියාව ලැබේ. එබැවින් රටෙහි විවිධ ප්‍රදේශ මගින් එනම් ගාල්ල, මාතර, බදුල්ල , ඇඹිලිපිටිය, රත්නපුර ආදී ප්‍රදේශයන් මගින් පවා රෙදි මිලදී ගැනීම සඳහා ගැනුම්කරුවන් පැමිණෙන අතර ඔවුන් තොග වශයෙන් රෙදි මිලදී ගෙන නගරය හරහා දිවෙන දුර ගමන් සේවා බස් රථ මගින් නැවත සිය ප්‍රදේශයන් බලා යනු ලැබේ.

3. අවට ප්‍රදේශයන් සමග පවතින මනා සම්බන්ධය හේතුවෙන් ප්‍රධාන මංසන්ධි සඳහා වැඩි ජනතා ආකර්ශනයක් පැවතීම

මහරගම නගරය අවට ප්‍රදේශයන් වන දෙහිවල,පිළියන්දල ,නුගේගොඩ,කොට්ටාව, බත්තරමුල්ල ආදී නගරයන් සමග මනාව සම්බන්ධ වී ඇති නගරයකි. තවද හයිලෙවල් මාර්ගය හා පරණ කොට්ටාව මාර්ගය ද කැළණිවැලි දුම්රිය මාර්ගය ද සම්බන්ධ කරගනිමින් ප්‍රධාන මාර්ග ඔස්සේ නගරය ව්‍යාප්තව පවතින හෙයින් ප්‍රධාන මංසන්ධි සඳහා වැඩි ජනතා ආකර්ශනයක් ලැබී තිබේ.

රූපය 5.9: මහරගම නගරය අනෙකුත් ප්‍රදේශ හා වන සම්බන්ධතාවය

සැකසුම : සැලසුම් කණ්ඩායම,කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය .,2021

5.1.3.2 දුබලතා

1. **වාණිජ කටයුතු සඳහා පවතින සීමිත ඉඩකඩ හේතුවෙන් අනවසර හා තාවකාලික ස්ථාන රාශියක් මාර්ගය දෙපස,දුම්රිය මාර්ගය දෙපස ඉදිකර තිබීම.**

මෙම වෙළඳසැල් පමුණුව මාර්ගය දෙපස ,පදික වේදිකා ආක්‍රමණය කර ඇති අතර මේ වන විට දුම්රිය මාර්ගය දෙපසද ව්‍යාප්තව ඇත. මහරගම නගරය හා පමුණුව මාර්ගය අශ්‍රිතව මේ වන විට පහත සඳහන් පරිදි රෙදිපිළි වෙළදාම ව්‍යාප්තව ඇති බව හදුනා ගෙන ඇත.

වගුව 5.6 : මහරගම නගරය හා පමුණුව මාර්ගය අශ්‍රිතව ඇති කඩ සාප්පු ගණන

වර්ගය	ඒකක ගණන
ස්ථිර සාප්පු	520
අර්ධ ව්‍යුහගත සාප්පු	192
තාවකාලික	298
පදික වෙළදුන්	68
වෙනත් වෙළඳසැල් (ආඩාංග විකුණුම් සැල් , කැෆේ ආදිය)	35
එකතුව	1113

මුලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ ,2021

2. **සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට හා වෙළෙන්දන් හට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම**

මහරගම නගරය යනු විශාල දෛනික ජන සංසරණයක් සිදුවන නගරයකි. නමුත් එම ප්‍රමාණයට සරිලන රථ වාහන නැවතීමේ පහසුකම් , සනීපාරක්ෂ පහසුකම් හා විවේක ස්ථාන මහරගම නගරය ආශ්‍රිතව නොපවතී. මේ හේතුවෙන් විවිධ ප්‍රදේශ වලින් මහරගම නගරයට පැමිණෙන ජනයා ඉතා අපහසුතාවයට පත්වේ.

5.1.3.3 අවස්ථා

1. **නව රැකියා අවස්ථා බිහිවීම සහ ආර්ථික සංවර්ධනය**

මහරගම ආශ්‍රිතව විවිධ ආයතන මගින් සිදුකරන මාර්ග සංවර්ධන, නිවාස හා විවිධ ව්‍යාපෘති හේතුවෙන් හා වාණිජ ක්‍රියාකාරකම් හේතුවෙන් රැකියා අවස්ථා රාශියක් බිහි වීමේ අවස්ථාව පවතී. එබැවින් ඍජු හා වක්‍ර රැකියා බිහිවන අතර එමගින් ප්‍රදේශයෙහි ආර්ථිකයට මහත් පිටිවහලක් වේ.

2. **යෝජිත නගර සැලසුම් තුලින් පමුණුව ප්‍රදේශය විධිමත් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම හා එමගින් දෙස් විදෙස් ආකර්ෂණය වැඩි කර ගැනීමට හැකි වීම**

අඩු මිලට නිමි ඇඳුම්, රෙදිපිළි සහ කපන ලද රෙදිපිළි නිෂ්පාදන ලබා ගැනීමට හැකිවීම හේතුවෙන් දෙස් විදෙස් ආකර්ෂණය වැඩිකර ගැනීමට හැකි වී තිබේ. වෙළෙන්දන් විශාල ප්‍රමාණයක් මෙම ප්‍රදේශයට තොග සහ සිල්ලර වෙළදාම සදහා පැමිණේ. සමහර විදේශීය සංචාරකයින් ද මෙම ස්ථානයට ලාභ මිල හේතුවෙන් රෙදි පිලි ලබා ගැනීමට පැමිණීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

5.1.3.4 තර්ජන

1. වෙළඳුන් විවිධ අදහස් දැරීම සහ දේශපාලන වශයෙන් පවතින ගැටළු

මහරගම රෙදිපිළි කර්මාන්තය ජාතික මට්ටමේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කරමින් සංවර්ධනය කිරීමට පසුගිය කාලයේ පැවති විවිධ රජයන් විසින් යෝජනා ඉදිරිපත් වුවද මේ වන තුරු එම අරමුණ සාක්ෂාත් කරගැනීමට නොහැකි වී ඇත .මේ සඳහා බලපෑ මූලික හේතූන් කිහිපයකි.

- විවිධ දේශපාලන මතවාද පැවතීම සහ රාජ්‍ය ප්‍රතිපත්තින් වෙනස්වීම් හා අවධානයක් නොමැති වීම
- රෙදිපිළි කර්මාන්තයේ නියැලෙන ජනතාව විවිධ අදහස් දැරීම සහ වෙළඳාම් සම්බන්ධයෙන් ඇතිවන දුෂ්කරතා
- රෙදිපිළි ව්‍යාපාර සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කර ගැනීමට අසමත් වීම
- පමුනුව මාර්ගයේ ගොඩනැගිලි සීමාව තුල අනවසර ඉදිකිරීම් බහුලව සිදු කිරීම සහ රථවාහන ගාල් කිරීමේ ඉඩ පහසුකම් නොමැති වීම.

5.1.4 තෙත්බිම් සුරක්ෂිත හරිත පුරවරයක් ඇතිකිරීම.

වගුව 5.7 : තෙත්බිම් සුරක්ෂිත හරිත පුරවරයක් ඇතිකිරීම සඳහා වන ශක්‍යතා විශ්ලේෂණය

5.1.3.1 ශක්‍යතා

1. කොළඹ නගරය ආශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශයන් වැඩි ප්‍රමාණයක් මහරගම නගර සභා බල ප්‍රදේශය තුල පැවතීම.
2. රැම්සාර් සම්මුතිය (COP13) මගින් කොළඹ නගරය තෙත් බිම් නගරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

5.1.3.2 දුබලතා

1. ස්වභාවික ජලමාර්ග වෙත අක්‍රමවත් ලෙස අපද්‍රව්‍යය බැහැරලීම් හේතුවෙන් ජලය බැසයාමේ මාර්ග අවහිර වීම .
2. ජනගහනය වැඩිවීමට සාපේක්ෂව විනෝදාස්වාදය සඳහා ක්‍රීඩා පිටි සහ විනෝද උද්‍යාන සඳහා වෙන්කර ඇති ඉඩ ප්‍රමාණය සාපේක්ෂව අඩුවීම.

5.1.3.3 අවස්ථා

1. දැනට ක්‍රියාත්මක හරිත ව්‍යාපෘති (Modern paddy field Madiwela)
2. Bird park ව්‍යාපෘතිය
3. දෙල්ගහවත්ත නාගරික කෘෂි කාර්මික උද්‍යානය
4. කලල්ගොඩ තෙත් බිම් ව්‍යාපෘතිය

5.1.3.4 තර්ජන

1. නගරය ආශ්‍රිත තෙත් බිම් සහ කුඹුරු ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් අනවසර ලෙස පිරවීම සහ මානව ජනාවාස ඉදිකිරීම.
2. අනවසර ඉදිකිරීම් සහ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ස්වාභාවික ජල මාර්ග වලට බාධා ඇති කර තිබීම.

5.1.4.1 ශක්තීන්

1. **කොළඹ නගරය ආශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශයන් වැඩි ප්‍රමාණයක් මහරගම නගර සභා බල ප්‍රදේශය තුල පැවතීම.**

මහරගම නාගරික බල ප්‍රදේශය තුළ ප්‍රධාන ලෙස හඳුනාගත හැකි පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස කුඹුරු වගාබිම් හැඳින්විය හැකි ය. ප්‍රමාණයෙන් හෙක්ටයාර 462.89 ක පිහිටා ඇති කුඹුරු වගාබිම් සැලසුම් බල ප්‍රදේශය පුරා පැතිර පවතී. සැලසුම් බල ප්‍රදේශයේ උතුරට සහ බටහිර දෙසට වන්නට හෙක්ටයාර 67.4 ක් පමණ ප්‍රමාණයක් තුල පවතින "වගුරුබිම්" ද දැකගත හැකිය. මෙයට අමතරව හෙක්ටයාර 37.2 ක් පමණ වන ප්‍රමාණයක පැතිර පවතින ජලාශද හෙක්ටයාර 1.7ක භූමි ප්‍රමාණයක පවතින අත්හරින ලද කුඹුරු බිම්ද පාරිසරික සංවේදී ප්‍රදේශ අතර වේ.

2. **රැම්සාර් සම්මුතිය (COP13) මගින් කොළඹ නගරය තෙත් බිම් නගරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

2018 ඔක්තෝබර් 25 දින ඩුබායි හි පැවති තෙත්බිම් පිළිබඳ රැම්සාර් සම්මුතියේ (COP13) 13 වන සමුළුවේදී ලොව පුරා පවතින නගර 18 ක් තෙත්බිම් නගර ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර කොළඹ අවට පවත්නා තෙත් බිම් මඟින් සිදුවන පාරිසරික සේවයේ ඇති වැදගත්කම සැළකිල්ලට ගෙන දකුණු ආසියාවේ එකම තෙත්බිම් නගරය බවට කොළඹ පත්විය. ඒ යටතේ තෙත්බිම් අවට හා තෙත්බිම් මත යැපෙන නගර තිරසාර ලෙස භාවිතා කිරීමට දිරිගන්වනු ලැබේ.

5.1.4.2 දුබලතා

1. **ස්වභාවික ජලමාර්ග වෙත අක්‍රමවත් ලෙස අපද්‍රව්‍යය බැහැරලීම් හේතුවෙන් ජලය බැසයාමේ මාර්ග අවහිර වීම**

නාගරික කැලිකසල බැහැර කරලීම උග්‍ර ගැටලුවක්ව පවතින වර්තමානයෙහි එම තත්වය මහරගම ප්‍රදේශයෙහිද දැක ගත හැකිය. ජල පෝෂක ප්‍රදේශ , වගුරු හා අත්හැර දමන ලද කුඹුරු ඉඩම්හි කැලි කසල බැහැර කිරීම හේතුවෙන් විවිධ ලෙඩ රෝග හා උවදුරු ඇති වීම කෙරෙහිද බලපා තිබේ. තවද වර්ෂා කාලයන්හි එම ජල ප්‍රදේශයන් අවහිර වීම හේතුවෙන් ගංවතුර තත්වයන් ඇති වීමටද බලපා තිබේ. පහත සිතියමෙහි පරිදි එම ප්‍රදේශයන් හඳුනා ගත හැක.

සිතියම 5.3 : හදිසි ගංවතුර ආපදා සිදුවූ ස්ථාන



මූලාශ්‍රය : සැකසුම : සැලසුම් කණ්ඩායම ,පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2021

2. ජනගහනය වැඩිවීමට සාපේක්ෂව විනෝදාස්වාදය සඳහා ක්‍රීඩා පිටි සහ විනෝද උද්‍යාන සඳහා වෙන්කර ඇති ඉඩ ප්‍රමාණය සාපේක්ෂව අඩුවීම.

2016 වර්ෂයෙහි හා 2019 වර්ෂයෙහි සම්පත් පැතිකඩ මහරගම ,පරිදි 2016 වසරට සාපේක්ෂව 2019 වසර වන විට ජනගහනය 4837 ක ප්‍රමාණයකින් වැඩි වී ඇත. ඒ අනුව, 2016 ජන ඝනත්වය (වර්ග කිලෝ මීටරයකට) වූ 5258 ක ප්‍රමාණය 2019 වර්ෂය වන වර්ග කිලෝ මීටරයකට 5381 දක්වා ඉහළ ගොස් ඇත.

එබැවින් මෙම වැඩිවන ප්‍රාදේශීය ජනගහනය හා දෛනික සංසරණ ජනගහනයට සාපේක්ෂව විනෝදාස්වාදය සපයන උද්‍යාන හා විවෘත එළිමහන් භූමින්හි අවශ්‍යතාවයක් පැන නැගී ඇත.

ප්‍රධාන වශයෙන් මහරගම නගරය අවට සලකා බලන කල ජනගහනය වැඩිවීමට සාපේක්ෂව විවෘත එළිමහන්, ක්‍රීඩා භූමි, විවේක ස්ථාන, විනෝදාස්වාද උද්‍යාන වැනි කටයුතු සඳහා වෙන්කර ඇති ඉඩ ප්‍රමාණය සාපේක්ෂව අඩුවීම ප්‍රදේශයෙහි දක්නට ලැබෙන දුර්වලතාවයකි. එබැවින්, මේ පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීම අත්‍යාවශ්‍ය වේ.

මහරගම බල ප්‍රදේශයෙහි හෙක්ටර්යාර් 24.82 ක ප්‍රමාණයක ක්‍රීඩා පිටි සහ උද්‍යාන 28 ක ප්‍රමාණයක් පවතී.නාගරික සංවර්ධන අධිකාරිය මගින් පිළියෙළ කරන ලද ක්‍රීඩා පිටි හා පොදු අවකාශ සඳහා වන මාර්ගෝපදේශයේහි පුද්ගලයන් 1000ක ප්‍රමාණයකට හෙක්ටයාර් 0.75 ක ප්‍රමාණයක් අවශ්‍ය බව සඳහන් කර ඇත. ඒ අනුව 2019 වන විට මහරගම බල ප්‍රදේශයෙහි 212,014 ක ජන සංඛ්‍යාවක් වාසය කරනු ලබන අතර සාපේක්ෂ පොදු විවෘත අවකාශයන් ප්‍රමාණය පහල මට්ටමක පවතී.

5.1.4.3 අවස්ථා

1. දැනට ක්‍රියාත්මක හරිත ව්‍යාපෘති (Modern paddy field Madiwela)
2. Bird park ව්‍යාපෘතිය
3. දෙල්ගහවත්ත නාගරික කෘෂි කාර්මික උද්‍යානය
4. කලල්ගොඩ තෙත් බිම් ව්‍යාපෘතිය

මහරගම නගර සහා බල ප්‍රදේශය තුල මේ වන විට නාගරික කෘෂිකාර්මික ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව කිඹුලාවල හා මාදිවෙල ප්‍රදේශයෙහි සිදු කරන ලද සංවර්ධනයන් සඳහා ඉහල ජනතා ආකර්ශනයක් ලැබෙමින් පවතින අතර ඒ හේතුවෙන් පුරන් වී තිබුණු කුඹුරු නැවත වගා කිරීම ආරම්භ කොට ඇත. කාබනික කෘෂිකාර්මික වගා ක්‍රම යොදා ගනිමින් සිදු කරනු ලබන මෙම ගොවිතැන් කටයුතු හේතුවෙන් අවට ජනතාවට ගුණාත්මක තත්ත්වයකින් යුක්ත ආහාර ලබා ගැනීමේ හැකියාව පවතී. එසේම මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වන බැවින් අනෙකුත් ප්‍රදේශ සඳහාද මෙවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලෙස ජනතාව අදහස් සහ යෝජනා ඉදිරිපත් කර ඇත.

රූපය 5.10: (වම්පස) මාදිවෙල (දකුණුපස)කිඹුලාවල නාගරික කෘෂිකාර්මික ව්‍යාපෘති

මූලාශ්‍රය : අන්තර්ජාලය තුලින්

5.1.4.4 තර්ජන

1. **නගරය ආශ්‍රිත තෙත් බිම් සහ කුඹුරු ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් අනවසර ලෙස පිරවීම සහ මානව ජනාවාස ඉදිකිරීම.**

මහරගම බල ප්‍රදේශය ආශ්‍රිත තෙත් බිම් පිළිබඳ සැලකීමේදී 2008-2015 කාලය තුලදී 10.79% ක ප්‍රමාණයකින් තෙත් භූමින් අඩු වී ඇති බව පහත වගුව මගින් හා සිතියම් මගින් පෙනී යයි.

වගුව 5.8 : මහරගම ප්‍රදේශයේ හරිත ප්‍රදේශවල වෙනස්වීම

පළාත් පාලන ආයතනය	හරිත ප්‍රදේශය -2008 (Km2)	හරිත ප්‍රදේශය 2015 (Km2)	වෙනස්වීම (Km2)	ප්‍රතිශතය (%)
මහරගම	35.649	31.802	-3.847	10.79

සිතියම 5.4 : මහරගම ප්‍රදේශයේ හරිත ප්‍රදේශවල වෙනස්වීම



මූලාශ්‍රයඃ අගනගර සංවර්ධන සැලැස්ම, නාගරික සංවර්ධන අධිකාරිය, 2019

2. අනවසර ඉදිකිරීම් සහ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ස්වාභාවික ජල මාර්ග වලට බාධා ඇති කර තිබීම

තෙත් බිම් ආශ්‍රිත ප්‍රදේශයන්හි සිදු වන අනවසර ගොඩ කිරීම් හේතුවෙන් ස්වභාවික ජල මාර්ගයන් අවහිර වී තිබේ. එසේම ප්‍රධාන ඇල මාර්ග හා අතුරු ඇල මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ජලාපවහනය නිසි පරිදි සිදු නොවීම හා ඒවායේ ආක්‍රමණකාරී පැලෑටි බහුලව තිබීම නිසා ජල බැස්ම තවදුරටත් අවහිරවීම සිදු වේ.මේ හේතුවෙන් නාවින්න , තලපත්පිටිය ආදී ප්‍රදේශයන්හි ගංවතුර තත්වයන් ඇතිවේ.

06

වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්ම

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

6.1 සංකල්පීය සැලැස්ම

මහරගම නගරය එහි අනාගත දැක්ම වන "කොළඹ සුහුරු සේද නගරය" යන දස අවුරුදු දැක්ම කරා යොමු කිරීමට අවශ්‍ය කරන අපේක්ෂිත නගර පරිවර්තනය පුබුදුවාලීමට අවශ්‍ය නිවැරදි ප්‍රවේශයට අවතීර්ණ වීම ආරම්භ වූයේ මහරගම නගරය සඳහා සංකල්පිත සැලැස්මක් ගොඩනැගීමත් සමගය.

සුවපහසු නේවාසික නගරයක් බිහි කිරීම, කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් බිහි කිරීම, ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් ලෙස සංවර්ධනය කිරීම, සහ තෙත් බිම් සුරක්ෂිත පුරවරයක් ඇති කිරීම යන ප්‍රධාන අරමුණු 04 ක් මත පදනම්ව මහරගම නගරය සඳහා වන සංකල්පිත සැලස්ම සකස් කරන ලදී.

ඒ අනුව හයිලෙවල් මාර්ගය ප්‍රධාන සංවර්ධන කොරිඩෝව ලෙසත් මාකුඹුර, කොට්ටාව, මහරගම හා පමුණුව මාර්ගය, තලවතුගොඩ සහ විද්‍යාල හන්දිය එකිනෙකට අනන්‍ය වූ (අන්තර් හුවමාරු නාගරිකය, නවීන ව්‍යාපාර හා වාණිජමය මධ්‍යස්ථානය, නිර්මාණාත්මක ව්‍යාපාර මධ්‍යස්ථානය, හරිත වාණිජ මධ්‍යස්ථාන) ආර්ථික සංවර්ධන මධ්‍යස්ථාන ලෙසත් සංවර්ධනය කිරීමට හදුනා ගන්නා ලදී. ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන ශ්‍රී ජයවර්ධනපුර රෝහල, අපේක්ෂා රෝහල සහ නාවින්න ආයුර්වේද රෝහල මුලික කරගනිමින් එම ප්‍රදේශ සුහුරු සෞඛ්‍ය මධ්‍යස්ථාන බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

පන්නිපිටිය - මාලඹේ, කොට්ටාව - මාලඹේ, සහ අතුරුගිරිය මාර්ග ප්‍රධාන කොටගත් ප්‍රදේශ හරිත නේවාසික ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමටද තලවතුගොඩ හරිත වාණිජ මධ්‍යස්ථානය හා පන්නිපිටිය යා කෙරන බත්තරමුල්ල පන්නිපිටිය මාර්ගය මුලික කොටගත් ප්‍රදේශය පරිපාලන කටයුතු සඳහා සංවර්ධනයටද හදුනා ගන්නා ලදී.

එහිදී ප්‍රදේශය පුරා විසිර පවතින කුඹුරු සහ තෙත්බිම් හි අඛණ්ඩතාව ආරක්ෂාකරමින් නේවාසිකයන් සඳහා අවශ්‍ය කෘෂිකාර්මික හා පොදු එළිමහන් අවකාශය සංවර්ධනය කිරීමටද සැලැස්ම තුලින් අපේක්ෂිතය.

රූපය 6.1 : 2031 මහරගම නගරය සඳහා සංකල්පිත සැලැස්ම



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.2 මහරගම සංවර්ධන සැලසුමෙහි සංයුතිය

සමස්ත මහරගම සංවර්ධන සැලැස්ම පහත විස්තර කර ඇති උපායමාර්ග හයකින් සමන්විත වේ. තිරසාර සංවර්ධනය සහ සුහුරු නගර සංකල්ප වැනි මූලික මූලධර්ම මත පදනම් වෙමින් ඒවා යෝජනා කොට ඇත. 'තිරසාර නගර සහ ප්‍රජාවන්' යන 11 වන ගෝලීය තිරසාර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා මෙම සියලු උපාය මාර්ග සාමූහිකව දායක වේ.

(1) අවකාශීය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

මහරගම නගරයෙහි අනාගත සංවර්ධනය ඉහල, මධ්‍යම සහ අඩු ඝනත්වයෙන් යුක්ත වාණිජ, නේවාසික සහ මිශ්‍ර සංවර්ධන කලාපයන්ගෙන් සහ තෙත්බිම් කලාප වලින් සමන්විත වනු ඇත.

මීට අමතරව පාර්ලිමේන්තු විශේෂිත රෙගුලාසි අදාල වන ප්‍රදේශයන්හි ඊට අදාල වන රෙගුලාසීන් හා ගොඩනැගිලි උස පාලනයන් සිදුකරනු ඇත.

(2) ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

ඉහත පරිච්ඡේදයන්හි හඳුනා ගත් ආකාරයට මෙම ප්‍රදේශය රටේ අනෙකුත් ජනාකීර්ණ ප්‍රදේශ යාකෙරන ස්ථානයක පිහිටා ඇති බැවින් ජාතික වශයෙන් වැදගත්වන අන්තර් ප්‍රවාහන සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයකින්ම පහසුකම් ලබාගැනීමට අපේක්ෂිතය.

තවද ප්‍රවාහන සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රදේශයේ අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමටත් නේවාසික ජනගහනයට වඩාත් සුමට වූ ගමනාගමන පහසුකම් ලබාදීමටත් අරමුණු කෙරේ.

(3) ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

හයිලෙවල් මාර්ගය පදනම් කරගනිමින් ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ සංවර්ධනය සිදුකිරීම අරමුණු කොටගෙන ඇත. මාකුඹුර, කොට්ටාව, හා මහරගම එම මාර්ගයේ ප්‍රධාන ආර්ථික සංවර්ධන මංසන්ධි වේ. එහිදී ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ පළමු බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය සේ සැලකෙන මාකුඹුර බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය මූලික කරගනිමින් මාකුඹුර මංසන්ධිය අන්තර් හුවමාරු නාගරිකයක්ද, ප්‍රදේශයේ නේවාසිකයන්ට හා සංචරණ ජනගහනයට සියලු දෛනික අවශ්‍යතා සපුරගතහැකි ලෙස කොට්ටාව නවීන ව්‍යාපාර හා වාණිජමය මධ්‍යස්ථානයක් ලෙසද ජාතික වශයෙන් ආකර්ශනීය රෙදිපිළි කර්මාන්තය මූලික කොටගෙන මහරගම නිර්මාණාත්මක ව්‍යාපාර මධ්‍යස්ථානයක් ලෙසද සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව තලවතුගොඩ ප්‍රධාන හරිත වාණිජ මධ්‍යස්ථානයක් ලෙසද විද්‍යාල හන්දිය මංසන්ධි ආධාරක වාණිජ මංසන්ධියක් ලෙසද සංවර්ධනය කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

(4) ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

ප්‍රදේශයේ නේවාසික භාවිතයන්ට වඩාත් යෝග්‍ය ප්‍රදේශ හඳුන්වාදීම, නේවාසිකයන්ට අවශ්‍ය භෞතික යටිතල පහසුකම්, සමාජීය යටිතල පහසුකම් සහ එළිමහන් මහජන විනෝදාත්මක ස්ථාන ඇතිකිරීම මගින් සුවපහසු ආකර්ශනීය නේවාසික වටපිටාවක් ඇති කිරීමට මෙම සැලැස්ම මගින් අපේක්ෂා කෙරේ.

(5) අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම

නගරය තුළ ජීවත් වන සහ පිටතින් පැමිණෙන ප්‍රජාවට ප්‍රමාණවත් පරිදි සමාජ යටිතල පහසුකම් සැපයීම, නගරයේ සමාජ ආර්ථික සම දේශපාලන ක්‍රියාවලීන්හි මෘදු ගලා යාම තහවුරු කිරීම සහ සමස්ත වශයෙන් කාර්යක්ෂම අපරව්‍යුහ පහසුකම් ජාලකරණයක් ඇති කිරීම මෙම සැලැස්ම මගින් සිදු කෙරේ.

(6) තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා මහරගම නගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත් බිම් යොදා ගැනීම, ගංවතුර ආපදා අවම කිරීම, ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූ දර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම හා යෝජිත සංවර්ධන අවශ්‍යතාවයට ගැලපෙන පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු සංවර්ධනය කිරීම මෙම උපායමාර්ගය තුළින් අරමුණු කෙරේ.

6.3. අවකාශීය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

6.3.1 හැඳින්වීම

ඕනෑම නගර සංවර්ධන සැලැස්මක අවකාශීය සංවර්ධන සැලැස්ම මූලික ස්ථානයක් ලබා ගන්නා අතර, එය නගරය කෙසේ විය යුතුද යන්න පිළිබඳ මූලික අඩිතාලම දමනු ලබයි. අවකාශීය සංවර්ධන සැලැස්මෙහි මූලික කර්තව්‍යයන් දෙකක් වනුයේ, නගරය සඳහා වඩාත් ගැළපෙන නාගරික අවකාශීය විකාශනය හඳුනා ගැනීම සහ එය භූමිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමය.

6.3.2 අරමුණ

මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අවකාශීය සංවර්ධන සැලැස්මෙහි මූලික අරමුණ වනුයේ මහරගම ප්‍රදේශය සඳහා වඩාත් උචිත අවකාශීය ව්‍යුහය, ඝනත්වයේ රටාවන්, ප්‍රමුඛ භාවිතයන් සහ අනෙකුත් ලක්ෂණයන් මත පදනම්ව තීරණය කිරීම සහ අහිතකර පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කර ගනිමින් යහපත් නාගරික රටාවක් සහ ආවේණික නාගරික ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාම වේ.

6.3.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

මෙම අවකාශීය සංවර්ධන උපායමාර්ගය මහරගම සංවර්ධන සැලැස්මෙහි අරමුණ 01- සුවපහසු නේවාසික නගරයක් සහ අරමුණ 03 සහ 04 ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් බවට පත් කිරීම සහ තෙත් බිම් සුරක්ෂිත පුරවරයක් ඇති කිරීමට සෘජු දායකත්වයක් සලසනු ලැබේ.

6.3.4 විෂය පථය

අවකාශීය සංවර්ධන උපායමාර්ග සැලසුම් රාමුව පහත සඳහන් කරුණු තුළින් සමන්විත වේ.

1) මහරගම ප්‍රදේශය සඳහා යෝජිත ඝනත්ව රටාවන් සහ යෝජිත භූමි පරිභෝජන රටාවන්.
2) අපේක්ෂිත නේවාසික හා සංචරණ ජනගහන පුරෝකථනය.
3) විශේෂිත ගොඩනැගිලි උස පාලන කලාපයන්.

6.3.4.1 මහරගම ප්‍රදේශය සඳහා යෝජිත ඝනත්ව රටාවන් සහ යෝජිත භූමි පරිභෝජන රටාවන්

මහරගම සැලසුම් බල ප්‍රදේශය ප්‍රධාන ඝනත්ව කලාප තුනකින් සමන්විත වේ.

වගුව 6.1: අපේක්ෂිත ඝනත්ව කලාප

කලාපය	යෝජිත භූමි පරිභෝජන රටාව
ඉහල ඝනත්ව කලාපය	ඉහල ඝනත්ව වාණිජ කලාපය
මධ්‍ය ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය ප්‍රවර්ධන වාණිජ කලාපය මධ්‍ය ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය
අඩු ඝනත්ව කලාපය	අඩු ඝනත්ව නේවාසික කලාපය
තෙත් බිම් සුරක්ෂිත කලාපය	තෙත් බිම් සුරක්ෂිත කලාපය

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2021

6.3.4.2 අපේක්ෂිත ජනගහන පුරෝකථනය

ප්‍රදේශයේ පවතින ලක්ෂණයන්, විභවතාවයන් හා අපේක්ෂිත සංවර්ධනයන් සලකා බලා මහරගම නගරය තුල අපේක්ෂිත නේවාසික හා සංචරණ ජනගහණයන් එක් එක් කලාපයන් මූලික කරගනිමින් පුරෝකථනය කරන ලදී.

වගුව 6.2 : මහරගම ප්‍රදේශයේ අපේක්ෂිත නේවාසික හා සංචරණ ජනගහණය

	කලාපය	අපේක්ෂිත නේවාසික ජනගහනය	අපේක්ෂිත සංචරණ ජනගහනය
01	විශේෂ නේවාසික කලාපය	16,670	11,000
02	අඩු ඝනත්ව නේවාසික කලාපය	60,530	17,000
03	මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය	65,320	47,000
04	මධ්‍ය ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	46,720	185,000
05	මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය	8,400	50,000
06	ප්‍රවර්ධන වාණිජ කලාපය	20,740	25,000
07	ඉහල ඝනත්ව වාණිජ කලාපය	17,270	137,000
	එකතුව	235,650	

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2021

සටහන : එක් එක් කලාපය තුල අපේක්ෂිත සමුච්චිත සංචරණ ජනගහනය දක්වා ඇති අතර සියලු කලාපයන් තුල එක් අවස්ථාවකදී අපේක්ෂිත සංචරණ ජනගහනය 200,000 ක් පමණ වේ.

සිතියම 6.1 : මහරගම ප්‍රදේශයේ අපේක්ෂිත ඝනත්ව කලාප



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.2 : මහරගම ප්‍රදේශයේ අපේක්ෂිත භූමි පරිභෝජන රටාව



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.3.4.3 විශේෂිත උස පාලන කලාපයන්

විශේෂ නේවාසික කලාපය (පාර්ලිමේන්තු කලාපයන්)

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආශ්‍රිත පාලිත කලාපයක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහා නගර සභාව හා මහරගම නගර සභාව යන පළාත් පාලන ආයතන අතර පිහිටා ඇත. රටෙහි ප්‍රධාන පරිපාලන ආයතනය වන පාර්ලිමේන්තුවෙහි ආරක්ෂාව සලකා බලා මෙම සංවර්ධන පාලිත කලාපය හඳුන්වා දී ඇති අතර එය උප පාලිත කලාපයන් 3 කට වෙන් කර ඇත. ඒ අනුව පාර්ලිමේන්තුවේ සිට මීටර් 0 – 500 අතර අරයක් සහිත දුරකින් යුතු ප්‍රදේශය සංවර්ධන කලාප I ලෙස හඳුන්වා දී ඇත. මෙම කලාපයෙහි දෙමහල් නිවාස (G+1) සඳහා පමණක් අවසර ලබාදෙනු ලබන අතර ගොඩනැගිල්ලෙහි උපරිම උස අඩි 30 ක් දක්වා සීමා කර ඇත.

දෙවන කලාපය ලෙස මීටර් 500 සිතියම 6.3 මගින් පෙන්වා දී ඇති භෞතික මායිම ඇතුලත් ප්‍රදේශය හඳුන්වා දී ඇති අතර මෙම කලාපයේ තෙමහල් (G+2) ගොඩනැගිලි සඳහා අවසර ලබා දෙනු ලැබේ. එසේම එම ගොඩනැගිල්ලෙහි උපරිම උස අඩි 40 දක්වා සීමා කර ඇත.

තවද, මෙම කලාප දෙකෙහිම ගොඩනැගිලි වල පාර්ලිමේන්තුව දෙසට පියැසි මහල (Roof Top) , සඳළුතල (Balconies), සහ විවෘත ප්‍රදේශ පවත්වාගෙන යාමට ඉඩ ලබා නොදේ.

තුන්වන කලාපය ලෙස දෙවන කලාපයෙහි භෞතික මායිමත් මීටර් 1500 ත් අතර අරයක් සහිත දුරකින් යුතු ප්‍රදේශය හඳුන්වා දී ඇති අතර මෙම කලාපය සඳහා නා.සං.අධි. මඟින් හඳුන්වා දී ඇති රෙගුලාසීන්ට අනුකූල වන සේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ අවකාශ හඳුන්වා දී ඇත.

කෙසේ වතුදු , මෙම කලාපයන් තුනෙහිම සිදුවන සියළු සංවර්ධන කාර්යන්හිදී නා.සං.අධි, අදාළ පළාත් පාලන ආයතනය හා පාර්ලිමේන්තුවෙහි අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙම කරුණු සළකා බලා හා පාර්ලිමේන්තුව ආශ්‍රිත භූමි පරිභෝජනය හා සංවර්ධන පීඩනය ඇතුළු කරුණු අනුව මෙම ප්‍රදේශය විශේෂ නේවාසික කලාපය ලෙස කලාපීකරණ සැලැස්ම මගින් තව දුරටත් හඳුන්වා දී ඇත. එමගින් මෙම ප්‍රදේශය තුල නේවාසික භාවිතය සඳහා වැඩි අවස්ථා හිමිකර දීම හා අඩු ඝනත්ව ප්‍රදේශයක් ලෙස සංවර්ධනය සඳහා දායක කර ගැනීම අරමුණු කරගෙන තිබේ. ඒ අනුව පාර්ලිමේන්තුවේ ප්‍රෞඩත්වය හා සුවිශේෂී බව රැකෙන අයුරින් අවම භූමි පරිභෝජනය පවත්වාගෙන යාම හා අවිධිමත් සංවර්ධනයක් සඳහා වන අවස්ථාව පාලනය කර තිබේ.

සිතියම 6.3 : විශේෂිත උස පාලන කලාපයන්



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.4. ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

6.4.1 හැදින්වීම

සජීවී සහ ක්‍රියාකාරී නගරයක් බිහිකිරීමෙහි ලා එහි අවකාශීය වශයෙන් ස්ථාපනය වී ඇති මාර්ග පද්ධතිය හේතු සාධක වේ. ඒ අනුව යම් නගරයක වින්‍යාසය නේවාසික, වාණිජ, සේවා හෝ වෙනත් ඕනෑම භාවිතයක් වන අවස්ථාවක එහි මාර්ග පද්ධතිය අදාළ නිර්මිත පරිසරයේ වැදගත් අංගයක් වේ.

6.4.2 අරමුණ

ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගයන් හි අරමුණ වන්නේ නගරය තුළ කාර්ය සාධනීය සහ ඵලදායී සංචරණයක් සඳහා උපකාරී වන කාර්යක්‍ෂම මාර්ග ජාලයක් ඇති කිරීමයි. ඕනෑම මාර්ග පද්ධතියක් කාර්යක්‍ෂම වීමේ ලා එහි අවකාශීය ආකෘතියෙහි සංරචක වන විවිධ මාදිලියේ ප්‍රවාහන මාධ්‍යයන් ව්‍යාප්ත වීමත් එහි මනා අන්තර් සම්භන්ධතාවයකින් යුතු මාර්ග ජාලයක් පැවතීමත් හේතු සාධක වේ.

6.4.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

මහරගම සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ වන සුවපහසු නේවාසික නගරයක් සහ දෙවන අරමුණ වන කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් යන අරමුණු සාක්ෂාත් කරගැනීමේ ලා යෝජිත ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගික සැලසුම සෘජුවම දායක වේ.

6.4.4 විෂය පථය

ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගය පහත සඳහන් කරුණු වලින් සමන්විත වේ.

1. නගරයන් අතර ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගයන්
2. නගරය තුල ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගයන්

6.4.4.1. නගරයන් අතර ප්‍රවාහනය සඳහා වන සංවර්ධන උපාය මාර්ගයන්

6.4.4.1.1 කොළඹ මෙට්‍රෝ ව්‍යාපෘතිය (Colombo Metro Project)

6.4.4.1.2 කැළණිවැලි විද්‍යුත් දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

6.4.4.1.1 කොළඹ මෙට්‍රෝ ව්‍යාපෘතිය (Colombo Metro Project)

කොළඹ මෙට්‍රෝ ව්‍යාපෘතිය (රූපය 6.2) යටතේ හුණුපිටිය සිට මාකුඹුර දක්වා දිවෙන නිල් පැහැ දුම්රිය මාර්ගය (Blue Line) මහරගම නගර සභා බල සීමාව හරහා දිවෙන බැවින් එය මෙම ප්‍රදේශයේ ප්‍රවාහන පද්ධතියේ සංවර්ධනය සඳහා දායක වේ. තලවතුගොඩ, කළල්ගොඩ, පන්නිපිටිය, කොට්ටාව, මාකුඹුර යන ප්‍රදේශයන්හි යෝජිත දුම්රිය ස්ථාන ඇතුළුව කිලෝ මීටර් 22.45 ක් දක්වා දිවෙන මෙම සැහැල්ලු දුම්රිය මාර්ගය 18,600 ක් මගින් දෛනිකව භාවිත කරනු ඇති බවට බටහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය තුළින් පුරෝකථනය කර ඇත. යෝජිත දුම්රිය මාර්ගයේ හරස්කඩ රූපය 6.3 පරිදි වේ.

රූපය 6.2: කොළඹ මෙට්‍රෝ ව්‍යාපෘතිය



මූලාශ්‍රය: බටහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය

රූපය 6.3 : යෝජිත දුම්රිය මාර්ගයේ හරස්කඩ



ඒ අනුව පැකේජ අංක 3 යටතේ (නිල් වර්ණයෙන්) දක්වා ඇති හුණුපිටිය සිට අංගොඩ, කොස්වත්ත, තලවතුගොඩ හරහා කොට්ටාව දක්වා යෝජිත මාර්ගය ප්‍රදේශයේ ගමනාගමනය සඳහා විශාල බලපෑමක් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6.4.4.1.2 කැළණිවැලි විද්‍යුත් දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

මෙම මාර්ග ජාලය ප්‍රධාන මාර්ග, වෙරළ තීරය, කැළණි වැලි දුම්රිය මාර්ග සහ පුත්තලම් මාර්ගය යන තදබදයෙන් යුත් ප්‍රධාන මගී කොරිඩෝ හතරක් ආවරණය කරයි. කැළණි වැලි (KV) දුම්රිය මාර්ගය ශ්‍රී ලංකා දුම්රිය මාර්ගයේ ප්‍රධාන කොරිඩෝ හතරෙන් එකකි. මරදාන සිට අවිස්සාවේල්ල දක්වා විහිදෙන මාර්ගය කිලෝමීටර 35.41 ක් වන අතර දෛනික මගීන් ප්‍රමාණය 14,600 කි. එය කොළඹට නැගෙනහිරින් පිහිටි නුගේගොඩ, කොට්ටාව, මහරගම, හෝමාගම සහ අවිස්සාවේල්ල වැනි ඉහළ ජනාකීර්ණ තදාසන්න ප්‍රදේශ කිහිපයක් මහරගම නගර මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කරයි.

ඒ අනුව මෙම යෝජිත ප්‍රවාහන සංවර්ධනයන් මෙම සැලැස්ම තුලට අන්තර්ග්‍රහණය කෙරේ.

රූපය 6.4: යෝජිත විද්‍යුත් දුම්රිය මාර්ග

මූලාශ්‍රයඃ බටහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය

6.4.4.2. නගරය තුල ප්‍රවාහනය සඳහා වන සංවර්ධන උපාය මාර්ගයන්

භූමි පරිභෝජනය හා මාර්ග පද්ධතිය අතර මනා සහසම්භන්ධතාවයක් ඇති කිරීමටත් මාර්ග පද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත්, මධ්‍යම රජය සහ පළාත් පාලන ආයතන මගින් ඉදිකිරීම් කරනු ලබන, නඩත්තු හා කළමනාකරණය වන සැලසුම් සහ ව්‍යාපෘති නිසියාකාරව ස්ථානගත කිරීමේ හැකියාව ලබා දීමටත් සහ මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීමටත් මෙමගින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව මෙම උපාය මාර්ගය යටතේ පහත මාර්ග සංවර්ධනයට සහ පොදු වාහන නැවැත්වීමේ ස්ථාන සංවර්ධනයට සැලසුම් කෙරේ.

වගුව 6.3 : යෝජිත මාර්ග සංවර්ධනයන්

අංකය	මාර්ගය	යෝජිත පළල (අඩි)	මාර්ගයේ දිග	යෝජිත ගොඩනැගිලි සීමාව (අඩි)	ව්‍යාපෘති අංකය
01.	කලල්ගොඩ මාර්ගය	40	කි.මී 2.1 පමණ	30	01
	කලල්ගොඩ හරස් මාර්ගය (වීර මාවත නිවාස ව්‍යාපෘතිය දක්වා	40	කි.මී 1.3 පමණ	30	
02.	වීර මාවත	30	කි.මී 1.4 පමණ	20	02
03.	නාගහවත්ත - පමුණුව 7 වන පටුමග මාර්ගය	30	කි.මී 1.26 පමණ	20	03
04.	පමුණුව 2 වන පටුමග මාර්ගය	30	කි.මී 1 පමණ	20	04
05.	ඇල්හේන මාර්ගය	30	කි.මී 1 පමණ	20	05
06.	මාකුඹුර-බෝගහවිල මාර්ගය	30	කි.මී 2.5 පමණ	20	06
07	මාකුඹුර ඇතුලත මාර්ගය	40	මී 600 පමණ	30	07
08.	ඉසිපතන-වත්තේගෙදර මාර්ගය	30	කි.මී 2 පමණ	20	08
09.	පාසල් මාවත-වැලි පාර	20	කි.මී 1.5 පමණ	20	09
10	ඇහැලපේ මාර්ගය	40	කි.මී 2 පමණ	20	10

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් ආර්ථික කටයුතු ඒකරාශී වී ඇති ප්‍රදේශයන් කේන්ද්‍ර කොටගෙන පහත සඳහන් ස්ථානයන්හි පොදු වාහන නැවැත්වීමේ ස්ථාන සංවර්ධනය කිරීමට හඳුනා ගෙන ඇත.

වගුව 6.4 : යෝජිත පොදු වාහන නැවැත්වීමේ ස්ථාන

අංකය	ස්ථානය	ඉඩම් ප්‍රමාණය	ධාරිතාව (වාහන ගණන)	ව්‍යාපෘති අංකය
01	සියඹලාගහ වත්ත (මිශ්‍ර සංවර්ධනය සමඟ)	රූඩ් 1 පර්චස් 10	20	පසු යොමුව :19
02	කොට්ටාව පොදු රථ ගාල	අක්කර 2	100	පසු යොමුව :13
03	තලවතුගොඩ බහු මහල් රථ ගාල	පර්චස් 60	50	පසු යොමුව :14

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.4: යෝජිත ප්‍රවාහන සංවර්ධන උපායමාර්ග



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.5. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

6.5.1 හැඳින්වීම

ආර්ථික සංවර්ධන උපායමාර්ගය නගරයේ ආර්ථික කටයුතු එහි සමස්ත අවකාශීය සැලසුම සමග අනුබද්ධ කිරීම සහ සමස්ත වශයෙන් නාගරික සංවර්ධන සැලසුමෙහි දැක්ම සාක්ෂාත් කරගැනීමෙහි මාර්ගෝපදේශනය සිදු කරයි. මෙහිදී නගරයෙහි බලාපොරොත්තු වන භෞතික සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ආයෝජන දායකත්වය අත්‍යවශ්‍ය වේ.

6.5.2 අරමුණ

ආර්ථික සංවර්ධන උපායමාර්ගයෙහි අරමුණ වනුයේ,මහරගම ප්‍රදේශය සඳහා වන අපේක්ෂිත දැක්ම සහ භෞතික හැඩය ළඟා කරගැනීමට අවශ්‍ය සැලසුම් කරන ලද වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළවල් සහ ආයෝජන ආකර්ෂණය තහවුරු කිරීමයි. එමෙන්ම නාගරික ආර්ථික සංවර්ධන උපායමාර්ගය යටතේ සිදු කරනු ලබන සියලුම මැදිහත්වීම් වල සමස්ත අරමුණ වනුයේ නගරයේ විවිධ ආර්ථික අංශයන් මගින් දේපළ සඳහා වැඩි වන ඉල්ලුමට සරිලන ඉහළ තත්ත්වයෙන් යුතු ඉඩ ප්‍රස්තාවන් සපයා දීමයි.

නාගරික ආර්ථික සංවර්ධන උපායමාර්ගයෙහි මූලික පරමාර්ථයක් වනුයේ නගරයෙහි පවතින දේපළ, සිල්ලර වෙළඳාම, රෙදිපිළි වෙළදාම, මූල්‍ය හා සේවා සම්බන්ධ පෞද්ගලික ආයතන, සහාධිපත්‍ය ගොඩනැගිලි, සේවා හා සැපයුම් ආශ්‍රිත කර්මාන්ත, සංචාරක කර්මාන්තය වැනි ප්‍රධාන ආර්ථික අංශයන්ට විවෘත කිරීම හා මහරගම ජාතික වශයෙන් වැදගත්වන වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමයි

6.5.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

මහරගම සංවර්ධන සැලැස්මේ "ආර්ථිකමය වශයෙන් ආයෝජනයන් සඳහා ආකර්ශනීය නගරයක් බවට පත් කිරීම" යන තෙවන අරමුණු සාක්ෂාත් කරගැනීමේ ලා යෝජිත ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලසුම සෘජුවම දායක වේ.

6.5.4 විෂය පථය

ආර්ථික සංවර්ධන උපායමාර්ගය පහත සඳහන් අංශ කෙරෙහි මූලික අවධානය යොමු කරයි.

1. ප්‍රධාන මංසන්ධි සංවර්ධනය.
2. තෝරාගත් ස්ථානයන්හි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. පමුණුව ආශ්‍රිතව රෙදිපිළි කර්මාන්තය සඳහා විශේෂිත සංවර්ධනය.

6.5.4.1 ප්‍රධාන මංසන්ධි සංවර්ධනය

ප්‍රධාන මංසන්ධි සංවර්ධනය යටතේ මාකුඹුර, කොට්ටාව, තලවතුගොඩ හා විද්‍යාල හන්දිය යන මංසන්ධීන් සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

6.5.4.1.1 මාකුඹුර මංසන්ධිය සංවර්ධනය

සිතියම 6.5: මාකුඹුර මංසන්ධිය සංවර්ධනය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ පළමු බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය සේ සැලකෙන මාකුඹුර බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය දක්ෂිණ අධිවේගී මාර්ගයට මුහුණ ලා පිහිටි යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති කිහිපයකින් යුතු ව්‍යාපෘති සංකල්පයකි (සිතියම 6.6).

වගුව 6.5 ፡ යෝජිත මාකුඹුර මංසන්ධිය සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	නිම කිරීමට යෝජිත වර්ෂය	සටහන්	ව්‍යාපෘති අංකය
01	බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය	-	නිමකර ඇත	
02	දුම්රිය ස්ථානය	-	නිමකර ඇත	
03	පාර්ක් & රයිඩ්	-	නිමකර ඇත	
04	අමතර වාහන නැවතුම් ස්ථානය	-	නිමකර ඇත	
05	භූ දර්ශන සංවර්ධනය	-	නිමකර ඇත	11
06	සේවා ස්ථානය හා ඉන්ධන පිරවුම් හල	2023	යෝජිතව ඇත	
07	මහල් නිවාස ව්‍යාපෘතිය	2023	අරම්භ කර ඇත	
08	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය හා මහජන චතුරශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	2023	යෝජිතව ඇත	

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.5.4.1.2 කොට්ටාව මංසන්ධිය සංවර්ධනය

නාගරික කටයුතු සඳහා ඉහළ අවධානයක් යොමු කරනු ලබන කොට්ටාව නගරය යටිතල පහසුකම් අනූන වාණිජමය වටිනාකම වැඩි කලාපයක් බවට පත් කිරීමේ අරමුණින් කොට්ටාව මංසන්ධි සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කර ඇත. නගර මධ්‍යයේ නාගරික පරිසරයේ ගුණාත්මකභාවය වැඩි

දියුණු කිරීම තුලින් සැලසුම් සහගතව නගරය සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ (සිතියම 6.7).

වගුව 6.6 ፡ යෝජිත කොට්ටාව මංසන්ධිය සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	නිම කිරීමට යෝජිත වර්ෂය	සටහන්	ව්‍යාපෘති අංකය
01	බස් නැවතුම්පොළ සංවර්ධනය	-	නිමකර ඇත	
02	වාණිජ හා මිශ්‍ර සංවර්ධන ප්‍රදේශය 01	2022		
03	නාගරික උද්‍යානය	2023		
04	වාණිජ හා මිශ්‍ර සංවර්ධන ප්‍රදේශය 02	2024		
05	නාගරික නිවාස ව්‍යාපෘතිය	2025	යෝජිතව ඇත	12
06	මාර්ග පද්ධතිය			
07	කොට්ටාව පොලිසිය ප්‍රතිස්ථාපනය කිරීම			
08	පොදු රථ ගාල			
09	උපයෝගීතා සේවා හා විවෘත ප්‍රදේශ			
10	රේඛීය උද්‍යානය හා ජලය රඳවා ගැනීමේ ප්‍රදේශය			

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.6 : යෝජිත මාකුඹුර මංසන්ධිය සංවර්ධනය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූපය 6.5: සංකල්පිත රූප මාකුඹුර මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය හා මහජන චතුරශ්‍රය සංවර්ධන ව්‍යාපෘතිය

මූලාශ්‍රය: අන්තර්ජාලය තුලින්, 2021

සිතියම 6.7 : යෝජිත කොට්ටාව මංසන්ධිය සංවර්ධනය



රූපය 6.6: යෝජිත කොට්ටාව මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය

මූලාශ්‍රය: අන්තර්ජාලය තුලින්, 2021

6.5.4.1.3 තලවතුගොඩ මංසන්ධිය සංවර්ධනය

අවට ප්‍රදේශයේ ස්වභාවය හා විභවතාවන් සැලකිල්ලට ගනිමින් තලවතුගොඩ මංසන්ධිය හරිත වාණිජ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ (සිතියම 6.8).

වගුව 6.7 ፡ යෝජිත තලවතුගොඩ මංසන්ධි සවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	සටහන්	ව්‍යාපෘති අංකය
01	නාගරික උද්‍යානය	යෝජිතව ඇත	13
02	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	යෝජිතව ඇත	
03	සුඛෝපභෝගී නේවාසික ව්‍යාපෘතිය	යෝජිතව ඇත	
04	බහු මහල් රථ ගාල	යෝජිතව ඇත	
05	පාපැදි ධාවන පථය -(සැහැල්ලු දුම්රිය ඩිපෝව, කිඹුලාවල)	යෝජිතව ඇත	
06	නේවාසික සංවර්ධන කටයුතු	අරම්භ කර ඇත	
07	වාණිජ අවන්හල් හා විනෝදාත්මක කටයුතු	යෝජිතව ඇත	
08	ආදර්ශ කුඹුරු ව්‍යාපෘතිය	යෝජිතව ඇත	
09	ආදර්ශ කුඹුරු ව්‍යාපෘතිය (කිඹුලාවල)	නිමකර ඇත	

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.5.4.1.4 විද්‍යාල හන්දිය මංසන්ධිය සංවර්ධනය

වගුව 6.8 ፡ යෝජිත විද්‍යාල හන්දිය මංසන්ධි සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති අංකය
01	අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම	14
02	විද්‍යාල හන්දිය සිට පාසැල දක්වා පදික වේදිකා සංවර්ධනය	
03	පදික මාරු ප්‍රතිස්ථාපනය	
04	භූ අලංකරණය (කුඩා උද්‍යානය හා ශාක සිටුවීම)	
05	වැසි ජල කානු පද්ධතිය ප්‍රතිස්ථාපනය	
06	ඇවිදීමේ මංතීරු	

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.8: යෝජිත තලවතුගොඩ මංසන්ධි සවර්ධනය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.9 : විද්‍යාල මංසන්ධිය සංවර්ධනය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූපය 6.7 : යෝජිත විද්‍යාල හන්දිය මංසන්ධි සංවර්ධනය



6.5.4.2 තෝරාගත් ස්ථානයන්හි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මංසන්ධි සංවර්ධනයේදී සිදුකරන මිශ්‍ර සංවර්ධනයන්ට අමතරව ප්‍රදේශයේ තෝරා ගත් ස්ථානවල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රදේශය තුල ආයෝජන අවස්ථා වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

වගුව 6.9 : යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන්

අංකය	ව්‍යාපෘතිය සිදුකිරීමට යෝජිත ස්ථානය	ව්‍යාපෘති අංකය
01	පන්නිපිටිය හන්දියේ පිහිටි ඉඩම	15
02	වල්ජම්බුගස්වත්ත ඉඩම	16
03	මහරගම 35 වත්ත ඉඩම	17
04	නාවින්න බස් නැවතුම්පොළ ඉදිරිපිට ඉඩම (Park & Ride සමඟ)	18
05	සියඹලාගහවත්ත ඉඩම (බහුමහල් රථගාල සමඟ)	19

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූපය 6.8 · යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන්



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.5.4.3 පමුණුව ආශ්‍රිතව රෙදිපිළි කර්මාන්තය සඳහා විශේෂිත සංවර්ධනය

වගුව 6.10 ෑ යෝජිත පමුණුව ආශ්‍රිත සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති අංකය
01	පමුණුව නිර්මාණ සංවර්ධන මාර්ගෝපදේශක සැලැස්ම	20

රෙදිපිළි හා ඒ ආශ්‍රිත සියළු අමු ද්‍රව්‍ය එකම ස්ථානයක් තුළින් ලබා ගත හැකි ශ්‍රී ලංකාවේ පවතින එකම ස්ථානය වන පමුණුව රෙදිපිළි කලාපය වඩාත් ආකර්ශනීය සහ මනා සුවපහසු බවකින් යුක්ත වූ සංචාරය කිරීමට වඩාත් ප්‍රියජනක ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් සංවර්ධන මාර්ගෝපදේශක සැලැස්මක් සකස් කලයුතු බවට හඳුනාගෙන තිබේ.

මෙම සැලැස්ම යටතේ පමුණුව රෙදි පිළි කලාපය සංවර්ධනය ප්‍රධාන උපායමාර්ග තුනක් යටතේ සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

1. ඇවිදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම

2. ව්‍යාපාරික ස්ථානයන්හි මුහුණත පෙනුමේ ආකර්ශනීත්වය වැඩි කිරීම

3. අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම

ඇවිදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම

ඇවිදීමේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නාගහවත්ත, දෙල්වත්ත, දඹහේන වැනි විකල්ප මාර්ග දියුණු කිරීම, වාහන ඇතුල් කිරීම පිලිබඳ රථවාහන මාර්ගෝපදේශ හඳුන්වා දීම, රෙදි පිළි වෙළෙඳාම් කෙරෙන සියලු අතුරු මාර්ග ගල් අතුරා සකස් කිරීම, උප මාර්ග වල සෙවණ වැඩි දියුණු කිරීම වැනි උපායමාර්ග යෝජනා කෙරේ (රූපය 6.9).

මුහුණත පෙනුමේ ආකර්ශනීත්වය වැඩි කිරීම

ස්ථිර හා අර්ධ ස්ථිර ව්‍යුහයන්හි මුහුණත පෙනුම වැඩි දියුණු කිරීම, නාම පුවරු සඳහා මාර්ගෝපදේශ හඳුන්වා දීම, හා තාවකාලික ගොඩනැගිලි සහිත ප්‍රදේශ වල කඩ සාප්පු ඉදි කිරීම වැනි උපායමාර්ග තුලින් ප්‍රදේශයේ මුහුණත පෙනුමේ ආකර්ශනීත්වය වැඩි කිරීමට යෝජනා කෙරේ (රූපය 6.10).

අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම

කුඩා උද්‍යාන සංවර්ධනය, කුඩා කෝපි ෂොප් සහ අවහන්හල් දිරිමත් කිරීම, නගර මධ්‍යයේ උද්‍යාන දියුණු කිරීම හා රථවාහන නැවතුම් පහසුකම් සැලැස්වීම තුලින් මෙම ප්‍රදේශය සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

රූපය 6.9 : ඇවිදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම



රූපය 6.10 : මුහුණත පෙනුමේ ආකර්ශනීත්වය වැඩි කිරීම

6.6. ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

6.6.1 හැදින්වීම

නගරයක, ජනාවාස හා නිවාස යනු ප්‍රධාන අංගයකි. ඕනෑම සංවර්ධන සැලැස්මක ප්‍රමාණවත් හා දැරිය හැකි මිල ගණන් වලට නිවාස සැපයීම අත්‍යවශ්‍ය කර්තව්‍යක් ලෙස හඳුනාගත හැකිය. උසස් තත්වයේ නිවාස හා ජනාවාස පහසුකම් ඉහළ ඉල්ලුමක් නිර්මාණය කරමින් වර්තමානයේ නගර තුළට ජනතාව ආකර්ෂණය කරගනී. එකලොස්වන තිරසාර සංවර්ධන ඉලක්කය වන "ධරණීය නගර හා ජනාවාස" යන ගෝලීය ඉලක්කය පිළිබඳව සැලකීමේදී, එමගින් විශේෂ අවධානය යොමු කර ඇත්තේ ගුණාත්මක නිවාස සැපයීම නගර හා ජනාවාස සමස්ත ජනතාව සඳහා අනුකූල වීම, ආරක්ෂා සහිත වීම, ප්‍රත්‍යස්ථ වීම සහ තිරසාර වීම යන කරුණු කෙරෙහි වේ.

6.6.2 අරමුණ

ජනාවාස සංවර්ධන උපාය මාර්ගයේ ප්‍රධාන අරමුණ වන්නේ දැරියහැකි මිල ගණන්වලට උසස් තත්වයේ නිවාස ලබාගැනීමේ පහසුව ජනතාව වෙත ලබා දීමයි. එලෙසම ප්‍රදේශයේ සියලු නේවාසික ජනතාවට සුවපහසු නේවාසික වටපිටාවක් ඇති කිරීමට සැලැස්ම තුලින් අපේක්ෂා කෙරේ.

6.6.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

මහරගම සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ වන සුවපහසු නේවාසික නගරයක් යන අරමුණ සාක්ෂාත් කරගැනීමේ ලා යෝජිත ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම සෘජුවම දායක වේ.

6.6.4 විෂය පථය

ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම පහත සදහන් කරුණු වලින් සමන්විත වේ.

1. නේවාසික යෝග්‍යතාවය අනුව ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනාගැනීම.
2. දැරිය හැකි මිලකට අයත්වන නිවාස, මධ්‍යම අදායම් නිවාස, සහ ඉහල ආදායම් නිවාස ව්‍යාපෘති ලෙස විවිධ වර්ගයෙහි නිවාස ව්‍යාපෘති හඳුන්වා දීම.
3. නේවාසික ප්‍රදේශවලට අවශ්‍ය පහසුකම් සැපයීමට උපායමාර්ගික මැදිහත්වීම. (භෞතික යටිතල පහසුකම්, සමාජීය යටිතල පහසුකම් සහ එළිමහන් මහජන විනෝදාත්මක ස්ථාන ඇතිකිරීම)

6.6.4.1 නේවාසික යෝග්‍යතාවය අනුව ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනාගැනීම.

ප්‍රදේශය සඳහා යෝජිත කලාප සැලස්ම අතුරින් කලාප තුනක් (අඩු ඝනත්ව නේවාසික කලාපය, මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය හා විශේෂ නේවාසික කලාපය) නේවාසික සංවර්ධනයන් සඳහා ප්‍රමුඛ කලාපයන් ලෙස හඳුනා ගෙන ඇත. ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනාගැනීමේ ප්‍රධාන නිර්ණායකයන් ලෙස නේවාසික සංවර්ධනය සඳහා වෙළඳපළ ප්‍රවණතාවය සහ යටිතල පහසුකම් සුලබතාවය අනුව නේවාසික සංවර්ධන යෝග්‍යතාවය සැලකිල්ලට ගෙන ඇත (සිතියම 6.10).

සිතියම 6.10 ඃ ජීවත් වීමට සුදුසු ප්‍රදේශ



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

කෙසේ උවද සමස්ථ මහරගම ප්‍රදේශයම නේවාසික සංවර්ධනයන් සඳහා යෝග්‍ය බවට විශ්ලේෂණයන් මගින් තහවුරු වී ඇත. ඒ අනුව ප්‍රදේශයේ ලක්ෂණ සහ නේවාසික අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් පහත ආකාරයට නේවාසික කලාපයන් කලාප සැලැස්ම තුලින් හඳුන්වා දී ඇත.

වගුව 6.11 ඃ යෝජිත ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ

අංකය	කලාපය	අදාළ කලාපයට ඇතුලත් වන ප්‍රදේශ
01	අඩු ඝනත්ව නේවාසික කලාපය	රුක්මල්ගම, හොරහේන, මාලපල්ල
02	මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය	එගොඩවත්ත,ගංගොඩවිල,ගොඩිගමුව දකුණ, පතිරගොඩ, ඇඹුල්දෙනිය
03	විශේෂ නේවාසික කලාපය	මාදිවෙල, ප්‍රගතිපුර,තලවතුගොඩ

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.11 : ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.6.4.2 දැරිය හැකි මිලකට වන නිවාස, මධ්‍යම අදායම් නිවාස, සහ ඉහල ආදායම් නිවාස ව්‍යාපෘති සංවර්ධනයන්

(අ) දැරිය හැකි මිලකට වන නිවාස ව්‍යාපෘතිය

වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස අංශය මගින් කොළඹ නගරය තුළ සහ තදාසන්න ප්‍රදේශවල නේවාසික අවශ්‍යතාව සඳහා පවතින ඉල්ලුම සළකා බලා දැරියහැකි මිලකට ලබාගතහැකි නිවාස ව්‍යාපෘතීන් සිදුකරනු ලබයි. ඒ අනුව ඒ යටතේ මහරගම ප්‍රදේශයේ පහත සංවර්ධන ව්‍යාපෘතීන් සිදුකිරීමට සංවර්ධන සැලැස්ම මගින් යෝජනා කරනු ලබයි.

වගුව 6.12 ඃ දැරිය හැකි මිලකට වන නිවාස ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘති ස්ථානය	ඉඩමේ ප්‍රමාණය	ලබාදීමට යෝජිත නිවාස ඒකක ප්‍රමාණය	සටහන්	ව්‍යාපෘති අංකය
01	මාකුඹුර නිවාස ව්‍යාපෘතිය	අක්කර 2.24	ඒකක 341	2023 වර්ෂය වන විට ඉදිකිරීම් නිම කිරීමට යෝජිතය	21

සැකසුමඃ සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

(ආ) මධ්‍යම අදායම් නිවාස ව්‍යාපෘතිය

මහරගම සහ අවට පවතින ආයතනික හා වාණිජමය කටයුතු සඳහා පැමිණෙන ජනතාව හේතුකොටගෙන මහරගම ප්‍රදේශයේ මධ්‍යම පාන්තික නිවාස සඳහා විශාල ඉල්ලුමක් පවතී. ඒ අනුව පවතින ඉල්ලුම සපුරාලීම සඳහා පහත සංවර්ධන ව්‍යාපෘතීන් සිදුකිරීමට යෝජනා කොට ඇත.

වගුව 6.13 ඃ යෝජිත මධ්‍යම අදායම් නිවාස ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘති ස්ථානය	ඉඩමේ ප්‍රමාණය	ලබාදීමට යෝජිත නිවාස ඒකකප්‍රමාණය	සටහන්	ව්‍යාපෘති අංකය
01	වීර මාවත කලල්ගොඩ නිවාස ව්‍යාපෘතිය	අක්කර 8.9	ඒකක 500	70% පමණ ඉදිකිරීම් නිම කොට ඇත.	-
02	කුලසෙවන වත්ත,කොට්ටාව නිවාස ව්‍යාපෘතිය	අක්කර 5	300	2021 වර්ෂය අවසානය වන විට ඉදිකිරීම් නිම කිරීමට යෝජිතය	-
03	දෙපානම නිවාස ව්‍යාපෘතිය	අක්කර 2	තීරණය කිරීමට යෝජිත	-	-
04	දෙල්ගහවත්ත නිවාස ව්‍යාපෘති	අක්කර 0.7 අක්කර 0.4	තීරණය කිරීමට යෝජිත	-	-

සැකසුමඃ සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

(ඇ) ඉහල ආදායම් නිවාස ව්‍යාපෘතිය

වෛද්‍යවරුන්, ව්‍යාපාරිකයන් හා ඉහල අදායමක් ලබන රාජ්‍ය හා පෞද්ගලික ආයතන සේවකයන් ඉලක්ක කරගනිමින් ඉහල ආදායම් නිවාස ව්‍යාපෘති සිදුකිරීමට යෝජනා කොට ඇත.

වගුව 6.14 ෲ යෝජිත ඉහල ආදායම් නිවාස ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘති ස්ථානය	ඉඩමේ ප්‍රමාණය	ලබාදීමට යෝජිත නිවාස ඒකකප්‍රමාණය	ව්‍යාපෘති අංකය
01	තලපත්පිටිය නිවාස ව්‍යාපෘතිය	අක්කර 2.03	තීරණය කිරීමට යෝජිත	22
02	තලවතුගොඩ නිවාස ව්‍යාපෘතිය	අක්කර 1	තීරණය කිරීමට යෝජිත	පෙර යොමුව ෲ 14
03	කොට්ටාව නිවාස ව්‍යාපෘතිය	අක්කර 1	තීරණය කිරීමට යෝජිත	පෙර යොමුව ෲ 12

සැකසුමඃ සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.12 : යෝජිත නිවාස ව්‍යාපෘති



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.6.4.3 නේවාසික ප්‍රදේශවලට අවශ්‍ය පහසුකම් සැපයීමට උපායමාර්ගික මැදිහත්වීම. (භෞතික යටිතල පහසුකම්, සමාජීය යටිතල පහසුකම් සහ එළිමහන් මහජන විනෝදාත්මක ස්ථාන ඇතිකිරීම)

6.6.4.3.1 නේවාසික ප්‍රදේශ තුළ ප්‍රවේශ වීම් හා සංචලතාවය වැඩිදියුණු කිරීම

සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධති, විද්‍යුත් දුම්රිය වැනි නව පොදු ප්‍රවාහන මාධ්‍ය හඳුන්වාදීම මෙන්ම පවත්නා දුම්රිය හා මහාමාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම. (ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගය යටතේ දක්වා ඇත.)

6.6.4.3.2 සමාජීය යටිතල පහසුකම් සැපයීම සහතික කිරීම

ප්‍රමාණවත් පරිදි පාසල්, රෝහල්, ආදාහනාගාර සහ පොදු වෙළඳපොළ වැනි සමාජීය යටිතල පහසුකම් සැපයීම සහතික කිරීම. (අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම යටතේ දක්වා ඇත.)

6.6.4.3.3 ප්‍රමාණවත් මහජන එළිමහන් අවකාශ සැපයීම සහතික කිරීම

සෑම පුරවැසියෙකුටම විශාල ප්‍රමාණයේ උද්‍යානයකට කිලෝ මීටර් 1- 2 ත් අතර අරයකින් යුත් දුරක් ඇතුළත හා සෑම කුඩා දරුවකුටම මීටර් 500ක අරයකින් යුත් දුරක් ඇතුළත ළමා උද්‍යානයකට පිවිසීමට හැකිවන පරිදි ප්‍රමාණවත් මහජන එළිමහන් අවකාශ සැපයීම සහතික වීම (තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම/ පොදු විවෘත භූමි විනෝදාත්මක සැලැස්ම යටතේ දක්වා ඇත.)

6.6.4.4 අඩු පහසුකම් සහිත ජනාවාස නගා සිටුවීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම

මහරගම නගර සභා බල ප්‍රදේශය තුල දුම්රිය මාර්ග රක්ෂිතය තුල, සේනාධිලංකාරගම, ප්‍රගතිපුර, මාදිවෙල ආදී ප්‍රදේශයන්හි අඩු පහසුකම් සහිත ජනාවාස පවතින බවට නිරීක්ෂණය කල හැකිය.

කැලණිවැලි විද්‍යුත් දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හරහා දුම්රිය මාර්ග රක්ෂිතය තුල පවතින අඩු පහසුකම් සහිත නිවාස පුනස්ථාපනයට යෝජනා කෙරෙන අතර සේනාධිලංකාරගම ප්‍රදේශයේ අඩු ආදායම් සහිත ජනාවාස සඳහා නිවාස ලබා දීමට ඒකක 600කින් යුක්ත නිවාස ව්‍යාපෘතියක් යෝජනා කෙරේ. (සිතියම 6.12)

තවද අනෙකුත් අඩුපහසුකම් සහිත ජනාවාස ප්‍රදේශයන් අවශ්‍ය යටිතලපහසුකම් ලබාදීම තුලින් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

යෝජිත ක්‍රියාමාර්ග

- මූලික යටිතල පහසුකම් ස්ථාපනය හා වැඩිදියුණු කිරීම.
- කළමනාකරණය හා නඩත්තු කිරීම සඳහා ප්‍රජාවට දිරි දීමනා ලබාදීම.
- ප්‍රජා විවෘත අවකාශ, සෞඛ්‍ය මධ්‍යස්ථාන, ළදරු පාසල් වැනි ප්‍රජා පහසුකම් ඉදිකිරීම හෝ පුනරුත්ථාපනය.
- කුලී නිවැසියන්ගේ ආරක්ෂාව විධිමත් කිරීම.
- නිවාස වැඩිදියුණු කිරීම.
- වැඩිදියුණු කිරීම් වලදී අවතැන්වූ කුඩා පිරිස් නැවත පදිංචි කිරීම / වන්දි පිරිනැමීම.
- සෞඛ්‍ය පහසුකම් සහ අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වැඩිදියුණු කිරීම මෙන්ම ආරක්ෂාව පිළිබඳ ගැටළු,ප්‍රචණ්ඩත්වය වැනි කරුණු සඳහා සමාජීය සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුහුණුව සහ ක්ෂුද්‍ර මුල්‍ය ණය පහසුකම් තුළින් අදායම් ඉපයීමේ අවස්ථා බිහිකිරීම

6.7. අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

6.7.1 හැඳින්වීම

නගරයක කාර්යක්ෂම වූ ක්‍රියාකාරීත්වයක් ඇති කිරීමෙහි ලා හොඳින් කළමනාකරණය කරන ලද අපරව්‍යුහ පහසුකම් පැවතීම මූලික අවශ්‍යතාවයකි. ඥානාන්විත සම්පත් පරිහරණය, සම්පත් සංරක්ෂණය හා යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශය තහවුරු කිරීම උදෙසා අපරව්‍යුහ පහසුකම් කළමනාකරණය කිරීමේදී සාකල්‍ය හා ඒකාබද්ධ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. කාර්යක්ෂම අපරව්‍යුහ පහසුකම් කළමනාකරණයෙහි මූලික කාර්යයන් ලෙස ඉල්ලුම හඳුනා ගැනීම සහ ඉල්ලුමට සරිලන ආකාරයෙන් සැපයුම තහවුරු කිරීම හඳුන්වා දිය හැකිය.

6.7.2 අරමුණ

නගරය තුළ ජීවත් වන සහ පිටතින් පැමිණෙන ප්‍රජාවට ප්‍රමාණවත් පරිදි සමාජ යටිතල පහසුකම් සැපයීම, නගරයේ සමාජ ආර්ථික සමදේශපාලන ක්‍රියාවලීන්හි මෘදු ගලා යාම තහවුරු කිරීම සහ සමස්ත වශයෙන් කාර්යක්ෂම අපරව්‍යුහ පහසුකම් ජාලකරණයක් ඇති කිරීම මහරගම සංවර්ධන සැලැස්මේ අපරව්‍යුහ පහසුකම් සංවර්ධන සැලැස්මෙන් අපේක්ෂා කෙරේ. මෙහිදී සංකල්පිත සැලැස්මේ හඳුනා ගත් ආකාරයට සුහුරු සෞඛ්‍ය පහසුකම් සැපයීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමද අරමුණු කෙරේ.

6.7.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

මහරගම සංවර්ධන සැලැස්මේ දෙවන අරමුණ වන කාර්යක්ෂම යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් යන අරමුණ සාක්ෂාත් කරගැනීමේලා අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම සෘජුවම දායක වේ.

6.7.4 විෂය පථය

අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම පහත සඳහන් කරුණු වලින් සමන්විත වේ.

1. උපයෝගිතා සේවාවන්හි කාර්යක්ෂම සැපයුම
2. ප්‍රමාණවත් සහ සුහුරු සමාජීය යටිතල පහසුකම් සැපයීම

6.7.4.1 උපයෝගිතා සේවාවන්හි කාර්යක්ෂම සැපයුම

නල ජලය සැපයීම, විදුලිය, මළ අපද්‍රව්‍ය, අපජලය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ සෞඛ්‍ය පහසුකම් සැපයීම පිලිබඳව මෙම උපයෝගිතා කාර්යක්ෂම සැපයුම නම් වූ පුළුල් මැදිහත් වීම යටතේ මූලික වශයෙන් සලකා බැලේ. එකී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍රවලට අදාළ සියලුම ව්‍යාපෘති උපයෝගිතා කළමනාකරණ උපාය මාර්ගය යටතට අයත් වේ.

6.7.4.1.1 නල ජලය සැපයීම

බස්නාහිර පළාතේ අගනගර කලාප ජල සම්පාදන ප්‍රධාන සැලැස්ම- 2013 යටතේ මහරගම නගරය තුළ නල ජල සැපයුමේ අයිතිය හා කළමණාකරණය ශ්‍රී ලංකා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් හිමිකරගෙන ඇති අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කයන්හි කොටසක් වශයෙන් ආවරණය කරනු ලබයි. පවත්නා පද්ධතියේ ප්‍රධාන වශයෙන් භාවිතා කරන මතුපිට ජල ප්‍රභවයන් වන්නේ:

- ලබුගම හා කලටුවාව ජලාශයන්
- කැළණි ගඟ සහ එහි අතු ගංගාවක් වන සීතාවක ගඟ
- කළු ගඟ හා එහි අතු ගංගාවක් වන කුඩා ගඟ

කැළණි ගඟ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පානීය ජල මූලාශ්‍රයකි. කොළඹ නගරයට කිලෝමීටර් 39 ක් පමණ දුරින් පිහිටි ලබුගම සහ කලටුවාව ජලාශයන් කොළඹ සහ රත්නපුර දිස්ත්‍රික්කයන්ට මායිම් ව පිහිටා ඇත.

බස්නාහිර පළාත් අගනගර කලාප ජල සම්පාදන ප්‍රධාන සැලැස්ම (2013) අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය පුරෝකථනය කර ඇති ආකාරයට 2031 වර්ෂයට මහරගම ප්‍රදේශයේ ප්‍රක්ෂේපිත ජල ඉල්ලුම දිනකට උපරිම ඝන මීටර 72,261 වේ.

වගුව 6.15: මහරගම ප්‍රක්ෂේපිත ජල ඉල්ලුම

2031 අපේක්ෂිත ජනගහනය	2031 ප්‍රක්ෂේපණය (ඝන මීටර)					
	ගෘහස්ත නොවන ඉල්ලුම	ගෘහස්ත නොවන ඉල්ලුම	විශේෂ ඉල්ලුම	ප්‍රදේශයේ මුළු ඉල්ලුම	දිනකට සාමාන්‍ය මුළු ඉල්ලුම	දිනකට උපරිම මුළු ඉල්ලුම
260,181 * සැලැස්ම අනුව පුරෝකථනය කල නේවාසික ජනගහනය - 235,650	45,998	5,745	2,783	54,526	65,690	72,261

මූලාශ්‍රය: ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

ප්‍රදේශයේ ජනතාව නල ජලය, ප්‍රජා ජල ව්‍යාපෘති, නළ ළිං, ළිං සහ ජල යෝජනා ක්‍රම මගින් ජලය භාවිතාවට ගනු ලබයි.

ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය මගින් මහරගම ප්‍රදේශයේ ජල සම්පාදනයට දායක වන යෝජිත ජල සම්පාදන ව්‍යාපෘතීන් ලෙස කලටුවාව, අඹතලේ සහ වැලිවිට ජල ව්‍යාපෘති සැලකිය හැකිය.

ජල සැපයුම් ප්‍රධාන සැලැස්මෙහි සඳහන් ඉහත ව්‍යාපෘතින් බාධාවකින් තොරව ක්‍රියාත්මක වුවහොත් මහරගම ප්‍රදේශයේ අවශ්‍ය නල ජල ඉල්ලුම ගැටලුකාරී තත්වයකින් තොරව සම්පුර්ණ වනු ඇත.

6.7.4.1.2 විදුලිය සැපයීම

මහරගම නගර සභා බල ප්‍රදේශය 100%ක්ම ජාතික විදුලි පද්ධතිය මගින් සපයන විදුලියෙන් ආවරණය වී ඇත. බස්නාහිර ප්‍රදේශයේ කොළඹ නගරය ආශ්‍රිතව කැළණිතිස්ස, සපුගස්කන්ද, කෙලවරපිටිය වැනි වූ බලාගාර කිහිපයක් ව්‍යාප්තව ඇත. බියගම (grid) උපපොළ මගින් 220 හා 132kv බෙදාහැරීම් ජාලය ඔස්සේ පන්නිපිටිය (grid) උපපොළ වෙත විදුලිය සැපයීම හරහා මහරගම ප්‍රදේශයට විදුලිය සැපයීම සිදුකරනු ලබයි.

ලංකා විදුලි බල මණ්ඩලයේ නිර්දේශයන්ට අනුව නියමිත කාලයන්හිදී ප්‍රාදේශීය ධාරිතා ඉහළ නැංවීම් නිසි පරිදි සිදු වුවහොත් මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි සංවර්ධන ව්‍යාපෘතින් හා මැදිහත්වීමෙන් අපේක්ෂිත ජනගහනයට හා ව්‍යාපෘතීන්ට අවශ්‍ය වන විදුලි ධාරිතාව සැපයීමේ හැකියාව පවතී.

රූපය 6.11 - ප්‍රදේශය ආවරණය කරනු ලබන විදුලි සම්ප්‍රේෂණ මාර්ග



මූලාශ්‍රය: ලංකා විදුලි බල මණ්ඩලය

6.7.4.1.3 සුහුරු සෞඛ්‍ය සේවාවක් සැපයීම

මහරගම නගර සභා බල ප්‍රදේශය ආශ්‍රිතව සෞඛ්‍යය සේවය ඉහළ මට්ටමක පවතී. නාවින්න ආයුර්වේද රෝහල, ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල, මහරගම අපේක්ෂා රෝහල සහ ජාතික දන්ත වෛද්‍ය ආයතනය මගින් සේවා ලබා ගැනීම සඳහා කලාපයේ සහ ජාතික වශයෙන් නොයෙක් දෙසින් විශාල ජනකායක් මහරගම වෙත දෛනිකව ඒකරාශී වේ.

ඒ අනුව මෙම සේවාවන් ලබාගැනීමට පැමිණෙන පුද්ගලයන් සඳහා වඩාත් සුවපහසු හා සුහුරු සේවාවක් ලබා දීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල, නාවින්න ආයුර්වේද රෝහල හා අපේක්ෂා රෝහල මූලික කොටගත් සංවර්ධනයන් කිරීමට යෝජනා කෙරේ.

සිතියම 6.13 : යෝජිත සෞඛ්‍ය සංවර්ධන මධ්‍යස්ථාන



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිත සංවර්ධනය

වගුව 6.16 : ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිත සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති අංකය
01	බස් නැවතුම්පොළ සංවර්ධනය	23
02	මහජන චතුරශ්‍රය	
03	නාගරික කෘෂිකර්මාන්ත ව්‍යාපෘතිය	
04	සෙවණ කල මංතීරු	
05	ඇවිදීමේ මංතීරු	
06	නිවාස ව්‍යාපෘතිය	පෙර යොමුව : 22

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

නාවින්න ආයුර්වේද රෝහල ආශ්‍රිත සංවර්ධනය

අක්කර 17 කින් පමණ සමන්විත නාවින්න ආයුර්වේද රෝහල දේශීය හා විදේශීය ආකර්ශනයක් සහිත ස්ථානයක් බවට පත්කිරීමේ අරමුණ පෙරදැරිව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

වගුව 6.17 : නාවින්න ආයුර්වේද රෝහල ආශ්‍රිත සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති අංකය
01	අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය	24
02	පිවිසුම් සහ පිටවුම් දොරටු සංවර්ධනය	
03	ආයුර්වේද ස්පා	
04	ස්වාභාවික අඩිපාර	
05	උද්භිද විද්‍යාගාරය	
06	භූමි අලංකරණය	
07	ඖෂධීය වනාන්තරය	

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.14: යෝජිත ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිත සංවර්ධනය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

අපේක්ෂා රෝහල ආශ්‍රිත සංවර්ධනය

අපේක්ෂා රෝහල මගින් සේවා ලබා ගැනීම සඳහා කලාපයේ සහ ජාතික වශයෙන් නොයෙක් දෙසින් විශාල ජනකායක් මහරගම නගරය වෙත දෛනිකව ඒකරාශී වේ. සේවාවන් ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයන්ට වඩාත් සුවපහසු වටපිටාවක් සහිත ස්ථානයක් බවට පත් කිරීම අරමුණු කරගනිමින් ඒ ආශ්‍රිතව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

වගුව 6.18 : අපේක්ෂා රෝහල ආශ්‍රිත සංවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති අංකය
01	දහම් මාවතෙන් ප්‍රවේශය ලබා දීම	25
02	මහජන උද්‍යානය	
03	ජලය රඳවා තබා ගැනීමේ ප්‍රදේශය	
04	පොදු ක්‍රීඩා පිටිය	
05	අනෙකුත් සංවර්ධනයන්	

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.15: යෝජිත අපේක්ෂා රෝහල ආශ්‍රිත සංවර්ධනය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.7.4.1.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

රටේ සියළුම දිස්ත්‍රික්ක අතුරින් කොළඹ දිස්ත්‍රික්කය වැඩිම ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් උත්පාදනය කරනු ලබයි. ඉන් විශාල ප්‍රමාණයක් කළමනාකරණය කරනු ලබන්නේ පළාත් පාලන ආයතන මගින් වන අතර සුළු ප්‍රමාණයක් උත්පාදනය සිදුකරන ස්ථානයන්හිදීම කළමනාකරණය කරනු ලැබේ.

පවතින දත්ත සලකා බැලීමේදී මහරගම ප්‍රදේශයේ 60% පමණ වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් නගර සභාව මගින් කළමනාකරණය කරනු ලබයි.

රූපය 6.12 : කසල කළමනාකරණය කරනු ලබන ක්‍රම



මූලාශ්‍රය: www.pressreader.com/sri-lanka/daily-mirror-sri-lanka, 2012

එහිදී ප්‍රධාන වශයෙන් කසල කරදියාන කසල අංගනය වෙත යොමු කිරීම සිදුකෙරේ.

මහරගම නගරය තුල 2031 වර්ෂයේදී පුරෝකථනය කරන ලද ඝන අපද්‍රව්‍ය උත්පාදනය පහත උපකල්පන මත ගණනය කොට ඇත.

1. නගර සභා ප්‍රදේශයන්හි දිනක ඒක පුද්ගල ඝන අපද්‍රව්‍ය උත්පාදනය කි ග්‍ර.0.6 (ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය , මධ්‍යම පරිසර අධිකාරිය)

2. සංචරණ ජනගහනයේ දිනක ඒක පුද්ගල ඝන අපද්‍රව්‍ය උත්පාදනය කි ග්‍ර.0.15 (www. Environment clearance.nic.)

වගුව 6.19 : ඝන අපද්‍රව්‍ය උත්පාදනය

	ජනගහනය (2031)	ඝන අපද්‍රව්‍ය උත්පාදනය(MT/d)
නේවාසික	235,650	141.4
සංචරණ	200,000	30.0
එකතුව	435,650	171.4

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

ප්‍රධාන කළමනාකරණ ක්‍රමය වශයෙන් මෙම කසල දිරන නොදිරන ලෙස වර්ගකර කරදියාන අංගනයට බැහැර කිරීමට යෝජනා කෙරේ.

මීට අමතරව කසල කළමනාකරණය සඳහා දැනට ක්‍රියාත්මක හා යෝජිත ව්‍යාපෘති පහත පරිදි වන අතර ඒවා තවදුරටත් ක්‍රියාත්මක කිරීමට දිරිමත් කෙරේ.

- බස්නාහිර පළාත් සභා අනුග්‍රහය මත ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය නිවසේදීම වෙන් කර එකතු කිරීමේ වැඩසටහන යටතේ සෑම නේවාසික ඒකකයක් සඳහාම සම්මත වර්ණයන්ගෙන් යුත් කසළ වෙන් කිරීමේ මලු බෙදාදීම සිදු කිරීම

- මහජනතාව වෙනුවෙන් වෙන් කළ කසළ සඳහා වන වාණිජමය වටිනාකම හඳුන්වා දීම සඳහා සිදුකරන කසළ පොළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම .

- තකකුරා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම

රූපය 6.13 : කසල පොළ ව්‍යාපෘතිය

රූපය 6.14 : සම්මත වර්ණයන්ගෙන් යුත් කසළ වෙන් කිරීමේ මලු බෙදාදීම සිදු කිරීම

රූපය 6.15 : කසල වෙන්කිරීමේ ප්‍රචාරණය

6.7.4.1.5 අපජලය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය

මහරගම ප්‍රදේශයට අදාළ අපජලය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ පළාත් පාලන ආයතන සතු වගකීමක් වේ. ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය සතුව පවතින රත්මලාන අපජල කළමනාකරණ පද්ධතිය මගින් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ කොටසක් , මොරටුව මහ නගර සභාවේ කොටසක්, බොරලැස්ගමුව නගර සභාව (යෝජිත) සහ මහරගම නගර සභාවේ කොටසක් (යෝජිත) ආවරණය වේ. මෙහි ධාරිතාව දිනකට ඝන මීටර 17,000 ක් වන අතර එහි වර්තමාන ධාරිතාව දිනකට ඝන මීටර 7,000ක ප්‍රමාණයකි.

රූපය 6.16 : දැනට පවතින ප්‍රධාන අපජල පද්ධතිය



මූලාශ්‍රය : ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

රූපය 6.17 : යෝජිත අපද්‍රව්‍ය පද්ධතියෙන් ආවරණය වන ප්‍රදේශය



මූලාශ්‍රය : ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

වර්තමානය වනවිට ප්‍රධාන වශයෙන් නිවාස මට්ටමින් මලාපද්‍රව්‍ය කළමනාකරණය සිදුකර ගනු ලැබේ. වර්ෂ 2031 වන විට අධි ඝනත්ව සංවර්ධනයන් අපේක්ෂිත ප්‍රදේශයන් හෝ ව්‍යාපෘතීන් සඳහා එම ව්‍යාපෘතීන් තුළින් මලාපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩපිළිවෙලක් සමග සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

6.8. තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම

6.8.1 හැඳින්වීම

තිරසාර පාරිසරික වටපිටාවක් පවත්වාගැනීම සුවපහසු ආකර්ශනීය නගරයකට අත්‍යවශ්‍ය අංගයකි. ශිෂ්ඨාචාරයන්ගේ දියුණුවත් සමඟම වර්ධනය වූ ජනාවාස හේතුවෙන් ස්වභාවික පරිසරයේ සුවිශේෂීත්වය හා වැදගත්කම වර්තමානය වනවිට වෙනස්වෙමින් පවතී. තිරසාර පාරිසරික වටපිටාවක් පවත්වාගැනීම තුළින් බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ප්‍රතිලාභ ලබාගත හැකි වේ.

6.8.2 අරමුණ

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා මහරගම නගර සහා බල ප්‍රදේශයේ පවතින තෙත් බිම් යොදා ගැනීම, ගංවතුර ආපදා අවම කිරීම, ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූදර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම හා යෝජිත සංවර්ධන අවශ්‍යතාවයට ගැලපෙන පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු සංවර්ධනය කිරීම මෙම උපායමාර්ගය තුලින් අරමුණු කෙරේ.

6.8.3 මහරගම සංවර්ධන සැලැස්ම 2022-2031 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

මහරගම සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ වන සුවපහසු නේවාසික නගරයක් සහ හතරවන අරමුණ වන තෙත් බිම් සුරක්ෂිත පුරවරයක් ඇති කිරීමෙහි ලා තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම සෘජුවම දායක වේ.

6.8.4 විෂය පථය

තිරසාර පාරිසරික උපායමාර්ගික සැලසුම් රාමුව පහත සඳහන් කරුණු තුළින් සමවිත වේ.

1. තෙත්බිම් කලාපීකරණ සැලැස්ම
2. භූදර්ශන කළමනාකරණ සැලැස්ම
3. ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම
4. පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

6.8.4.1 තෙත්බිම් කලාපීකරණ සැලැස්ම

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා මහරගම නගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත් බිම් යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමත් එමගින් ප්‍රදේශයේ සිදුවන අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීමත් මෙම තෙත්බිම් කලාපීකරණ සැලැස්ම ඉදිරිපත් කිරීමේ ප්‍රධාන ඉලක්ක වේ.

තෙත්බිම් කලාපීකරණ සැලැස්ම සැකසීමේ අරමුණු වන්නේ

1. මහරගම නගර සභා සීමාව තුල මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ගංවතුර බලපෑම් අවම කිරීම මගින් පරිසර හිතකාමී නගරයක් ඇති කිරීම.
2. විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපනික දැනුවත් කිරීම් සඳහා තෙත්බිම් යොදා ගැනීම.
3. ජෛව විවිධත්වය ඉහල නංවමින් පාරිසරික, සංචාරක හා විනෝදාත්මක අවස්ථා වැඩි කිරීම සඳහා තෙත්බිම් යොදා ගැනීම.
4. අනවසර අත්පත් කරගැනීම්, පරිසරයට හානි වන, නොගැලපෙන සහ නුසුදුසු ඉදිකිරීම් මගින් ප්‍රදේශයට සිදුවන හානිකර බලපෑම අවම කරගැනීමත් ය.

ඒ අනුව තෙත්බිම් කලාපීකරණය යටතේ මහරගම නගරසභා බල ප්‍රදේශයේ පවතින තෙත්බිම් කලාප තුනක් යටතට කලාපිකරණය කර ඇත.

I. තෙත්බිම් ආරක්‍ෂණ කලාපය - සංරක්‍ෂණ තෙත්බිම්

ජාත්‍යන්තර සම්මුතියකින්, දේශීය පනතකින් හෝ ගැසට් පත්‍රයක් මගින් ආරක්‍ෂක හෝ විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති තෙත් බිම් මේ යටතට ගැනෙන අතර මෙම සැලසුම් බල ප්‍රදේශයේ උතුරු දෙසට වන්නට පවතින දියවන්නා ඔය හා පාර්ලිමේන්තුව අවට වගුරුබිම් කොටස් කිහිපයක් "ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අභය භූමියට" අයත් වේ.

II. තෙත්බිම් ස්වභාවික සංරක්‍ෂිත කලාපය

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

III. කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය

පවතින වගා කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය,ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ, බස්නාහිර පළාතේ තෙත්බිම් ආශ්‍රිත කෘෂි කර්මාන්තය සිදු කෙරෙන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

ඒ අනුව එක් එක් කලාපයන් සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශයන් සංවර්ධන රෙගුලාසි මගින් හඳුන්වා දී ඇත.

සිතියම 6.16 : යෝජිත තෙත්බිම් කලපිකරණය



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.8.4.2 භූ දර්ශන කළමනාකරණ සැලැස්ම

මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූ දර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම ප්‍රධානම අරමුණ වේ. එමගින් නගරයෙහි පවතින අනන්‍යතාවය ආරක්ෂා කරගත හැකිවේ.

එයට අමතරව පාරිසරික වශයෙන් සංරක්ෂණය පෙරදැරි කරගත් ක්‍රමවත් සැලසුම් මගින් විවිධ පරිසර පද්ධති, මං මාවත් ආදිය තිරසාර ලෙස භූ දර්ශන සංවර්ධනය මෙම සැලැස්ම මගින් අපේක්ෂිතය.

ගෝලීය කාලගුණ විපර්යාස සඳහා අනාගතයේ මුහුණ දීමට මහරගම නගර සහා බල ප්‍රදේශයේ භූ දර්ශන සැලසුම පහත අරමුණු අනුව සැකසෙනු ඇත.

1. නාගරික උෂ්ණත්වය වැඩිවීම, කාබන් පියසටහන වැඩිවීම, වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා තත්ත්වයන් අවම කිරීමට නාගරික වන ගහනය වැඩි කිරීම.

2. නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා පරිසරයට ආවේණික වූ දේශීය ශාක විවිධත්වයක් සහිතව එක් කිරීම.

3. ඇවිදින්නන් තවත් දිරිමත් කිරීමට සහ පදිකයන්ගේ ආරක්ෂාව සඳහා වෙන්වූ පදික මං තීරු සෙවන හා ආසන සහිතව ලබාදීම.

4. සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥාණාන්විත භාවිතයන් (Wise use) හඳුන්වා දීම මඟින් තිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා යොදා ගැනිම.

5. නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරව්‍යුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් නිර්මාණය කිරීම .

6. විවිධ උද්‍යාන, මං තීරු, සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මගින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.

වගුව 6.20 : යෝජිත භූ දර්ශන කළමනාකරණ ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති අංකය
01	නාගරික වනාන්තර සංවර්ධන ව්‍යාපෘතිය - මාකුඹුර	පෙර යොමුව :12
02	භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතිය - මාකුඹුර	පෙර යොමුව:12
03	නාගරික චතුරශ්‍රය - කොට්ටාව මංසන්ධිය	පෙර යොමුව:13
04	රේඛීය උද්‍යානය හා ජලය රඳවා ගැනීමේ ප්‍රදේශය සංවර්ධනය - කොට්ටාව මංසන්ධිය	පෙර යොමුව :13
05	ආදර්ශ කුඹුරු ව්‍යාපෘතිය - තලවතුගොඩ මංසන්ධිය	පෙර යොමුව :14
06	පාපැදි ධාවන පථය -තලවතුගොඩ මංසන්ධිය	පෙර යොමුව :14
07	නාගරික උද්‍යානය - තලවතුගොඩ මංසන්ධිය	පෙර යොමුව :14
08	මහජන චතුරශ්‍රය - ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිතව	පෙර යොමුව :19
09	නාගරික කෘෂිකර්මාන්ත ව්‍යාපෘතිය - ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිතව	පෙර යොමුව :19

10	සෙවන කල මංතීරු - ශ්‍රී ජයවර්ධනපුර මූලික රෝහල ආශ්‍රිතව	පෙර යොමුව :19
11	මහජන උද්‍යානය- අපේක්ෂා රෝහල ආශ්‍රිතව	පෙර යොමුව :21
12	නාවින්න ආයුර්වේද පරිශ්‍ර භූ දර්ශණ ව්‍යපෘතිය	පෙර යොමුව :24
13	ඇවිදින මංතීරු - බෝගහවත්ත (කොට්ටාව උතුර) කුඹුර ආශ්‍රිතව	26
14	මහජන උද්‍යානය (Dine In Park) - කොට්ටාව	27
15	මහරගම නාගරික උද්‍යානය	28
16	බර්ඩ් පාර්ක් (කුරුළු උයන) ව්‍යාපෘතිය	29
17	ප්‍රදේශයේ පවතින සියලු තෙත් බිම් ප්‍රදේශයන් හි මායිම් වටා භෞතිකව සීමා නිර්ණය කිරීම	30

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.8.4.3 ආපදා අවදානම අවමකිරීමේ සැලැස්ම

ප්‍රදේශයේ ස්ථාන කිහිපයක මුහුණදෙන ප්‍රධාන ආපදාවක් වන හදිසි ගංවතුර තත්ත්වය වැලැක්වීම සඳහා කටයුතු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

වගුව 6.21 : යෝජිත හදිසි ගංවතුර තත්ත්වය වැලැක්වීමේ ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතියේ නම
01	FF01 ලෙස දක්වා ඇති ස්ථානයේ ජලය බැස යාමේ කාණු පද්ධතියක් ඉදිකිරීම
02	FF02 ලෙස දක්වා ඇති ස්ථානයේ ජලය බැස යාමට ඇති ස්වභාවික මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
03	FF03 ලෙස දක්වා ඇති ස්ථානයේ ජලය බැස යාමට ඇති ස්වභාවික මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
04	FF04 ලෙස දක්වා ඇති ස්ථානයේ ජලය බැස යාමට ඇති ස්වභාවික මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
05	FF05 ලෙස දක්වා ඇති ස්ථානයේ ජලය බැස යාමට ඇති ස්වභාවික මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
06	FF06 ලෙස දක්වා ඇති ස්ථානයේ ඇළ මාර්ග වලට අපද්‍රව්‍යය බැහැරලීම වැළැක්වීමට පියවර ගැනීම හා ඇළ මාර්ග අවහිර වන ලෙස වැවී ඇති පැළෑටි වර්ග ඉවත්කර නිසි ලෙස නඩත්තු කටයුතු සිදුකිරීම

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.17 : යෝජිත හදිසි ගංවතුර තත්ත්වය වැලැක්වීමේ ව්‍යාපෘති



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.8.4.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිලිබඳ අවකාශීය සැලැස්ම

මහරගම නගරසභා බල ප්‍රදේශයේ යෝජිත සංවර්ධන අවශ්‍යතාවයට ගැලපෙන පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු සංවර්ධනය කිරීම මෙම සැලැස්ම මගින් සිදු කෙරේ.

මෙම සැලැස්මෙහි ප්‍රධාන අරමුණු පහත සඳහන් ලෙස දැක්විය හැකිය.

1. ඇවිදීමට හැකි ළදරුවාගේ සිට වැඩිහිටි පුද්ගලයා දක්වා සැමට ක්‍රීඩා කිරීමට හා විවේක ගැනීමට අවශ්‍ය ඉඩ පහසුකම් සැපයීම.

2. ළමුන්ගේ විවේක හා විනෝද පහසුකම් පදිංචි නිවාස ආසන්නයේ පිහිටුවීම.

3. ජනතාවගේ කායික හා මානසික සුවපහසුව වර්ධනය කිරීම මගින් නිරෝගී ජනතාවක් සමාජගත කිරීම.

4. විනෝදාංශයක් ලෙස ක්‍රීඩාව ප්‍රචලිත කිරීම මගින් සමාජමය ගැටළු අවම කිරීම.

මෙය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සඳහා යෝජනා කරනු ලබන උද්‍යාන ස්ථාපනය කිරීමේ අනුපිළිවෙලක් වන අතර ඇවිද යා හැකි දුර ප්‍රමාණය මූලික පදනම වේ.

ඍජු හා වක්‍ර ලෙස විවේක සහ විනෝද පහසුකම් ආකාර දෙකක් පවතින අතර ඍජු විවේක සහ විනෝද පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ක්‍රීඩා කිරීම සඳහා වෙන් කරන ලද විශේෂ පහසුකම් සහ ඉඩ ප්‍රමාණයක් හෝ උපකරණ අවශ්‍ය වන පාපන්දු, අත්පන්දු, ටෙනිස් වැනි ක්‍රීඩා ආදිය අයත් වේ. වක්‍ර විවේක සහ විනෝද පහසුකම් යටතේ ඇවිදීම, ඡායාරූපකරණය, සොබාදම් නැරඹීම, කුරුල්ලන් නැරඹීම වැනි විශේෂ පහසුකම් අවශ්‍ය නොවන ක්‍රියාකාරකම් අයත්වේ.

ඒ අනුව 2031 වන විට පොදු එළිමහන් විවෘත භූමි සඳහා ඉඩම් හෙක්ටයාර් 328ක් වෙන් කල යුතු නමුත් දැනට ඍජු විවේක හා විනෝද කටයුතු සඳහා වෙන්ව පවතිනුයේ හෙක්.17.3 ක පමණ ප්‍රමාණයකි. මෙම ප්‍රදේශය අධික තදබදයක් සහිත ජනාකීර්ණ ප්‍රදේශයක් වන බැවින් විවේක හා විනෝද කටයුතු සඳහා වෙන්කල හැකි භූමි ප්‍රමාණය ඉතා සීමිත වේ. වෙනත් පරිහරණයන් සඳහා ඉඩම්වලට ඇති ඉල්ලුමත් විවේක හා විනෝද කටයුතු සඳහා සුදුසු ඉඩම් හිඟකමත්, පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා පොදු මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ඇති ඉඩකඩ මද බවත් සලකා බලා ජනගහනය 1000කට ඉඩම් හෙක්ටයාර 0.2 ක් ලෙස විවේක විනෝද කටයුතු සඳහා ඉඩ සකස්කිරීමට මෙම සැලැස්මෙන් යෝජනා කෙරේ.

තවද, වක්‍ර විවේක සහ විනෝද පහසුකම් යටතේ සලකා බලනු ලබන සිනමා ශාලා , පුස්තකාල, ගෘහස්ත ක්‍රීඩාංගන ආදියද මේ සඳහා යොදාගත හැකිවේ. යොදා ගත හැකි ඍජු විවේක හා විනෝද කටයුතු සඳහා වන භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ප්‍රදේශයෙන් ලබාගතහැකි වක්‍ර විවේක හා විනෝද කටයුතු සපුරාගත හැකි ක්‍රම ද ඵලදායිව යොදාගත යුතු බව යෝජනා කෙරේ. නගර සභා බල ප්‍රදේශය තුල ප්‍රජා ශාලා 27 ක් සහ පුස්තකාල 14 ක් පමණ ස්ථාපනය වී ඇති අතර මෙම විවේක සහ විනෝද පහසුකම් සපුරා ගැනීම සඳහා මෙම ස්ථාන වල පහසුකම් වැඩිදියුණු කළයුතු වේ.

ඒ අනුව යොදාගතහැකි සියලුම ඉඩකඩ සලකා බැලීමෙන් අනතුරුව ඍජු විවේක සහ විනෝද පහසුකම් සපුරාගැනීමට සැකසූ යෝජිත සැලැස්ම පහත දැක්වේ.

වගුව 6.22 : යෝජිත ඍජු විවේක සහ විනෝද පහසුකම් ව්‍යාපෘත

අනු අංකය	උද්‍යාන වර්ගය	ප්‍රදේශය
01	යෝජිත කුඩා උද්‍යාන	මාකුඹුර
02	යෝජිත කුඩා උද්‍යාන	මාකුඹුර
03	යෝජිත කුඩා උද්‍යාන	කොට්ටාව
04	යෝජිත කුඩා උද්‍යාන	කොට්ටාව
05	යෝජිත කුඩා උද්‍යාන	කොට්ටාව
06	යෝජිත කුඩා උද්‍යාන	තලවතුගොඩ
07	මහජන උද්‍යානය	අපේක්ෂා රෝහල ආශ්‍රිතව
08	යෝජිත ඉතා කුඩා උද්‍යාන	මාකුඹුර
09	යෝජිත කුරුළු උයන	මාදිවෙල
10	යෝජිත ක්‍රීඩා අංගනය	ජයගත් මාවත
11	යෝජිත පාපැදි මන්තිරුව	වීර මාවත
12	යෝජිත කුඩා උද්‍යාන	ආසිරි පෙදෙස, වත්තේගෙදර
13	යෝජිත රේඛීය උද්‍යානය	පතිරගොඩ
14	යෝජිත රේඛීය උද්‍යානය	තලවතුගොඩ බටහිර
15	යෝජිත රේඛීය උද්‍යානය	පන්නිපිටිය උතුර
16	යෝජිත රේඛීය උද්‍යානය	පන්නිපිටිය උතුර
17	යෝජිත රේඛීය උද්‍යානය	කොට්ටාව බටහිර
18	යෝජිත රේඛීය උද්‍යානය	ගොඩිගමුව දකුණ
19	යෝජිත පාපැදි ධාවන පථය	තලවතුගොඩ මංසන්ධිය

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සිතියම 6.18 : යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිලිබඳ අවකාශීය සැලැස්ම



සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

6.9 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය

01. කලල්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම / කලල්ගොඩ හරස් මාර්ගය සංවර්ධනය

1. ව්‍යාපෘතිය හඳුනා ගැනීම					
ව්‍යාපෘති මාතෘකාව	කලල්ගොඩ මාර්ගය පුළුල් කිරීම				
ව්‍යාපෘති යෝජනාව	මීටර් 12 ක පළලකින් යුතුව සංවර්ධනය කිරීම යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 9ක් වන අතර, මාර්ගයේ දිග කිලෝ මීටර 2.1 ක් පමණ වේ.				
පිහිටීම	*පළාත*	බස්නාහිර	*සීමාවන්*	*උතුර*	හෝකන්දර මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		*නැගෙනහිර*	මාලඹේ කොට්ටාව පාර
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		*දකුණ*	මීමනගොඩ පාර
	පරිපාලන ඒකකය	නගර සභා		*බටහිර*	කොට්ටාව බොරැල්ල පාර
ප්‍රවේශය	174 මාර්ගයේ සිට කොට්ටාව මාලඹේ මාර්ගය දක්වා				

පිහිටීම දක්වන සිතියම



වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓
ව්‍යාපෘති ඉලක්ක	- මාර්ගපද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම				
ව්‍යාපෘතියේ පදනම	පවත්නා නාගරික මාර්ග පද්ධති සංවර්ධනය				

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ	✓				දිනය	
	වෙනත්	✓				ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

02. වීර මාවත සංවර්ධනය කිරීම

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">වීර මාවත පුළුල් කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">මීටර් 9 ක පළලකින් යුතුව සංවර්ධනය කිරීම
යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 6ක් වන අතර, මාර්ගයේ දිග කිලෝ මීටර 14 ක් පමණ වේ.</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td>කලල්ගොඩ මාර්ගය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>මාලබේ කොට්ටාව පාර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>නේවාසික ප්‍රදේශය</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>බොරැල්ල කොට්ටාව පාර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">කලල්ගොඩ මාර්ගය සහ 174 මාර්ගය/මාලබේ කොට්ටාව මාර්ගය</td></tr>
<tr><td colspan="6">පිහිටීම දක්වන සිතියම</td></tr>
</table>

වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓
ව්‍යාපෘති ඉලක්ක	- මාර්ග පද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම				
ව්‍යාපෘතියේ පදනම	වීර මාවත නේවාසික ව්‍යාපෘතිය ඇතුළු අනෙකුත් නේවාසික ප්‍රදේශ සඳහා මනා ප්‍රවේශයක් ලබා දීම මාර්ග පද්ධතිය තුල මාර්ග අතර මනා සම්න්ධතාවයක් ඇති කිරීම				

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය	මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ	✓			දිනය	
	වෙනත්	✓			ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නගර සභාව		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

03/04. නාගහවත්ත - පමුණුව 7 වන පටුමග මාර්ගය හා පමුණුව 2 වන පටුමග මාර්ගය සංවර්ධනය කිරීම

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">නාගහවත්ත - පමුණුව 7 වන පටුමග මාර්ගය හා පමුණුව 2 වන පටුමග මාර්ගය පුළුල් කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">මීටර් 9 ක පළලකින් යුතුව සංවර්ධනය කිරීම
යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 6කි.
නාගහවත්ත - පමුණුව මාර්ගයේ දිග කිලෝ මීටර 1.26 ක් පමණ වේ.
නාගහවත්ත පතිරගොඩ මාර්ගයේ දිග කිලෝ මීටර 1 ක් පමණ වේ</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමා වන්</td><td>උතුර</td><td>පතිරගොඩ පාර</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>පමුණුව පාර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>හයිලෙවල් මාර්ගය</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>පරණ කොට්ටාව පාර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">නාගහවත්ත - පමුණුව මාර්ග</td></tr>
</table>

පිහිටීම දක්වන සිතියම



වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓

ව්‍යාපෘති ඉලක්ක	- මාර්ගපද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම
ව්‍යාපෘතියේ පදනම	- පමුණුව මාර්ගය තුළ දෛනිකව සිදු වන මාර්ග තදබදය යම් දුරකට අවම කිරීමට අපේක්ෂා කරනු ලබයි

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය							
ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ					දිනය	
	වෙනත්	✓				ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම				
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	නගර සභාව		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

05. ඇල්හේන මාර්ගය සංවර්ධනය කිරීම

වයාපෘතිය හඳුනා ගැනීම					
වයාපෘති මාතෘකාව	ඇල්හේන මාර්ගය පුළුල් කිරීම				
වයාපෘති යෝජනාව	සුරම්‍ය මාවත, විද්‍යාකර මාවත හා ඇල්හේන මාවත මීටර් 9ක පළලකින් යුතුව සංවර්ධනය කිරීම යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 6කි. මාර්ගයේ දිග කිලෝ මීටර 1.2 ක් පමණ වේ				
පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	හයිලෙවල් මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	දෙහිවල මාර්ගය
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	දෙහිවල මාර්ගය
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	වත්තේගෙදර මාර්ගය
ප්‍රවේශය	හයිලෙවල් මාර්ගය,වත්තේගෙදර හා 119 මාර්ගය				

පිහිටීම දක්වන සිතියම

වින්‍යාස සැලැස්



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓
ව්‍යාපෘති ඉලක්ක	- මාර්ගපද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම				
ව්‍යාපෘතියේ පදනම	විද්‍යාකර මාවත පුළුල් කිරීම හා එය ඇල්හේන මාර්ගය සමඟ සම්බන්ධ කිරීම මගින් හයිලෙවල් මාර්ගයෙහි පවතින වාහන තදබදය ලිහිල් කිරීම.				

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	-
	රජයේ					දිනය	-
	වෙනත්					ඉඩමේ ප්‍රමාණය	-

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නගර සභාව		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

06. බෝගහවිල - මාකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">බෝගහවිල - මාකුඹුර මාර්ගය පුළුල් කිරීම හා නව සම්බන්ධතාවයක් ඇති කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">කොට්ටාව - පිළියන්දල මාර්ගය දෙසින් පැමිණෙන බෝගහවිල මාර්ගය මීටර් 9කින් යුතුව පුළුල් කරමින් වෙල් යාය හරහා යෝජිත මාර්ගය ප්‍රතිසංස්කරණය කොට අනතුරුව කුලතුංග මාර්ගය දෙසට සම්බන්ධතාවය ගෙන හයිලෙවල් මාර්ගය වෙත සම්බන්ධ කිරීම.
යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 6කි.
මාර්ගයේ දිග කිලෝ මීටර 2.5 ක් පමණ වේ</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td>හයිලෙවල් මාර්ගය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>දක්ෂිණ අධිවේගී මාර්ගය</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>නියදගල මාර්ගය</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>කොට්ටාව පිළියන්දල මාර්ගය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">හයිලෙවල් මාර්ගය සහ 255 මාර්ගය</td></tr>
</table>

පිහිටීම දක්වන සිතියම



වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓

ව්‍යාපෘති ඉලක්ක	- මාර්ගපද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම
ව්‍යාපෘතියේ පදනම	විකල්ප මාර්ග සංවර්ධනය

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ	✓				දිනය	
	වෙනත්	✓				ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නගර සභාව		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

07. ඉසිපතන මාර්ගය සංවර්ධනය කිරීම

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">ඉසිපතන මාර්ගය පුළුල් කිරීම හා නව සම්බන්ධතාවයක් ඇති කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">නාවින්න ක්‍රීඩාංගනය ආසන්නයෙන් ගමන් ගන්නා ඉසිපතන මාර්ගය මීටර් 9ක් දක්වා පුළුල් කරමින් කුඹුරු යාය සීමාව හරහා වත්තේගෙදර මාර්ගය තෙක් සම්බන්ධතාවයක් ඇති කිරීම
යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 6කි.
මාර්ගයේ දිග කිලෝ මීටර 2 ක් පමණ වේ</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td>හයිලෙවල් මාර්ගය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>වත්තේගෙදර මාර්ගය</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>මහරගම දෙහිවල මාර්ගය</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>එගොඩවත්ත පාර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">හයිලෙවල් මාර්ගය</td></tr>
</table>

පිහිටීම දක්වන සිතියම



වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	
	නිවාස			සාමාජීය	
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	- මාර්ගපද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම
ව්‍යාපෘතියේ පදනම	*අතුරු මාර්ග සංවර්ධනය*

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ	✓				දිනය	
	වෙනත්	✓				ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

08. මාකුඹුර නව මාර්ගය ඉදි කිරීම

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">මාකුඹුර නව මාර්ගය ඉදි කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">මාකුඹුර බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය දෙවන අදියර යටතේ සංවර්ධනය වෙමින් පවතින භූමියේ සිට හිරිපිටිය මාර්ගය තෙක් මීටර් 9ක පළලින් යුතු නව මාර්ගයකින් හයිලෙවල් මාර්ගයට සම්බන්ධ කිරීම
යෝජිත ගොඩනැගිලි සීමාව මීටර් 9කි.
මාර්ගයේ දිග මීටර 600 ක් පමණ වේ</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td>හයිලෙවල් මාර්ගය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>දක්ෂිණ අධිවේගී මාර්ගය</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>කුලතුංග මාර්ගය</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>නේවාසික ප්‍රදේශය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">හයිලෙවල් මාර්ගය</td></tr>
</table>

පිහිටීම දක්වන සිතියම

වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓
ව්‍යාපෘති ඉලක්ක	- මාර්ගපද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම				
ව්‍යාපෘතියේ පදනම	- දැරිය හැකි මිලකට ලබා ගත හැකි නිවාස ව්‍යපෘතියක් මෙම සංවර්ධනය වෙමින් පවතින ඉඩමෙහි දකුණු අන්තයට වන්නට යෝජිත අතර , හෙක්ටයාරයකට ආසන්න වපසරියකින් යුතු භූමියක් පුරා ඉදි වීමට කටයුතු සුදානම් කරමින් පවතින මෙම ව්‍යාපෘතිය ඉදි කිරීමෙන් අනතුරුව ඇති වන ප්‍රවාහන තදබදය අවම කිරීම මෙම මාර්ගය යෝජනා කිරීමේ මූලික අරමුණයි.				

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.	✓	ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ					දිනය	
	වෙනත්					ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	නාගරික සංවර්ධන අධිකාරිය

09. පාසල් මාවත සංවර්ධනය කිරීම

වයාපෘතිය හඳුනා ගැනීම					
වයාපෘති මාතෘකාව	පාසල් මාවත හා රෝහල පාර අතර නව සම්බන්ධතාවයක් ඇති කිරීම				
වයාපෘති යෝජනාව	වැලි පාර ඔස්සේ කොට්ටාව- බොරැල්ල මාර්ගය දක්වා මීටර් 7 ක පළලින් යුතුව පාසල් මාවත පුළුල් කිරීම යෝජිත ගොඩනැඟිලි සීමාව මීටර් 6කි.				
පිහිටීම	*පළාත*	බස්නාහිර	*සීමාවන්*	*උතුර*	නේවාසික ප්‍රදේශ
	දිස්ත්‍රික්කය	කොළඹ		*නැගෙනහිර*	කොට්ටාව බොරැල්ල පාර
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		*දකුණ*	වෙල් යාය
	පරිපාලන ඒකකය	නගර සභා		*බටහිර*	ජලාශය
ප්‍රවේශය	174 මාර්ගය				

පිහිටීම දක්වන සිතියම

වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම							
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව			
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු			
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓		
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓		
	නිවාස			සාමාජීය	✓		
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික			
	වෙනත්			භෞතික	✓		
ව්‍යාපෘති ඉලක්ක	- මාර්ග පද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම						
ව්‍යාපෘතියේ පදනම	තලපත්පිටිය ඉහළ ආදායම් නිවාස ව්‍යාපෘතිය වැනි විවිධ සංවර්ධන ව්‍යාපෘති ඉදි කිරීම හේතුවෙන් නේවාසික ජනගහනය වැඩි වීමත් සමඟ ඇති වන වාහන තදබදය අවම කිරීම						
ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය							
ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ					දිනය	
	වෙනත්	✓				ඉඩමේ ප්‍රමාණය	
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම							
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නගර සභාව					
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	ශ්‍රී- ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව			

10. ඇහැලපේ මාර්ගය සංවර්ධනය කිරීම

ව්‍යාපෘතිය හඳුනා ගැනීම					
ව්‍යාපෘති මාතෘකාව	ඇහැලපේ මාර්ගය පුළුල් කිරීම				
ව්‍යාපෘති යෝජනාව	මීටර් 12ක ක පළලකින් යුතුව ඇහැලපේ මාවත හා කටුවාවල මාර්ගය සංවර්ධනය කිරීම යෝජිත ගොඩනැගිලි රේඛාව මීටර් 6කි.				
පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	දෙහිවල-මහරගම මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	දහම් මාවත
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	නීලම්මහර මාර්ගය
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	ඇඹිල්ලවත්තමාර්ගය
ප්‍රවේශය	මහරගම -දෙහිවල මාර්ගය				

පිහිටීම දක්වන සිතියම



වින්‍යාස සැලැස්ම



වයාපෘතිය සාධාරණීකරණය කිරීම

වයාපෘති ප්‍රභේද	සංරක්ෂණය		වයාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	✓
	ප්‍රතිස්ථාපන		වයාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	
	වෙනත්			භෞතික	✓

වයාපෘති ඉලක්ක	- මාර්ග පද්ධතිය තුළ මාර්ග අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම - මාර්ගය භාවිතා කරනු ලබන සියලු දෙනාට (මගීන්, රියදුරන්, පදිකයන්) වඩාත් යෝග්‍ය හා සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම
වයාපෘතියේ පදනම	අපේක්ෂා රෝහල සඳහා වන මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම තුලින් ඒ සඳහා පැමිණෙන ජනතාවට වඩාත් පහසු ප්‍රවාහන සේවයක් ලබා ගැනීමට හැකියාව ලබා දීම.

වයාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය		මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ	✓				දිනය	
	වෙනත්					ඉඩමේ ප්‍රමාණය	

වයාපෘතිය ක්‍රියාත්මක කිරීම

වයාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	මහරගම නගර සභාව

11. මාකුඹුර මංසන්ධිය සංවර්ධනය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	මාකුඹුර මංසන්ධිය සංවර්ධනය
ව්‍යාපෘති යෝජනාව	ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ පළමු බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය සේ සැලකෙන මාකුඹුර බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනයේ අදියර දෙක යටතේ පහත සංවර්ධනයන් යෝජනා කර තිබේ. - සේවා ස්ථානය හා ඉන්ධන පිරවුම් හල - මහල් නිවාස ව්‍යාපෘතිය - මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය හා මහජන චතුරශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	හයිලෙවල් මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	දක්ෂිණ අධිවේගී මාර්ගය
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	කුලතුංග මාවත
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	නේවාසික ප්‍රදේශය
ප්‍රවේශය	හයිලෙවල් මාර්ගය				

පිහිටීම දක්වන සිතියම

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන	✓		විස්තීරණය කළ යුතු	✓
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස	✓		සාමාජීය	✓
	මාර්ග සංවර්ධන			පාරිසරික	✓

	වෙනත්			භෞතික	✓

ව්‍යාපෘති ඉලක්ක	- කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් ලබා දීම - ප්‍රදේශයේ ආර්ථික හා පාරිසරික සංවර්ධනය - ප්‍රදේශයෙහි පවතින නේවාසික ඉල්ලුම සපුරාලීම
ව්‍යාපෘතියේ පදනම	- ප්‍රවාහන මධ්‍යස්ථානය හේතුකොටගෙන ප්‍රදේශයේ ඇති වූ නේවාසික ඉල්ලුම සපුරාලීම හා ප්‍රදේශය තුල ඇති වීමට හැකි අධික සනත්වයෙන් යුක්ත ක්‍රියාකාරකම් හේතුකොටගෙන ඇතිවිය හැකි පාරිසරික බලපෑම් අවම කිරීම හා නගරය තුල මනා ආකර්ශනයකින් යුතු වටපිටාවක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් වේ.

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.	✓	ඉඩමේ ප්‍රමාණය	අක්කර 21 රූඩ් 1	මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ					දිනය	
	වෙනත්					ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය හේතුකොටගෙන ප්‍රදේශය තුල අනාගතයේ ඇතිවීමට හැකි ඉහල සංචරණ ජනගහනය සඳහා අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය දායක වනු ඇත. තවද නේවාසික සංවර්ධනයන් මගින් ඉහල යන නේවාසික ඉල්ලුමට දායකත්වයක් ලබා දිය හැකිය. මෙහිදී සියලු සංවර්ධනයන් 2.4 ක කලාප සංගුනකයක් සහිතව සිදුකල හැකි අතර මෙම ප්‍රදේශය ප්‍රවර්ධන වාණිජ කලාපයට අයත් වේ..

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	නාගරික සංවර්ධන අධිකාරිය		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල් හා නාගරික සංවර්ධන අධිකාරියේ මුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

12. කොට්ටාව මංසන්ධිය සංවර්ධනය

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">කොට්ටාව මංසන්ධිය සංවර්ධනය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">නාගරික කටයුතු සඳහා ඉහළ අවධානයක් යොමු කරනු ලබන කොට්ටාව නගරය යටිතල පහසුකම් වලින් අනූන වාණිජමය වටිනාකම වැඩි කලාපයක් බවට පත් කිරීමේ අරමුණින් කොට්ටාව මංසන්ධි සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කර ඇත. ඒ අනුව යෝජිත සංවර්ධනයන් වන්නේ
- සුපිරි වෙළඳ සංකීර්ණය
- නාගරික උද්‍යානය
- වාණිජ හා මිශ්‍ර සංවර්ධන ප්‍රදේශය
- නේවාසික ව්‍යාපෘතිය
- මාර්ග පද්ධතිය
- කොට්ටාව පොලිසිය ප්‍රතිස්ථාපනය කිරීම
- රේඛීය උද්‍යානය හා ජලය රඳවා ගැනීමේ ප්‍රදේශය
- උපයෝගීතා සේවා හා විවෘත ප්‍රදේශ</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td>හයිලෙවල් මාර්ගය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>හොරණ මාර්ගය</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>කොට්ටාව විකල්ප මාර්ගය</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>මහල්වරාව මාර්ගය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">හයිලෙවල් මාර්ගය</td></tr>
<tr><td colspan="6">පිහිටීම දක්වන සිතියම</td></tr>
</table>

වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	භූ දර්ශන	✓		විස්තීරණය කළ යුතු	✓
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	ප්‍රතිස්ථාපන	✓	ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස	✓		සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	✓
	වාණිජ	✓			
	වෙනත්			භෞතික	✓

ව්‍යාපෘති ඉලක්ක	- කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් ලබා දීම - ප්‍රදේශයේ ආර්ථික හා පාරිසරික සංවර්ධනය
ව්‍යාපෘතියේ පදනම	- හයිලෙවල් මාර්ගයට යාබදව පිහිටි සංවර්ධනය සඳහා යෝජිත ඉඩම, වාණිජමය භාවිතය සඳහා ඉඩම් ලබා දීමෙන් පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා එහි උපරිම ප්‍රයෝජනය සඳහා ඉඩම් භාවිත කිරීම

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.	✓	ඉඩමේ ප්‍රමාණය	අක්කර 31 රූඩ් 1 පර්චස් 15	මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ					දිනය	
	වෙනත්					ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

නිම කිරීමට යෝජිත වර්ෂය

- සුපිරි වෙළඳ සංකීර්ණය 2022
- නාගරික චතුරශ්‍රය 2023
- වාණිජ හා මිශ්‍ර සංවර්ධන ප්‍රදේශය 2024
- මාර්ග පද්ධතිය 2024
- කොට්ටාව පොලිසිය ප්‍රතිස්ථාපනය කිරීම 2024
- පොදු රථ ගාල 2025
- රේඛීය උද්‍යානය හා ජලය රඳවා ගැනීමේ ප්‍රදේශය 2025

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	*ක්‍රියාත්මක කල යුතු ආයතනය*	*- නාගරික සංවර්ධන අධිකාරිය - මාර්ග සංවර්ධන අධිකාරිය - ශ්‍රීලංකා පොලීසිය - මහරගම නගර සභාව - ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව*		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	*-භාණ්ඩාගාර අරමුදල් -නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් -රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය*	*අනුමැතිය ලබා ගත යුතු ආයතන*	*-ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී- ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව -මධ්‍යම පරිසර අධිකාරිය -මාර්ග සංවර්ධන අධිකාරිය*

13. තලවතුගොඩ මංසන්ධිය සංවර්ධනය

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">තලවතුගොඩ මංසන්ධිය සංවර්ධනය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">ප්‍රදේශයේ ලක්ෂණයන් හා විභාවතාවයන් සලකා බලා හරිත වාණිජ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම. ඒ අනුව යෝජිත සංවර්ධනයන් වන්නේ
- නාගරික උද්‍යානය
- මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
- සුබෝපභෝගී නේවාසික ව්‍යාපෘතිය
- බහු මහල් රථ ගාල
- පාපැදි ධාවන පථය -(සැහැල්ලු දුම්රිය ඩිපෝව - කිඹුලාවල)
- වාණිජ අවන්හල් හා විනෝදාත්මක කටයුතු
- ආදර්ශ කුඹුරු ව්‍යාපෘතිය</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td>තලවතුගොඩ-පිටකෝට්ටේ මාර්ගය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td><td>බොරැල්ල-කොට්ටාව මාර්ගය</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මහරගම නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td><td>පාසල් මාවත</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>නගර සභා</td><td>බටහිර</td><td>තලපත්පිටිය මාර්ගය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">කොට්ටාව - බොරැල්ල මාර්ගය</td></tr>
<tr><td colspan="6">පිහිටීම දක්වන සිතියම හා වින්‍යාස සැලැස්ම
</td></tr>
</table>

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	✓
	භූ දර්ශන	✓		විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස	✓		සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	✓
	වාණිජ	✓			
	වෙනත්			භෞතික	✓

ව්‍යාපෘති ඉලක්ක	- කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් ලබා දීම - ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය හා පාරිසරික සංවර්ධනය
ව්‍යාපෘති යේ පදනම	- ප්‍රදේශයේ පවතින නේවාසික හා වාණිජ ඉල්ලුම සපුරාලන අතරතුර යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගය නිසා ඇතිවන ධනාත්මක බලපෑම් ප්‍රදේශයේ පවතින ලක්ෂණයන්ට හානි නොවන අයුරින් සංවර්ධනයට යොදා ගැනීම.

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය	මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ				දිනය	
	වෙනත්				ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

යෝජිත නාගරික උද්‍යානය සම්බන්ධ කරමින් පාපැදි මන්තිරුවක් ගොඩනැගීමටද ආදර්ශ කුඹුරු ව්‍යාපෘතිය නිදහස් ප්‍රජා කෘෂිකාර්මික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. එලෙසම මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයේ ලක්ෂණයන්ට ගැලපෙන ආකාරයට වඩාත් පරිසර හිතකාමී නිර්මාණ සහිතව කිරීමට යෝජිතය.

නිදහස් ප්‍රජා කෘෂිකාර්මික උද්‍යාන

හරිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම				
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	- නාගරික සංවර්ධන අධිකාරිය - මහරගම නගර සභාව		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල් නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය	අනුමැතිය ලබා ගත යුතු ආයතන	නාගරික සංවර්ධන අධිකාරිය

14. විද්‍යාල හන්දිය මංසන්ධිය සංවර්ධනය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	විද්‍යාල හන්දිය මංසන්ධිය සංවර්ධනය
ව්‍යාපෘති යෝජනාව	යෝජිත සංවර්ධනයන් වන්නේ - අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම - විද්‍යාල හන්දිය සිට ධර්මපාල විද්‍යාලය (කොට්ටාව උතුර) පාසැල දක්වා පදික වේදිකා සංවර්ධනය - පදික මාරු ප්‍රතිස්ථාපනය - භූ අලංකරණය (කුඩා උද්‍යානය හා ශාක සිටුවීම) - ආවරණ ස්ලැබ් ප්‍රතිස්ථාපනය

පිහිටීම			සීමාවන්		
පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	කොට්ටාව-මාලබේ මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	නේවාසික ප්‍රදේශ
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	නේවාසික ප්‍රදේශ
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	නේවාසික ප්‍රදේශ
ප්‍රවේශය	කොට්ටාව- මාලබේ මාර්ගය				

පිහිටීම දක්වන සිතියම හා වින්‍යාස සැලැස්ම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	✓
	භූ දර්ශන	✓		විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ	ආර්ථික	✓

	නිවාස		ඉලක්ක	සාමාජීය	✓
	මාර්ග සංවර්ධන	✓		පාරිසරික	✓
	වාණිජ				
	වෙනත්			භෞතික	✓
ව්‍යාපෘති ඉලක්ක	- වඩාත් ආකර්ශනීය හා සුවපහසු වටපිටාවක් ඇති කිරීම				
ව්‍යාපෘතියේ පදනම	- මංසන්ධි සංවර්ධනය				

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ මර්තමාන අයිතිය	නා.සං.අධි.	✓	ඉඩමේ ප්‍රමාණය	මිනින්දෝරු සැලැස්ම	අංකය	
	රජයේ				දිනය	
	වෙනත්	✓			ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	- නාගරික සංවර්ධන අධිකාරිය - මහරගම නගර සභාව		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	භාණ්ඩාගාර අරමුදල් නාගරික සංවර්ධන අධිකාරියේ මුදල්	අනුමැතිය ලබා ගත යුතු ආයතන	පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

15. පන්නිපිටිය හන්දිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම					
ව්‍යාපෘති මාතෘකාව	පන්නිපිටිය හන්දිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	හයිලෙවල් මාර්ගයට මුහුණලා ඇති බිම් කැබැල්ලේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම				
පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	හයිලෙවල් මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	දෙල්ගහවත්ත මාර්ගය
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	නේවාසික ප්‍රදේශ
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	නේවාසික ප්‍රදේශ
ප්‍රවේශය	හයිලෙවල් මාර්ගය				

පිහිටීම දක්වන සිතියම

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	✓
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	

<table>
<tr><td rowspan="5"></td><td>ප්‍රතිස්ථාපන</td><td></td><td rowspan="5">ව්‍යාපෘතියේ ඉලක්ක</td><td>ආර්ථික</td><td>✓</td></tr>
<tr><td>නිවාස</td><td></td><td>සාමාජීය</td><td></td></tr>
<tr><td>මාර්ග සංවර්ධන</td><td></td><td rowspan="2">පාරිසරික</td><td rowspan="2"></td></tr>
<tr><td>වාණිජ</td><td>✓</td></tr>
<tr><td>වෙනත්</td><td></td><td>භෞතික</td><td>✓</td></tr>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="5">- ආයෝජන අවස්ථාවන් ඉහල නැංවීම</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="5">- හයිලෙවල් මාර්ගය ආශ්‍රිතව දිනපතා ඉහල ජන ගලනයක් සිදුවන අතර මෙම ප්‍රදේශය වාණිජ කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගෙන තිබේ.</td></tr>
<tr><td colspan="6">ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය</td></tr>
</table>

<table>
<tr><td rowspan="3">ඉඩමේ මර්තමාන අයිතිය</td><td>නා.සං.අධි.</td><td>✓</td><td rowspan="3">ඉඩමේ ප්‍රමාණය</td><td rowspan="3">අක්කර 0.5</td><td rowspan="3">මිනින්දෝරු සැලැස්ම</td><td>අංකය</td><td></td></tr>
<tr><td>රජයේ</td><td></td><td>දිනය</td><td></td></tr>
<tr><td>වෙනත්</td><td></td><td>ඉඩමේ ප්‍රමාණය</td><td></td></tr>
<tr><td colspan="8"></td></tr>
<tr><td colspan="8">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</td></tr>
</table>

<table>
<tr><td rowspan="2">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</td><td>ක්‍රියාත්මක කල යුතු ආයතනය</td><td colspan="3">- නාගරික සංවර්ධන අධිකාරිය</td></tr>
<tr><td>අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය</td><td>නාගරික සංවර්ධන අධිකාරියේ මුදල්
රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය</td><td>අනුමැතිය ලබා ගත යුතු ආයතන</td><td>නාගරික සංවර්ධන අධිකාරිය</td></tr>
</table>

16. වල්ජම්බුගස්වත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම					
ව්‍යාපෘති මාතෘකාව	වල්ජම්බුගස්වත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	පන්නිපිටිය බොරැල්ල මාර්ගයට මුහුණලා ඇති බිම් කැබැල්ලේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම				
පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	වීර මාවත
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	නේවාසික ප්‍රදේශ
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	මහවත්ත පාර
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	කොට්ටාව- බොරැල්ල මාර්ගය
ප්‍රවේශය	පන්නිපිටිය බොරැල්ල මාර්ගය				

පිහිටීම දක්වන සිතියම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	✓
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	ප්‍රතිස්ථාපන		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	✓
	නිවාස			සාමාජීය	
	මාර්ග සංවර්ධන			පාරිසරික	
	වාණිජ	✓			

	වෙනත්			භෞතික	✓

ව්‍යාපෘති ඉලක්ක	- ආයෝජන අවස්ථාවන් ඉහල නැංවීම
ව්‍යාපෘති යේ පදනම	- පන්නිපිටිය බොරැල්ල මාර්ගය ආශ්‍රිතව දිනපතා ඉහල ජන ගලනයක් සිදුවන අතර මෙම ප්‍රදේශය මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගෙන තිබේ.

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ මර්තමාන අයිතිය	නා.සං.අධි.		ඉඩමේ ප්‍රමාණය	අක්කර 1 රූඩ් 3 පර්චස් 32.35	මිනින්දෝරු සැලැස්ම	අංකය	3018
	රජයේ					දිනය	06.04.2005
	වෙනත්	✓				ඉඩමේ ප්‍රමාණය	

ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

වාණිජ හා කාර්යාල භාවිතයන් සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය



ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	ක්‍රියාත්මක කල යුතු ආයතනය	- නාගරික සංවර්ධන අධිකාරිය		
	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය	අනුමැතිය ලබා ගත යුතු ආයතන	

17. මහරගම 35 වත්ත ඉඩම මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම					
ව්‍යාපෘති මාතෘකාව	මහරගම 35 වත්ත ඉඩම මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	මහරගම දුම්රියපොළ හා සම්බන්ධ කරමින් මහරගම 35 වත්ත ඉඩම තුල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම				
පිහිටීම	පළාත	බස්නාහිර	සීමාවන්	උතුර	කැළණි වැලි දුම්රිය මාර්ගය
	දිස්ත්‍රික්කය	කොළඹ		නැගෙනහිර	වාණිජ ස්ථාන
	ප්‍රාදේශීය සීමාව	මහරගම නගර සභා බල ප්‍රදේශය		දකුණ	පරණ කොට්ටාව මාර්ගය
	පරිපාලන ඒකකය	නගර සභා		බටහිර	වාණිජ ස්ථාන
ප්‍රවේශය	හයිලෙවල් මාර්ගය- පැරණි මාර්ගය				

පිහිටීම දක්වන සිතියම

වින්‍යාස සැලැස්ම

යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

